ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

03 කතෝලික මාධ්‍යවේදිනියගේ අනුවේදනීය ඛේදවාචකය



08 පාප්තුමන් සමඟ ශ්‍රී ලාංකිකයෝ



12 කතෝලික පාසල් සඳහා අයදුම්පත්



ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජුනි 07

www.colombocatholicpress.com



ක්‍රි.ව. 2014 ක් වූ පෙබරවාරි 16 ඉරිදා 148 වෙළුම 37 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/35/NEWS/2014

# සා. පීතර බැසිලිකා පුදබිම "ශ්‍රී ලංකා" නමින් ගිගුම් දෙයි

## සසුන් පියාගේ "ශ්‍රී ලංකා" හමුවට දසතින් ප්‍රශංසා

ගරු ඩෙනින්ටන් නික්ලස් සුබසිංහ පියතුමා රෝමයේ සිට වාර්තා කරයි.

ප්‍රතිසංධානය පහසු දෙයක් නොවන බව මට වැටහෙන නමුත් සිදු වී ඇති තුවාල සුවපත් කර, පෙර දිනයේ සතුරන් සමඟ එකමුතුව අනාගතය ගොඩනැගිය යුතුයි. අනාගතයත්, සංවර්ධනයත්, සාමයත් ගොඩනගන්නට එකම මඟ වැටී ඇත්තේ ඒ ඔස්සේ පමණ යැයි අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා වතිකානයේ සා. පීතර පුදබිමේ මුළු දුන් ශ්‍රී ලංකා ජනතා හමුවේදී ප්‍රකාශ කළේය. 15 පිටුවට



ශ්‍රී ලාංකිකයන්ටම පමණක් වෙන් වූ සා. පීතර බැසිලිකාවේ පැවැති ශ්‍රී ලාංකික හමුවට සිනා මුසු මුහුණින් සසුන් පියා පැමිණි අයුරු...

## දේව සේවක තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් සාන්තුවරයට එසැවීමේ සාසනික ක්‍රියාවලිය

දේව සේවක තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් සාන්තුවරයට එසැවීමේ සාසනික ක්‍රියාවලියේ දී එතුමන්ගේ දැහැමි ජීවිතය හා ක්‍රියාකාරකම් පිළිබඳ හැකිතාක් දුරට කරුණු රැස්කොට, එම වාර්තා ශුද්ධාසනය වෙත යොමු කළ යුතුව ඇත.

එම නිසා එතුමාණන් පිළිබඳ යම් විස්තර හෝ පුද්ගලික අත්දැකීම් තිබේ නම් ඒවා ලබා දෙන ලෙස අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් කොළඹ අගරදගුරු හිමිපාණෝ පූජක, පැවිදි හා ගිහි සැදැහැවතුන්ගෙන් ඉල්ලා සිටිති. එම විස්තර සැපයීම පුද්ගලික හමුවීමකින් හෝ ලිඛිතව ඉදිරිපත් කළ හැකිය.

එසේ කිරීමට කැමති අය කරුණාකර පහත සඳහන් ලිපිනයෙන් විමසන්න.

ගරු ප්‍රැන්සිස් නික්ලස් සේනානායක පියතුමා,
අගරදගුරු හිමිපාණන් නියෝජිත, දේව සේවක තෝමස් කුරේ හිමිපාණන්ගේ සාන්තුවරයට එසැවීමේ කාර්යාලය, අගරදගුරු නිවස, කොළඹ 08.

## කතෝලික පෞද්ගලික පාඨශාලා සඳහා අයදුම්පත්

කොළඹ අගරදගුරු පදවියේ කතෝලික පෞද්ගලික පාඨශාලාවල 2015 වසරේ පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කරගැනීම සඳහා අයදුම්පත් නිකුත් කිරීමේ දින පිළිබඳ සවිස්තර වාර්තාවක් මෙවර කලාපයේ 12 පිටුවේ පලවේ. ඉල්ලුම්පත් ලබා ගැනීම සඳහා කතෝලික පවුල් පොත, දරුවාගේ ක්‍රිස්තියානි සහතිකය සහ උප්පැන්න සහතිකය ද එක් එක් පාසල්හි විශේෂ අවශ්‍යතාවය අනුව ඉල්ලන වෙනත් ලිපි ලේඛන ද ඉදිරිපත් කළ යුතු බව කතෝලික පෞද්ගලික පාඨශාලා සාමාන්‍යාධිකාරි ගරු රංජිත් මදුරාවල පියතුමා දන්වා සිටී.

## මුතුරාජවෙල අක්කර 450 ක් ගොඩ කිරීමට පිඹුරු පත් සැකසේ

### බෝපිටිය, පමුණුගම, උස්වැටකෙයියාව හා කඳාන ගංවතුරින් වැනසෙයි ද?

විශේෂ වාර්තාකරුවකු විසිනි

යෝජිත කොළඹ කටුනායක අධිවේගී විදුලි දුම්රිය මාර්ගය ඉදිකිරීමට සමගාමීව ඉදිකිරීමට යෝජිත නව නගර දෙක සඳහා බෝපිටිය හා කෙරවලපිටිය ප්‍රදේශවල ඉඩම් අක්කර 450 ක් ලබා ගැනීමට යෝජනා වී තිබීම නිසා බරපතල පාරිසරික හා සමාජයීය ප්‍රශ්න රැසක් පැන නැගෙමින් ඇතැයි ඥානාර්ථ ප්‍රදීපයට වාර්තා වේ. 15 පිටුවට

## කතෝලික මුද්‍රණාලයේ ජංගම පොත්හල

කොළඹ කතෝලික මුද්‍රණාලය මඟින් පවත්වනු ලබන ජංගම පොත් අලෙවි හල 2014. 02. 23 ඉරුදින පල්ලන්සේන දෙව්මැදුරේදී පැවැත්වේ.

## කතෝලික අපේක්ෂකයෝ

සියළුම පක්ෂ වලින් පළාත් සභා වලට තරග කරන කතෝලික අපේක්ෂකයින් හඳුන්වා දීමේ විස්තර මාලාවක් ඉදිරි ප්‍රදීපය කලාපයන්ගෙන් බලාපොරොත්තු වන්න. කතෝලික අපේක්ෂකයින්ගේ විස්තර ද නොපමාව ප්‍රදීපයට යොමු කරන්න.

"අදමිටුවන් වීමට දෙවියන් වහන්සේ කිසිවකුට අණ නොකළ සේක." (මතෙව් 5:17-37)

පදවියෙන් පදවියට

# කඳුළු අතරින් සිනාසිය හැක්කේ සැබෑ කිතුනුවන්ට පමණයි

## කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ සීදූව සුපුවත් අරණේදී පවසති

**දෙවියන් වහන්සේට අකීකරු වුනාට උන්වහන්සේ මිනිසාට ආදරේයැයි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ සීදූව 'සුපුවත් අරණ' ආසිරි ගැන්වීමේ දේව මෙහෙයේදී ප්‍රකාශ කළහ.**

උන්වහන්සේ මෙසේද ප්‍රකාශ කළහ. අපගේ ජීවිතය කාලකන්නි වෙලා නැහැ. ක්‍රිස්තු භක්තිකයන් කියන්නේ කඳුළු අතරින් සිනාසෙන්නට පුළුවන් අයයි. සෑම දෙයක් දිහාම ස්වාමින් වහන්සේගේ දෙනෙත් වලින් බැලීමට හැකි කෙනෙකුටයි. සෑම දෙයකින් ස්වාමින් වහන්සේ සතුටු කරන්න පුළුවන් කෙනකුටයි. සුපුවත් අරණ අධ්‍යක්ෂ ගරු ඩැරල් කෲඤ්ඤ පියතුමාගේ මෙහෙයවීමෙන් මෙදින කටයුතු සංවිධානය විය.



## පුත්තලම දිසාවට ඉලන්තිඅඩිය නව මීසමක්

හලාවත පදවියට අයත් පුත්තලම දිසාවේ කල්පිටිය ප්‍රදේශයේ තලවිල මීසමට අයත්ව තිබූ ආලංකුඩාව, නොරොච්චෝලේ සහ ඉලන්තිඅඩිය දේවස්ථානද, සේතාපොළ මීසමට අයත්වූ පනි අඩිය දේවස්ථානයද එක් කොට ඉලන්තිඅඩිය නව මීසම සලාපුර රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රීත වැලැන්ස් මෙන්ඩිස් හිමිපාණන් විසින් ප්‍රකාශයට පත් කරන ලදි. පුත්තලම දිසාවේ මුළු මීසම් සංඛ්‍යාව දහ හතරක් බවටද, කල්පිටිය ප්‍රදේශයේ මීසම් සංඛ්‍යාව පහක් බවටද පත් විය. ඉලන්තිඅඩිය නව මීසම් සේවක ලෙස ගරු රනිල් සඳරුවන් පියතුමා පත්ව සිටි.

**(ඇන්ටනි මෙරිල්)**

## මරි මවුන් සමග රැයක් නාගොඩින් ඇරඹේ

කළුතර දිසා වාර්ෂික ලූර්දු මාතා මංගල්‍යයට සමගාමීව දිසාවේ සෑම මීසමක් වෙත වැඩම කරනු ලබන දේව මාතා ප්‍රතිමාව පසුගියදා නාගොඩ ශු. මිඛායෙල් අග්‍රදූත දේවස්ථානය වෙත වැඩම කරවන ලදී. රාත්‍රියේ සිට පසුගියදා පහන් වනතුරු සර්ව රාත්‍රික යැදුම් මෙහෙය මීගමුව දූව මීසම් සේවක ගරු ෂෙල්ටන් ඩයස් හා කලුතර දහම් සේවයේ ගරු ප්‍රදීප් ෂෙල්ටන් ඩයස් හා කලුතර දහම් සෙවනේ ගරු ප්‍රදීප් මානවඩු පියතුමන් විසින් මෙහෙයවන ලදී. මෙහිදී දෙව් මවුන් හා ජපමාලය පිළිබඳවත්, ජපමාලය හා කිතුනු ජීවිතය පිළිබඳවත් අර්ථවත් පැහැදිලි කිරීමක යෙදුනි. යැදුම් මෙහෙය සාර්ථක කරගැනීමෙහිලා මීසම් සේවක ගරු නිර්මාල් මාලක සිල්වා පියතුමන්ගේ අනුශාසකත්වය හා මග පෙන්වීම යටතේ මිසමේ සියලු සමිති සමාගම් සහය දැක්විය. මරිමව් ප්‍රතිමාව දිසාවේ සියලු දේවස්ථාන වෙත වැඩම කරවීමට හා එහි යැදුම් මෙහෙයන් පැවැත්වීමට නියමිත අතර, මෙම කටයුතු සාර්ථක කරගැනිමට කළුතර දිසා නායක අති ගරු ජූලියන් තිසේරා පියතුමන්ගේ සහ දිසාවේ සියලු පියවරුන්ගේ සහය ලැබී තිබුණි.

**(රංජිත් නෝනිස්)**

## හෝකන්දර කිතුනු පිබිදීමක්

ඉකුත් සමයේ විවිධ දුෂ්කරතා වලට මුහුණ දුන් හෝකන්දර සාන්ත අන්තෝනි දෙව්මැදුර පන්නිපිටිය මීසමට අයත් කුඩා කිතුනු සංඝයක් සිටින ප්‍රදේශයකි. මීසමේ කටයුතු වෙනුවෙන් හැමවිටම උපරිම දායකත්වයක් ලබා දෙන හෝකන්දර කිතුනු ජනතාව ජන වන්දනා සහ ධර්මෝපදේශ සේවාවන් මැනවින් පවත්වා ගෙන යති.

මීසම් සේවක ගරු ටිරෝන් පෙරේරා සහ සහයක ගරු දිනේෂ් කීර්තිසිංහ පියවරුන් සමග දොමිනිකාන නිකායික සොහොයුරියන්ගේද මගපෙන්වීම සහ සහය මත මෙම සංඝය වඩ වඩාත් ස්ථාපිත වෙමින් සිටින අතර සමිට්පුර නිවාස යෝජනා ක්‍රමය තුළ තිබෙන මේ දෙව්මැදුරු භූමියේ ආරක්ෂාව සඳහා මෙතෙක් අඩුපාඩුවක්ව තිබූ තාප්පයක් මේ දිනවල ඉදිවෙමින් පවති.

**(ක්‍රිස්ටෝපර් රණසිංහ)**

## මග්ගොන දොන් බොස්කෝ ළමා නිවාසය සියවස ප්‍රකාශයට පත් කරයි



වසර 100 ක අතීතයකට හිමිකම් කියන මේ ළමා නිවාසය තුළින් දහස් ගණනක් දරුවන් යහපත් පුරවැසියන් වූවාට සැක නැත. ඔවුන්ගේ අනාගතය විධිමත් අයුරින් වර්ධනය කර සමාජයට මුදා හැරීමට ආයතනය කළ උතුම් සේවාව අගය කළ යුතු යැයි නිමල මරිය නිකායේ ප්‍රාදේශාධිපති, ගරු ජූඩ් රොහාන් සිල්වා (නි.ම.නි.) පියතුමා පැවසුවේ මග්ගොන දොන් බොස්කෝ ළමා නිවාසයට වසර 100 ක් පිරීම නිමිත්තෙන් ජුබිලි වසර ප්‍රකාශයට පත් කිරීමේ මංගල දේව මෙහෙයේදීය. ප්‍රැන්සිස්කන් නිකායේ (CMSF) ප්‍රාදේශාධිපති, ගරු ජෙයරාජ් අරුලානන්දන් සහෝදර තුමන් විසින් ජුබිලි වසර ප්‍රකාශයට පත් කිරීමේ සංදේශය කියවන ලදි. දොන් බොස්කෝ ළමා නිවාසයේ අධ්‍යක්ෂ ගරු. තියෝපිලස් සහෝදර තුමන්ගේ මූලිකත්වයෙන් එම ආයතනයේ සහෝදරතුමන් ඇතුළු කාර්ය මණ්ඩලය විසින්, මෙම උළෙල සංවිධානය කරන ලදී.

**(ඩී. ඇන්සලම් ප්‍රනාන්දු)**



පසුගියදා මෙරටට වැඩම කරවන ලද සා. සෙබස්තියන් මුනිඳුන්ගේ ශ්‍රී හස්ත ධාතුව බලගල සදාසරණ අප දේවමාතා දේවස්ථානයට අති උත්කර්ෂවත් අයුරින් වැඩම කරවන ලදි. ඉතා අලංකාර රථ පෙරහරක් සහ අස්වාරෝහක පෙර ගමනක්ද මැද දහස් ගණන් වූ බැතිමතුන්ගේ සහභාගීත්වය මැද සා. සෙබස්තියන් මුනිඳුන්ගේ ශ්‍රී හස්ත ධාතුව වැඩම කරවූ අතර ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හෙලිකොප්ටර් යානයකින් සා. සෙබස්තියන් මුනිඳුන්ගේ ශ්‍රී හස්ත ධාතුන් වහන්සේට ගුවනේ සිට මල් ඉසිමින් ගෞරවය දක්වන ලදි. මෙම අවස්ථාවට ජා ඇල කලාපීය නා හිමි අතිගරු ශාන්ති කුමාර වැලිවිට පියතුමාද, බලගල මීසම් සේවක ගරු ජූඩ්රාජ් පියතුමාද සහභාගී විය. පසුගියදා බලගල සදාසරණ දේවස්ථානයේ ජනතාවට ගෞරව කිරීම සඳහා තැන්පත් කර තිබූ සා. සෙබස්තියන් මුනිඳුන්ගේ ශ්‍රී හස්ත ධාතුව පසුදා බලගල මීසමේ නව දෙව්මැදුර වන ගලගහදූව සා. සෙබස්තියන් දෙව්මැදුර වෙත වඩම්මවනු ලැබූ අතර ගලගහදූව සා. සෙබස්තියන් දෙව්මැදුරේ ප්‍රථම මංගල්‍යය සැමරීමද එදින සිදුකරනු ලැබීය. මංගල මහා දිව්‍ය යාගයෙන් අනතුරුව පසුව මහත් හරසර ඇතිව සා. සෙබස්තියන් මුනිඳුන්ගේ ශ්‍රී හස්ත ධාතුව නැවතත් කඳාන සා සෙබස්තියන් සිද්ධස්ථානය වෙත වැඩම කරලීය.

**සටහන හා ඡායාරූප : තිළිණ අලහකෝන්**



මැල්සිරිපුර සිරිහඳ අවමංගල්‍යාධාර සමිතියේ 10 වෙනි සංවත්සරය එහි නිර්මාතෘ ගරු ඇන්ටනි පිටර්සන් (නි.ම.නි.) පියතුමාගේ සහ වත්මන් මීසම් සේවක ගරු මයිකල් කෝස්තා සහ සහයක ගරු ගෝමි දිවාකර පියතුමන්ගේ මූලිකත්වයෙන් පැවැත්විණ. ඊට සහභාගිවූ සාමාජික සාමාජිකාවන් ප්‍රදීප කැමරාවට මුහුණ දුන් අයුරු. **(නිමල් ඒ. අල්මේදා)**

## සුබාසිංසන





කොළඹ අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හා අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්ගේ රදගුරු අබිසෙස් සංවත්සරය පෙබරවාරි 11 වැනි දිනට යෙදී තිබුණි. එතුමනට දේවාසිරි බහුලව ලැබේවායි ප්‍රදීපය සිය පාඨක, ලේඛක සුහදයන් පිරිවරා සුබාසිංසන පිරිනමයි.

## දික්ඕවිට ක්‍රිස්තු සංචාරයක්

මරිය වසර නිමිත්තෙන් මරිය හමුදාවේ වත්තල ක්‍යුරියාව ක්‍රිස්තු සංචාරයක් දික්ඕවිට ග්‍රාමයේ පැවැත්විය. ඊට මරිය හටයින් සිය දෙනෙක් සහභාගි වූහ. මේදින දික්ඕවිට මරිය හමුදා ජෝෂ්ඨ කාන්තා ප්‍රසීඩියමක්ද ආරම්භ කළ අතර ප්‍රකට මරිය හමුදා නියමුවකු වන නිවුටන් ප්‍රනාන්දු මහතා දෙසුම් පැවැත්විය.

**(ඇනා ලිලියන් ප්‍රනාන්දු)**

## කොළඹ පදවියේ විවාහ හමු සති අන්තයක්



පිටිපන ශු. කානික්ක මාතා සියවස වෙනුවෙන් විවාහ හමු සති අන්තයක් විවාහ හමුව උපාධ්‍ය ගරු අයිවන් පෙරේරා, ගරු බොනිපස් මෙන්ඩිස් ගරු ජූඩ් පීරිස් පියතුමන්ගේ මූලිකත්වයෙන්ද නොයෙල්+මාලනි, කැලිස්ටස්+ඇග්නස්, රොහාන්+අමිතා යන යුවළ විසින් පවත්වන ලදී. **(ප්‍රෙඩී+ජීන් යුවළ)**



කොළඹ අගරදගුරු වසමේ ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාර පදවි විධායක සභාව එක් අයකුට රු1000/= බැගින් ශිෂ්‍යාධාර 25 දෙනකුට පිරිනැමීය. ලොතරැයි දිනුම් ඇදීමකින් උපයාගත් අරමුදලකින් දියත් කළ මේ වැඩ සටහන අරඹමින් අගරදගුරු පදවි ක්‍රි.ක.ව්‍යා. උපාධ්‍ය ගරු රීඩ් ෂෙල්ටන් ප්‍රනාන්දු පියතුමා සිසු දැරියකට අදාල ශිෂ්‍යාධාර මුදල පිරිනමයි. පදවි සභාපති ජෙරාඩ් ඩයස්, පදවි ලේඛිකා කෝමලතා ප්‍රනාන්දු පදවි භාණ්ඩාගාරික මයිකල් පීරිස් මහත්ම මහත්මීහුද ඊට සහභාගි වූහ.

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586

ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.com

ක්‍රිස්තු වර්ෂ 2014 පෙබරවාරි 16 ඉරිදා

# මුතුරාජවෙලේ මුතු කැට විසිරෙයිද?

යෝජිත, කටුනායක කොළඹ අධිවේගී විදුලි දුම්රිය මාර්ගයට සමගාමීව බෝපිටිය ප්‍රදේශයේ සහ කෙරවලපිටිය ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත නව නගරදෙක සඳහා මුතුරාජවෙල අභය භූමියේ සහ තෙත්බිම් කොටසින් අක්කර 450ක් ලබා ගැනීමට සැලසුම් කර තිබෙන බවත්, මේ නිසා එම ප්‍රදේශ තුළ දැඩි පාරිසරික හානියක් සිදුවන බව ශ්‍රී ලංකා ජෛව විවිධත්ව සංරක්ෂණ හා පර්යේෂණ කවය සඳහන් කර ඇති බව එක්තරා පුවත්පතක් පසුගියදා සඳහන් කර තිබුනි. මෙම නගර සැලැස්මට අනුව තෙත්බිම් අක්කර 150 බෝපිටිය නව නගර සැලැස්මටත්, ඉතිරි අක්කර 300 ක ප්‍රමාණය කෙරවලපිටිය නගර සැලැස්මටත් ලබා ගැනීමට සැලසුම් කර තිබෙන බවද එම සංවිධානයේ සභාපති ළහිරු ප්‍රකාශ් මහතා සඳහන් කර ඇති බවත් එකී පුවත්පත් විස්තරය තව දුරටත් සඳහන් කරයි.

මෙය පාරිසරික ප්‍රශ්නයක් මෙන්ම මුතුරාජවෙල අවට සම්ප්‍රදායික ගම්වල වෙසෙන ජනතාවට බරපතල ලෙස බලපාන දිගු කාලීන ප්‍රශ්නයක් බවට පත් වෙන බවද සඳහන් කළ යුතුයි. මෙකී ව්‍යාපෘතිය සිදු කිරීමට බලධාරීන් අවසර ලබා දුනහොත් දිවයිනේ අගනුවර ආසන්න ඉතා වැදගත් තෙත් බිම් පරිසර පද්ධතියක් වන මුතුරාජවෙල අභය භූමියේ වනජීවී ප්‍රජාවට බරපතළ විනාශයක් සිදුවන අතරම ඒ මගින් සැලසුණු ඉමහත් සේවයද නොලැබී යෑමෙන් ඒ ආශ්‍රිත සාම්ප්‍රදායික ගම්මානවල ජීවත් වන කතෝලික ජනතාවටද දුෂ්කරතා රැසකට මුහුණ දීමට සිදුවන බව අවධාරණය කළ යුතුයි.

කැළණි ගඟේ සිට මීගමු කළපුව දක්වා ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ ඔස්සේ පැතිරී ඇති මුතුරාජවෙල තෙත් බිම ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ පිහිටා ඇති විශාලතම තෙත් බිමයි. නාගරික හා කාර්මික ප්‍රදේශ ගණනාවක් ඔස්සේ පැතිරී ඇති මුතුරාජවෙල තෙත්බිම විවිධ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා බිලි ගැනීමට බලධාරීන් කටයුතු කිරීම හේතුවෙන් එහි වපසරිය දිනෙන් දිනම පහළ වැටීම එහි පැවති පාරිසරික වටිනාකම් වලට බරපතළ පහරක් එල්ල වී ඇති බව අවධාරණය කළ යුතුව ඇත. මෙම තෙත් බිමේ පාරිසරික හා ජෛව විද්‍යාත්මක වටිනාකම අවබෝධ කරගෙන එය තිරසාර ලෙස භාවිතයට ගැනීම සඳහා කලකදී මුතුරාජවෙල මහා සැලැස්ම නිර්මාණය කෙරුණද එය තවමත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක වී නොමැත. එදා ගරු සිරිල් පීරිස් පියතුමන් මුතුරාජවෙල රැක ගැනීමට පමණක් නොව මුතුරාජවෙලින් ලබන ස්වභාවික සම්පත් වන කඩොලාන, ආශ්‍රිත කඩොලාන, වගුරු පරිසර, ලඳු කැලෑ, මිරිදිය ජල මාර්ග ආදි විවිධ පරිසර පද්ධතීන් රැසක් සුරක්ෂිත කර ගනිමින් ජනතා කේන්ද්‍රිය, ජන අවබෝධයෙන් යුත් හිතකාමී යෝජනා ක්‍රමයක් ආරම්භ කරමින් ජනතාවටම එය ආරක්ෂා කිරීමේ යුතුකම පහදා දුන් ක්‍රියාමාර්ගද පසුකාලෙක ඇන හිටියේ ඉතාමත් ඛේදජනකවයි.

ශ්‍රී ලංකා ජෛව විවිධත්ව සංරක්ෂණ හා පර්යේෂණ කවයේ ගරු සභාපති ළහිරු ප්‍රකාශ් මහතා සඳහන් කරන පරිදි මුතුරාජවෙලෙහි ඇති පරිසර පද්ධති විවිධාකාර ජීවී ප්‍රජාවන් රැසකට වාසස්ථාන සපයන අතරම දැනට වාර්තාවී ඇති ආකාරයට මෙහි සත්ත්ව කාණ්ඩ 07 කට අයත් විශේෂ 449 ක ජීවිහු ජීවත් වෙති. ක්ෂීරපායි, පක්ෂීන්, උරගයින්, උභයජීවීන්, මසුන් හා අපෘෂ්ඨවංශීන් විශේෂ රැසක් ඊට අයත් වන අතර ඉන් විශේෂ 20 ක් පමණ ශ්‍රී ලංකාවට ආවේණික වෙයි.

මෙම පාරිසරික වැදගත්කමට නොදෙවැනි ආර්ථික හා සමාජීය වටිනාකම් රැසක්ද මුතුරාජවෙල මගින් ජනතාවට සැලසෙයි. ධීවර කර්මාන්තය හා සංචාරක කර්මාන්තය මගින් මෙම තෙත් බිම් ආශ්‍රිත ප්‍රජාවට ජීවනෝපාය සරිකර ගැනීමේ හැකියාව පවතී. එසේම අගනුවර ආශ්‍රිතව මෙම තෙත් බිම් පිහිටා තිබීම නිසා ගංවතුර පාලනයට. භූගත ජලය ආරක්ෂා කර ගැනීමටද එමගින් විශාල පිටිවහලක් ලැබේ.

නමුත් මෙහි ඇති මහත් වටිනාකම් රැසක් පසෙක දමමින් බෝපිටිය හා කෙරවලපිටිය සුපිරි නගර ව්‍යාපෘතිය මෙම රමණීය තෙත් බිම ගිල ගැනීමට මාන බලන්නේ සාම්ප්‍රදායික කතෝලික ගම් වන බෝපිටිය, කඳාන, පමුණුගම, උස්වැටකෙයියාව යන ගම් ගංවතුර බිල්ලටද හසුකරමිනි. හෝටල් සංකීර්ණ, වරාය උද්‍යාන, සුඛෝපභෝගී කඩ සාප්පු, ගොල්ෆ්පිටි ඉදිකර, පෞද්ගලික සමාගමකට කෝටි ගණන් මුතුල් ඉපයීමට ඉඩ සලසා දෙමින් මුතුරාජවෙල තෙත් බිම් ආශ්‍රිතව පරම්පරා ගණනක් ජීවත් වූ අසරණ කතෝලික ජනතාවගේ ජීවිත කබලෙන් ලිපට විසිකර දැමීමට කටයුතු කරන මෙම ඊනියා සංවර්ධන ව්‍යාපෘතියට මුතුරාජවෙල තෙත් බිමේ හා අභය භූමියේ ඉඩම් බිලි නොදීමට වග බලා ගැනීම නිළධාරින්ගේ හා බලධාරින්ගේ යුතුකම හා වගකීම බව අපි ඉතාමත් අවධාරණයෙන් සඳහන් කරනු කැමැත්තෙමු.

# කතෝලික මාධ්‍යවේදිනියගේ අනුවේදනීය ඛේදවාචකය

හැට හය වැනි නිදහස් සමරු උළෙලට රටම පෙළගැසෙමින් සිටියදී පෙබරවාරි 02 වැනි ඉරිදා මාධ්‍යවේදිනියක මරා දමා ඇතැයි යන පුවතෙන් කොයි කවුරුත් තැති ගත්හ. බත්තරමුල්ලේ සුභූතිපුර ගැමුණු මාවතේ නිවහනක් තුළ මෙල්ෂියා ගුණසේකර නම් 41 හැවිරිදි ව්‍යාපාර පුවත් පිළිබඳ මාධ්‍යවේදිනිය කෲර ලෙස ඝාතනය කර තිබිණි.

1973 දී උපත ලද මෙල්ෂියා ගුණසේකර මාකස් ගුණසේකර යුවළගේ වැඩිමහල් දියණියයි. කොළඹ සාන්ත බ්‍රිජට් කන්‍යාරාමයෙන් සිප්සතර හැදෑරූ ඇය 1997 අප්‍රේල් මසදී විජය ප්‍රකාශන සමාග මේ සන්ඩේ ටයිම්ස් ඉංග්‍රීසි පුවත්පතට සම්බන්ධ වූවාය. ආර්ථික තොරතුරු හා ප්‍රවෘත්ති සපයන අතරේම සංස්කරණ කටයුතු වාර්තාකරුවන් පුහුණුකිරීම ඇතුලු කටයුතුවල නියැලෙමින් 2000 ජුනි දක්වා සේවය කළාය.

2000 ජුලි මසදී මෙරට ඉතිහාසයේ මුල්වරට ලංකා බිස්නස් ඔන්ලයින් (LBO) නමින් වෙබ් අඩවියක් ආරම්භ කර එහි කටයුතුවලට උරදෙන මෙලීෂියා එහි සමාරම්භක කතුවරියද වූවාය. 2007 ජනවාරි මාසයේදී ඉන් සමුගත්තීය. ඒ වන විටත් ප්‍රංශ ප්‍රවෘත්ති සේවාවේ වාර්තාකාරිනියක ලෙස කටයුතු කළ ඇය ශ්‍රී ලංකාවේ හමුදා මෙහෙයුම් දේශපාලනය ව්‍යාපාර ක්‍රීඩා හා ජීවිත චර්යා රටාවන් ගැන වාර්තා සැපයීමට ක්‍රියා කළාය. ශ්‍රී ලංකාවට පිටත රටවල විශේෂයෙන් මාලදිවයිනේ ජනමත විචාරණය ප්‍රජාතාන්ත්‍රික වෙනස්වීම්, ඉස්ලාමීය සටන්කාමීන් නැගිටීම සහ එරට ආර්ථික කටයුතු පිළිබඳව ප්‍රංශ පුවත් සේවයට තොරතුරු සැපයුවාය.



වර්ෂ 2012 අප්‍රේල් මස ඊට සමුදුන් මෙලීෂියා එම වසරේ දෙසැම්බරයේදී 'ෆිච් රේටින්ස්' සමාගමේ උප සභාපති ධුරයට පත්වූවාය. ෆ්ලෙක්සිවර්ඩ්ස්හි හවුල්කාරිනියකවූ ඇය 2005 වසරේ පටන් තොරතුරු සම්පාදනය, ප්‍රගති වාර්තා සැකසීම ඇතුලු එහි වර්ධනයට අදාළ කටයුතු රැසකට උර දුන්නාය. ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ රැකියාවක ඇය මිය යන විට නියැලී හුන්නාය. ඇය වාසය කළ නිවහනේ තීන්ත පින්තාරු කටයුතු වලට පැමිණි සැම්සන් ජෝර්ජ් ඇන්ටනි නමැති 39 වියැති කම්කරුවා නිවස කොල්ල කන්නට සිතා එහි පැමිණියේ නිවැසියන් ඉරිදා දිව්‍ය පූජාවට යන වේලාව බලාය. එදාත් මාකස් ගුණසේකර යුවළ සිය පුතණුවන්ද කැටුව රාජගිරිය ශ්‍රී හෘදය දෙව්මැදුරේ උදෑසන දිව්‍ය පූජාවට පැමිණියහ.

සවස දිව්‍ය පූජාවට යෑමට සිතා මෙල්ෂියා ගුණසේකර ගෙදර සිටියාය.ඇය මුළුතැන්ගෙයි සිටියදී නිවසට ආ 'තීන්ත බාස්ව' හඳුනාගත් ඇය ඔහුව පන්නා ගත්තාය. තමා හඳුනා ගැනීම නිසා ඔහු ඇයගේ දිවි තොර දැමුවත් ඔහුට එම නිවසින් සොරකම් කරන්නට ලැබුණේ රුපියල් 1200 හා ජංගම දුරකථනයක් පමණකැයි පොලිස් වාර්තා වලින් කියවේ.

පැය ගණනාවක් ඇතුළත මිනීමරුවන් අත්අඩංගුවටට ගැනීමට සමත්වූ අතර සැකකරු රක්ෂිත බන්ධනාගාර ගත කැර තිබේ.

**පසු වදන : ප්‍රදීපයේ සංස්කාරක පියතුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ ශෝකය මේ මොහොතේදී ඇගේ දෙමව්පියන් වෙත පළකර සිටිමු. ඇයගේ ආත්මයට නිත්‍ය සුව අත්වේවා !**

**– මෛත්‍රී**

# සමාජ වෙනසක් සඳහා මරියභාවිතාව

පසුගිය සතියෙන්

කතෝලික සභාව සැදැහැවතුනට ආරාධනා කරනුයේ මරිය තුමියව ආදර්ශයට ගන්නා ලෙසටය. මරිය තුමිය ජීවත් වූ සමාජ, දේශපාලන සහ සංස්කෘතික පරිසරය අද වෙනස් වී ඇති අතර අප ආදර්ශයට ගත යුත්තෙ එතුමිය තම ජීවිතයේදී සම්පූර්ණ වගකීමකින් දේව කැමැත්ත පිළිගැනීමම ආදර්ශයයි. (ලුක් 1:38) එතුමිය දේව වචනයට ඇහුම්කන්දී ක්‍රියාකිරීම සහ දයාව සහ සේවය එතුමියගේ ගාමක බලවේගයයි.

ක්‍රිස්ත ශ්‍රාවකයන් ලෙස අප මරිය තුමිය ආදර්ශයට ගත යුත්තෙ, එතුමිය ක්‍රිස්තුතුමන්ගෙ ප්‍රථම පිරිපුන් ශ්‍රාවිකාව වු නිසාය. අපගේ ආධ්‍යාත්මික සමාජ භාවිතයේ ආදර්ශයට ගත යුත්තේ මරිය තුමියගෙ ආධ්‍යාත්මික සමාජ භාවිතයයි. මෙය යැදුම්ගත බයිබලීය කියවීමේ ආලෝකයෙන් අපේ සමාජ සන්දර්භය තුළ අපට ඇසෙන්නට ලැබෙන

**වි. ලෙ. පීරිස්**


දේව ආරාධනාව කීකරුවීමෙ ආධ්‍යාත්මික ප්‍රතිපදාවයි. දේව වචනය හඳුනාගෙන, ඇහුම්කන්දී, ග්‍රහණය කරගෙන, එය මෙනෙහිකර කීකරුවී එය අන් අයට ප්‍රකාශ කරන්නට පෙර වැඩෙන්නට ඉඩදී මානව විමුක්තියේ දෙව් දහම් කේන්ද්‍රීය තේමාව මරිය තුමිය ප්‍රකාශ කළාය. (ලූක් 1:46-55).

මරිය භාවිතාව අපේ ආධ්‍යාත්මික සමාජ භාවිතාව කර ගැනීමට නම්, අපි අපේ සමාජ සන්දර්භයට අවදිව, යැදුම්ගත බයිබලීය කියැවීමේ ආලෝකයෙන් මේ සමාජයෙන් නික්මෙන දේව හඬ හඳුනාගෙන, එයට සාවධානාව ඇහුම්කන්දී එම ආරාධනාව කිකරුව පිළිගෙන දේව වචනයේ ගැබ්වී ඇති ක්‍රියාව අපේ සමාජ යථාර්ථය තුළ ක්‍රියාත්මක කිරීමය. මේ ක්‍රියාකාරිත්වය තුළින් ඇතිවන වෙනස මිනිස් පූර්ණත්වය සඳහා වන ක්‍රියාවලියට දායකවේ.

එය ගැළවීමදායකය, විමුක්තිදායකය. අපේ ප්‍රැන්සිස් පොදු පියා මෙම වෙනස මෙසේ පැහැදිලිකරයි, "දේව වචන අප තුළට ඇතුළුවු විට අපේ හදවත් වෙනස් කරයි."

වෙනස් වන හදවත් හෘද සාක්ෂිගත සමාජ භාවිතාවකට පෙළඹේ. සමාජ වෙනසක් සඳහා මරිය භාවිතාවට පෙළ ගැසෙමු.

## කැමිලස්ගේ — තිත්ත ඇත්ත



මීසමෙන් මීසමට

# කඩලාන සා. අන්තෝනි නොවානයේ 2400 පෙබරවාරි 18

කඩලාන ශාන්ත අන්තෝනි දේවස්ථානයේ 2400 වැනි ශුද්ධ වූ අන්තෝනි මුනි බැති නුවානය පෙබරවාරි 18 අඟහරුවාදා සවස 6.30ට පාදුවා නගරයේ සිට වැඩමවා තැම්පත් කර ඇති උන්වහන්සේගේ ශ්‍රී ධාතුව ඉදිරිපිටදී පැවැත්වීමට මීසම් සේවක මොරටුව දිසානායක අතිගරු ලලිත් පෙරේරා සහයක මොරටු දිසා ලේකම් ගරු දිනේෂ් ප්‍රශාන් පියතුමන් එක්ව කටයුතු කරමින් සිටී.

**- සුමිත් මාර්ක් ද සිල්වා**



මොරටුව කටුකුරුන්ද ශාන්ත මරියා දේවස්ථානයේ වින්සෙන්ති ද පාවුලා සමිතිය මගින් මීසම් සේවක ගරු ක්‍රිශාන්තස් ප්‍රනාන්දු පියතුමා (නි.ම.නි) ගේ මග පෙන්වීම මත කටුකුරුන්ද ග්‍රාමයේ ගම්වැසියන්ගේ ආධාර ඇතිව ප්‍රදේශයේ දිළිඳු වැඩිහිටි අයට රෙදිපිළි බෙදා දෙන ලදි. ගරු පියතුමා ඊට එක්වූ ආකාරය මෙහි දැක්වේ.

**- අසික ප්‍රියදර්ශන**

# කතෝලික දූ දරුවන්ට පාසල් අහිමි වෙලා

## කුරුණෑගල රදගුරු හිමි පවසයි



අතීතයේ කිතුනුවන් තුළ **බෙදීමක් ඇතිවූ නිසා එදා කතෝලික පාසල් රජයට පවරා ගත්තා. එදා කිතුනුවන් ලෙස අපගේ අයිතිවාසිකම් වෙනුවෙන් නිහඬවීමේ ප්‍රතිඵලයක් ලෙස වර්තමාන කතෝලික පරම්පරාවට ඊට වන්දි ගෙවන්න සිද්ධ වෙලා.** ඒ නිසා කතෝලිකයන්ට කිතුනු ධර්මය උගන්වන කිතුනු පරිසරයක් සහිතව අධ්‍යාපන ලබන්නට තිබෙන අයිතිය අහිමි වෙලා. ඒ තරමටම කතෝලිකයන් අසරණ වෙලා! ඒ නිසා අද කතෝලික දරුවන් ඇතුලු කිරීම සඳහා රදගුරු තුමන්ලා පීඩනයට පත්වන තත්ත්වයකට පත්වෙලා තිබෙන බව කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමි මල්පිටිය ශුද්ධවූ සෙබස්තියන් මුනිතුමාගේ දේවස්ථානයට වසර 125 ප්‍රකාශයට පත් කිරීමේ වාර්ෂික මංගල්‍ය දිව්‍ය පූජාවට සහභාගි වෙමින් පැවසීය.

මල්පිටිය ශුද්ධවූ සෙබස්තියන් මුනිතුමාගේ දේවස්ථානය වසර 125 පිරීම වෙනුවෙන් ජයන්ති වසර ප්‍රකාශ කිරීමේ සන්නස් පත්‍රය ප්‍රකාශයට පත් කරන ලද්දේ කුරුණෑගල රදගුරු හිමිපාණන් විසිනි. මෙම මංගල්‍යය දූත සේවා මණ්ඩලයේ සහයෝගය මත මල්පිටිය මීසම් සේවක ගරු මොන්ටි පෙරේරා පියතුමා සංවිධානය කළ අතර අති විශාල ජනතාවක් ඊට සහභාගි වූහ.

**- බී. ටී. ආර්. රොඩ්රිගෝ**

# වෙන්නප්පුව දිව්‍ය හෘද පළඳනා පිළිගැන්වීමක්

වෙන්නප්පුව මීසමේ දිව්‍ය හෘදය සමිති සමාජික සමාජිකාවන් නව වසර වෙනුවෙන් නව පළඳනා පිළිගැන්වීමේ උත්සවයක් වෙන්නප්පුව ශු. ජුසේ මුනිඳුන්ගේ දේවස්ථානයේදී පැවැත්විණි.එහිදි දිව්‍ය හෘදය සමිති සමාජික සමාජිකාවන් වෙන්නප්පුව මීසම් සේවක ගරු එරික් ප්‍රනාන්දු පියතුමා සමග ඡායා රූපයකට පෙනී සිටි අයුරු.

**සේයා - ගොඩ්ප්‍රි අබේසේකර / සටහන - ප්‍රියන්ත පීටර්ස්**



# පුලතිසිපුර දේවමාතා මංගල උලෙළ



දේව වාක්‍ය ප්‍රකාශ කරන්නන් දැනුම්වත් කිරීමේ වැඩ සටහනක් තේවත්ත ලූර්දු මාතා දෙව් මැදුරේදී පැවැත්විනි. එයට කුඩා කිතුනු සංඝ වලින් තෝරාගත් පිරිසක් සහ දහම් පාසලේ ශිෂ්‍ය නායක නායිකාවන් ඇතුලු පිරිසත් සහභාගි වූහ. මීසම් සේවක ගරු ප්‍රිය ජයමාන්න පියතුමාගේ ආරාධනයෙන් ජාතික ජනවන්දනා අධ්‍යක්ෂ ගරු ඉග්නේෂස් වර්ණකුලසිංගම් පියතුමන් විසින් එය මෙහෙයවන ලදී.

**- ප්‍රියන්ත මෙන්ඩිස්**

**පුරා වසර 37 ඉතිහාසයකට උරුම හිමිකම් කියන පොළොන්නරුව නිර්දෝෂ දේවමාතා දේවස්ථානයේ වාර්ෂික මංගලෝත්සවය අනුරාධපුර රදගුරු අතිඋතුම් නෝබට් අන්ද්‍රාදි (නි.ම.නි) හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කැරිණි.**

එහිදී දෙසුම පැවැත්වූ රදගුරු හිමි 1854 වසරේදී අතිඋතුම් 9 වන පියුස් සුදොතුම් පියතුමා මරියෝත්තමාවන්ගේ නිර්මල පිළිසිදීම පිළිබඳව සිය විශ්ව ප්‍රකාශනයක් මගින් ප්‍රකාශයට පත්කළ බවත් එතැන් පටන් ශුද්ධවූ සහා මාතාව දේවමාතාවන්ගේ නිර්මල පිළිසිදීම සමරන බව පැවසීය.

කුඩා මඩුවකින් ඇරඹී දෙව්මැදුර කලින් කල විශාල කරමින් සංවර්ධනය කළද මේ වන විට බිත්ති එකිනෙකට සම්බන්ධවන ස්ථාන පුපුරා ගොස් කපරාරු කොටස් කඩා වැටෙමින් පවතී. නව දෙව්මැදුරක් ගොඩනැගීමේ අවශ්‍යතාව මතුවෙමින් පවතී.

**ආන්ජලෝ පීරිස්**

# මරිය වසර අරුත්බරව ආරම්භ කරයි

**මරිය වසර පල්ලන්සේන මීසමේ ආරම්භ කළේ දේව මාතා ප්‍රතිමාවන් කිතුනු ඒකක 61 ක් තුළ ගෙයින් ගෙට සංචාරය කිරීම ආරම්භ කරමිනි.**

සෑම බදාදා දිනකම ඊළඟ නිවසට ගෙනයනු සේ සතියක් නිවස තුළ තැන්පත් කර එම නිවසේ සතිය පුරා ජපමාලය දේව මාතා ප්‍රාර්ථනාව රට වෙනුවෙන් හා මරිය වසර නියමිත යාච්ඤාව උච්චාරණය කිරීමෙන් පසුවය. ශුද්ධවූ සුවිශේෂයේ මරිය තුමිගේ ප්‍රකාශනයන් ජපමාලයේදී භාවනා කරන අතර ගීතිකාද පංතියෙන් පංතියට ගායනා කෙරේ. මේ අනුව මුළු වසර පුරා සති 52ක් තුළ මෙම අභ්‍යාසය ක්‍රියාත්මක කෙරේ.

මීසම් සේවක ගරු ජයන්න නිමල් හා සහයක ගරු ගයාන් ප්‍රසන්න පියතුමන් මෙම අභ්‍යාසය කිතුනු ඒකක නායකයින් සමග සංවිධානය කර ඇත.

**- මෙල්වින් ද කොස්තා**



ඉදිගොල්ල ශු. ජුඩ් සිද්ධස්ථානයේදී මුල් වරට මරිය හමුදා ප්‍රසීඩියමක් සිද්ධස්ථාන පාලක ගරු නොයෙල් නෝනිස් පියතුමාගේ මෙහෙයවීමෙන් ආරම්භ විය. නවක සොයුරු සොයුරියන් නව දෙනෙක් සහභාගි වූ අතර ඔවුන් දැනුම්වත් කිරිම සඳහා අගරදගුරු කොමිටිසියම් සභාවේ බෙනි ජයමාන්න හා ගම්පහ ක්‍යුරියා සභාපතිනි ක්ලෙරා මියුරියල් සොයුරිය සහභාගි වූහ.

# ගොරකදෙනිය ශුද්ධ වූ ජුවාම් මුනි දෙව්විමන

පුදබිමක අසිරිය


**නිට්ටඹුව මීසමට අයත් ගොරකදෙණිය ශුද්ධ වූ ජුවාම් අපෝස්තුලුතුමන්ගේ දේවස්ථානයේ ආරම්භය 1923 දීය. මෙම ග්‍රාමයේ කෙලවර ඉඩමක පොල් අතු අසුරා සාදන ලද ගෙයක දේවමාතාවන්ගේ ප්‍රතිමාවක් තබා වන්දනාමාන කළ බවත් ඔවුන්ගේ ආත්මික කටයුතු සඳහා වේයන්ගොඩ දේවස්ථානයට ගිය බවත් කියැවේ.**

1920 දී මාර්ග වර්ධනයවීම හේතුකොට දෙව්මැඳුරක් ගොඩනැගීමට අදහස් කළ දොන් ජුවන් රාජසේකර මහතා මාර්ගය අසල වු තමාගේ ඉඩමක පොල් කොට කණු මත වහල ගසා පූජාසන කොටස පමණක් කබොක් ගල් මැටි භාවිතයෙන් බිත්ති බැඳ අනෙක් කොටස් අනාවරණය වුවද වහල පොල් අතු සෙවිලි කර තිබූ බව පැවසේ. 1923 දී වේයන්ගොඩ මීසම් සේවක ගරු එම්. එන්. ස්ටමුවර් පියතුමා මේ ගොඩනැගිල්ල ආසිරිග න්වා ශු. ජුවාම් අපෝස්තුළු තුමන් නමින් කැපකර ඇත.

මේ දේවස්ථානය සෑදු පසු දේවමාතා ප්‍රතිමාවද මෙහි තබා ඇත. වාර්ෂික මංගල්‍ය පූජාවෙන් පසු පෙරහර යෑමේ දි දේව මාතා ප්‍රතිමාව ප්‍රථමයෙන්ද ඊට පසුපසින් ශු. ජුවාම් තුමාගේ ප්‍රතිමාව ද රැගෙන යති. පොල් කොට කණු මත වහලය ගසා තිබූ මෙම දෙව්මැඳුර 1945 දී කොන්ක්‍රීට් කණු මත වහලය ගසා කබොක් ගලින් හා මැටිටෙන් බිත්ති බැඳ මොගොප්පුවක් ද ගොඩනගා වහල පොල් අතු සෙවිලිකර ප්‍රතිසංස්කරණය කරන ලද්දේ ගොරකදෙනියේ ලියෝරිස් (ලියනාර්දු) රත්නසේකර මහතා විසිනි. 1948 දී ඇතිවූ මහා වර්ෂාවක් හේතුවෙන් මොගොප්පුවේ උඩ කොටස් කඩා වැටී ඇත. 1952 දී මීසම් සේවක ගරු දොන් එඩ්වඩ් පියතුමාගේ අනුදැනුම ඇතුව කැඩී ගිය කොටස ගඩොලින් හා සිමෙන්ති මිශ්‍රණයෙන් බැඳ වහලද පළ දෙකකට සිටින සේ සාදා උළු සෙවිලි කර ප්‍රතිසංස්කරණය කිරීම ඩී. කේ. රාජසේකර සහෝදරයන් විසින් කර ඇත. ගම්පහ මීසම් සේවකව සිටි ගරු පිලිප් සී දිසානායක පියතුමා විසින් දේවස්ථානය පිටිපසට යාව මාර්ෂල් රාජසේකර මහතා පරිත්‍යාග කළ ඉඩමක මීසම් ගෘහයක් ද ගොඩනගා ඇත.

1973 දී ස්වර්ණ ජයන්තියට සමගාමීව කළු ගලින් බඳින ලද සීනු කණුවක් ගොඩනගා ඇත. ගරු ජ්ලෙයිබර් පියතුමාගේ මෙහෙයවීමෙන් ජයන්ති උලෙළ අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි.

1995 දී මීසම් සේවක ගරු රංජිත් මදුරාවල පියතුමා 75 වන ජුබිලිය නිමිත්තෙන් දේවස්ථානයේ පැරණි



මොගොප්පුව කඩා ඉවත් කර ස්ලැබ් එකක් සහිතව දෙව් මැඳුර ඉදිරියට ගෙන ආරුක්කු දොරවල් සහිත බිත්ති බැඳ මොගොප්පුවක් ද ගොඩනගා ප්‍රතිසංස්කරණය කරන ලදී. 1999 ජනවාරි 24 වන අති උතුම් නික්ලස් මාකස් කොළඹ අගරදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් 75 ජයන්තිය පවත්වන ලදි. මීසම් සේවක ගරු ප්‍රැන්සිස් ජයකොඩි සහ සහයක ගරු සම්පත් තුෂාර පියතුමන්ගේ මෙහෙයවීමෙන් ගොරකදෙණිය සභාවේ කටයුතු සිදුකරමින් පවතී.

**- ඩී. ආර් ඔස්ටින්**

# හලාවත පදවි මරිය හමුදා 57 වන සංවත්සර උලෙළ

**මරිය වසරේදී මරිය හටයින් කිතුනු ජනතාවට සිය ජීවිතයෙන් දැක්විය යුතු දිව්‍යමයවූ සුපුවතක් ඇතැයි හලාවත රදගුරු අතිඋතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ හලාවත සුදසුන ශාලාවේ පැවැති පදවි මරිය හමුදා කොමිටිෂියමේ 57 වන සංවත්සර උලෙළේදී පැවසුහ.**

හලාවත පදවියේ මරිය හමුදා අධ්‍යක්ෂක ගරු ග්‍රෙගරි හැරල්ඩ් පියනමද පදවි පරිපාලක අතිගරු ප්‍රැට්‍රික් විජේසිංහ හලාවත මීසම් සේවක ගරු ලින්ටන් නිහාල් පියතුමන් විසින් මරිය හටයින් අමතා විශේෂ අනුශාසනාව ඉදිරිපත් කරන ලදී. කොමිටිෂියම් සභාපති රත්න උදය කුමාර, උප සභාපති රංජිත් පෙරේරා, ලේකම් ශ්‍රියාණි පෙරේරා සහ භාණ්ඩාගාරික මේරියන් ශ්‍රිමති යන මහත්ම මහත්මීහු සංවත්සර උලෙළ සංවිධානය කළහ. කොළඹ සෙනාටස් සභාව නියෝජනය කරමින් පැමිණි ස්ටැන්ලි ජෝශප් මහතා මරිය හමුදා ඉතිහාසය සවිස්තරව ගෙනහැර දැක්විය.

**ඩබ්.ඇන්ටනි පීටර් ප්‍රනාන්දු**

# මරිය තුමිය ජීවිතයට එක් කරගනිමු

**මෙම මරිය වසර තුළ මරිය වහන්සේගේ මධ්‍යස්ථභාවය පිළිබඳව අගයන අප එතුමිය ජීවිත වලට බද්ධ කර ගැනීම ගැන ද අවධානය යොමු කළ යුතුවේ. වර්තමාන සමාජයේ වෙසෙන ඇතැම් කිතුනුවන් පවා මරිය තුමිය අපට එතරම් අවශ්‍ය නැති තැනැත්තියක් ලෙස පිළිගැනීමට යොමු වී සිටී. එහෙත් සත්‍ය වශයෙන්ම එය පදනම් විරහිතය. අර්ථ ශූන්‍යයය.**

එතුමිය අපට ලබා දුන්නේ දෙවියන් වහන්සේ ය. අපගේ ජීවිත සඳහා මැදිහත් වන උත්තමාවක් ලෙස මරිය තුමිය හඳුන්වාදීමේ කිසිදු වරදක් නැත. එපමණක් නොව එතුමිය නිරන්තරයෙන් අප ජේසු සමිඳුන්ට ළං කරන්නට වැයම් කරයි. ලොව සෑම දෙයක්ම නිර්මාණය වී තිබෙන්නේ හිරුගේ ආලෝකයෙන් සහ අම්මාගේ කිරි වලින් යැයි ජගත් කීර්තිධර ලේඛකයකු වූ මැක්සිම් ගෝර්කි ප්‍රකාශ කර ඇත. එම ප්‍රකාශය සත්‍ය වශයෙන්ම මරිය වහන්සේ සම්බන්ධව ද අදාළ වන්නකි. අප මරිය මාතාවට කියන නමෝ මරිය යැදුම බැතිබරව නිතර උච්චාරණය කරන්නේ නම් අපට විපුල වරප්‍රසාද ඕ තුමිය ලබා දෙන්නීය. මෙම ලොව තුළ අපට දෙමාපියන්, සහෝදර සහෝදරියන්, නෑදෑ හිතවතුන් සිටින අතර පැහැදිලි වශයෙන් ඔවුන් එකම අන්දමකින් අපට ආදරය කරන බව සිතිය නොහැකිය. විවිධ කාරණා හමුවේ, ප්‍රශ්න, වේදනා හමුවේ ඔවුන් අප පිළිබඳව දක්වන ලැදියාව සමහරවිට අඩු විය හැකිය. අප අසරණ වන අවස්ථා තිබේ. එහෙත් අපට සැමදා එකලෙස ආදරය කරන මරිය මාතාව ජීවමානව වැඩ සිටින බවට ස්ථිර සාර විශ්වාසයක් ඇති කර ගත යුතුය. උන්වහන්සේ අපට නොපෙනේ. එහෙත් එතුමියගේ ක්‍රියාකාරිත්වයන් අපට දැක බලා ගත හැකිය.



එමෙන්ම දෙවි පියාණන් වහන්සේ ද අපට සිටින සේක. එම ඇදහිල්ල සවිමත් කර ගැනීමට අප උනන්දු විය යුතුය. මෙම විශ්වාසයීය බන්ධනයට එකළු වන්නට වැයම් කරන ප්‍රමාණයට අපගේ ආධ්‍යාත්මික ශක්තිය අධික වේ. පෝෂණය වේ. එලෙසම සියලු අවස්ථාවලදී මරියෝත්තමාවට යාච්ඤා කිරීම තුළින් අපට එතුමියගේ පිළිසරණය නිරතුරුවම ලැබේ. මරිය මාතාවට අප ආදරය කරන්නට නම්, අප එතුමිය මෙන් සරල, අල්පේච්ඡ ජීවිතයකට අප ද එක් විය යුතුය. එලෙසින්ම මරිය වහන්සේ නිරන්තරයෙන් දේව කැමැත්තට, දේව ආකල්ප සමුදායට කොන්දේසි විරහිතව හිස නැමුවාය. එය උන්වහන්සේ තුළ පැවැති නිහතමානිත්වය පිළිබිඹු කරයි.

සියලු අවස්ථාවල දී මෙන්ම සියලු කාරණාවලදී ද එතුමිය ලෞකික වටිනාකම් අභිබවා ආධ්‍යාත්මික සහනය, සංතුෂ්ටිය කෙරෙහි නතු වූවාය. ජුසේ මුනිඳුන්ට හා ජේසු සමිඳුන්ට අත්වැලක් වූ එතුමිය අපට ද ප්‍රකාශ කරන්නේ දේව සම්බන්ධය කෙරෙහි නිරතුරුවම අවදි වන ලෙසය.

ජේසු සමිඳුන්ගේ කුරුස ගමනට ඉමහත් අස්වැසිල්ලක් වූ මරියෝත්තමාව අපට ද ජීවන ගැටලු වලදී ශුද්ධාත්ම අනුහසින් පොහොසත් වී ඉන්ද්‍රඛීලයක් ලෙස නැගී සිටින්නට සහය දක්වන්නීය. ඕ තුමිය අනුව ක්‍රියා කරන, ඕ තුමිය කෙරෙහි බැතිබර සැමට වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සඳාදර මෑණියන් බවට සහතිකයක් එතුමිය ලබා දෙන්නේ ජීවිත සිදුවීම් වලිනි. ජීවිතයේ අනේකවිධ වද ගාවිනා වලදී මරිය මාතාවන්ගේ නොවරදින සුළු මධ්‍යස්ථභාවය කෙරෙහි රැඳී සිටියහොත් ඒ සෑම බාධාවක්ම ජය ගැනීමට අපට පිහිට වන්නීය. එතුමියට එරෙහිව මූලධර්මවාදී කණ්ඩායම්, අදේවවාදීන් කෙතරම් තර්ක විතර්ක ඉදිරිපත් කළ ද උන්වහන්සේ ගේ ජීවමාන භාවය, මිනිසාට ඇති ආදරය අබමල් රේණුවක තරමින්වත් අඩු නොවේ.

✍ **මලින්ත බෝපෙආරච්චි**

# දේව මවුන් වන මරියෝත්තමාවන්ගේ දිව්‍ය මාතෘත්වය

**ගරු විල්ප්‍රඩ් පින්තු පියතුමා**



**පසුගිය සතිය හා සබැඳේ**

මරිය තුමියගේ දිව්‍ය මාතෘත්වය සඳහා වන පැහැදිලිවම ශුද්ධ ලියවිලි පදනම ලූක් 1:43 හි ගැබ්ව ඇත. තමන් බැහැදැකීමට පැමිණෙන මරිය තුමිය දකින එළිසබෙත් තුමිය අමතන්නේ මාගේ ස්වාමින් වහන්සේගේ මෑණියන්" යනුවෙනි. (ලූක් 1:43) පුරාණ ගිවිසුම් සම්ප්‍රදාය තුළ "ස්වාමින් වහන්සේ" යනු දෙවියන් වහන්සේ සඳහා භාවිත කළ තවත් නමකි. උදා: "නුඹේ මැවුම්කාරයාණන්, ගැලවුම්කාරයාණන් වන සමිඳාණෝ මම ය" (යෙසායා 44:24) "මම සමිඳාණන් වහන්සේය... මා හැර අන් දෙවි කෙනෙක් නැත" (යෙසායා 45:5)

මෙම පුරාණ ගිවිසුම් සම්ප්‍රදාය අනුව යන සුවිශේෂක ලූක් තුමා මරිය තුමී හැඳින්වීම සඳහා ස්වාමින් වහන්සේගේ මෑණියන් යන නාමය යොදා ගනී. එසේ කිරීමෙන් එතුමා බලාපොරොත්තු වූයේ ජේසුස් වහන්සේගේ දේවත්වය අවධාරණය කිරීම වූවා විය හැකිය. එහෙත් එසේ කිරීම නිසා ජේසුස් වහන්සේගේ දේවත්වය තහවුරු වනවා පමණක් නොව මරිය තුමියගේ මාතෘත්වයේ යථා ස්වරූපය එළිදරව් වීමක් ද සිදුවී ඇත. එතුමිය දේව මාතාවන් වහන්සේ ය.

## ශුද්ධවු සභා සම්ප්‍රදාය තුළ මරිය තුමියගේ දිව්‍ය මාතෘත්වය

ක්‍රිස්තු භක්තිකයන් මරිය තුමිය "දේව මාතාවන්" යන නමින් හැඳින් වූ බවට වන, ඓතිහාසිකව පිළිගත හැකි ලිඛිත සාක්ෂි තුන් වන සියවස දක්වා දිව යයි. "තෙයොටොකොස්" දේව මාතාවන් යන නම පළමුවෙන්ම මරිය තුමියට ආදේශ කළේ තුන් වන ශත වර්ෂයේ විසූ හිප්පොලිටස් තුමා බවට මතයක් පවතී. හතරවන සියවස වන විට සභා පියවරුන් තෙයොටොකොස් යන නාමය බහුල ලෙස භාවිත කර ඇති බව පෙනේ.

උදා: අතනාසියුස් තුමා හා බැසිලියුස් තුමා එම සියවසේ ම විසූ නසියාන්ස් හි ග්‍රෙගරි තුමා මෙසේ ලියා ඇත. "යමෙක් මරිය තුමිය දේව මාතාවන් නොවන්නේ යැයි ප්‍රකාශ කරන්නේ ද ඔහු සත්‍ය විශ්වාසයේ පංගුකාරයකු නොවන්නේ ය."

මේ වන විට මරිය තුමියගේ දිව්‍ය මාතෘත්වය ශු. සභාවේ පිළිගත් සත්‍යතාවයක් බවට පත්ව තිබෙන්නට ඇති බවට මෙම ප්‍රකාශය සාක්ෂි දරයි.

☛ ලබන සතියට

# මරිය වසරේ මරියාණෙනි

| | |
|---|---|
| ජම්ම පාප දොසින් ඔබ නිදොස් | වූවා |
| සුවිශේෂී කැඳවීමකට තෝරා ගනු | ලැබූවා |
| වරප්‍රසාද රැසකින් පොහොසත් | වූවා |
| නිර්මල පිළිසිඳීම එලෙසින් සිදු | වූවා |
| යහපත් දියණියක ලෙස ජීවත් | වූවා |
| දේව කැමැත්තට මුළුමනින්ම අවනත | වූවා |
| දෙව් පුතාව තම කුස තුළ රැගෙන | ගියා |
| අප හා සමාන මනු පුතෙකු බිහි | කෙරුවා |
| දේව පණිවුඩය නිහඬව ඉටු | කෙරුවා |
| දෙව් මිනිස් සබැඳියාව යළිදු එක් | කෙරුවා |
| භාග්‍යවන්ත දේව මාතාවන් ලෙස නම් | කෙරුවා |
| කිතුනුවන් අතර ඔබ ප්‍රථම කිතුනුවකු | වූවා |
| ලූර්දු නුවරදී බර්නදෙත්ට දර්ශනය | වූවා |
| තම අනන්‍යතාවය එහිදී හෙළි | කෙරුවා |
| ආරක්ෂාව ලැබීමට නම් කළ යුතු දේ | පැවසූවා |
| ජපමාලයේ ප්‍රබලත්වය එහිදී හෙළි | කෙරුවා |

✍ **නිර්මලා රත්නායක - මාතලේ**

# වඩිනු මැනවි සමිඳුනි

| | |
|---|---|
| ගුණ දම් පහන් තිර දල්වා එළිය | කළ |
| හදවත විවර කර ඇත ඔබ තුමන් | තුළ |
| සෝදා හරිනු මැන, මාගේ කෙලෙස් | මල |
| නවාතැන් ගනු මැනවි, මා හද නම් ගෘහය | තුළ |
| දිවා රෑ භාවනා කරමින් | සිටින්නට |
| සමිඳුනි ඔබගේ ශ්‍රී දෑතෙහි | වෙළෙන්නට |
| හැකිවෙයි මටත් දෙව්ලොව සිරි | දකින්නට |
| මා බලගතු කරනු මැන දෙව් රජිඳුන්ටම | පිදෙන්නට |
| මහිමය ලොව පුරා සමිඳුනි ඔබේ | බැබළෙන්න |
| දුදනන් දුසිරිතෙන් | ගලවාලන්න |
| දුදනන් බලය සුනුවිසුනුව | හරින්න |
| සමිඳුනි "ශ්‍රී හස්ත" දිගු කළ මැන අප හට | නැගිටින්න |
| දුක, වේදනා, හමුවෙහි මා | නොසැලෙන්න |
| හිස් කළ මැනවි මා හදවත සමිඳුන් | වෙතම |
| නිර්මල සිතින් නව දිවියක් | ලැබෙන්නට |
| සුදතුම් බලයේ කිරණින් මා | නහවන්න |

✍ **ඈන් ප්‍රනාන්දු - කුරු/ මල්ලවපිටිය**

# කලාවෙන් පිළිබිඹු වන ශාස්ත්‍රවන්තයින්ගේ දේව ධර්මය

**පසුගිය සතිය හා සබැඳේ**

ශාස්ත්‍රවන්තයින් රැගෙන ආ මෙකී පඬුරු වලින් හෙළිවන ව්‍යාංගාර්ථයන් මැනැවින් පැහැදිලි කර දීමට මුලින්ම උත්සාහ ගෙන ඇති බව පෙනෙන්නේ දෙවැනි සියවසේ ජීවත් වූ සභා පිතෘ ලියොන්ස්හි ඉරේනියස් (ක්‍රි.ව. 130 - 202) තුමා ය. ඉරේනියස්ගේ අර්ථ කථනය පරිදි මළ සිරුරු ගැල්වීම සඳහා භාවිත කරන ගන්ධ රස තැගි කළේ මෙම බිළිඳා මැරෙන සුළු මිනිසුන්ගේ විමුක්තිය වෙනුවෙන් පණ පුදා වළලනු ලබන බව හැඟවීමටයි. රත්රන් තෑගි කළේ මෙම බිළිඳා සනාතන රාජ්‍යයේ රජු බව හැඟවීමටය. තුවරලා තෑගි කළේ බිළිඳාගේ දේවත්වය ඇඟවීමටය.

ජේසුස් වහන්සේගේ දේව ස්වභාවය පිළිබඳව ඉරේනියස් තුමාත් රූප වන්දනාව ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ජස්ටින් තුමාත් ඉදිරිපත් කළ අදහස් ක්‍රි.ව. 451 දී තුර්කියේ පැවැත්වූ සිව්වන කැල්සිදෝනියාන සමුළුවේ තීරණ වලට බෙහෙවින් බලපෑවේය. එහිදී ප්‍රකාශයට පත් කරන ලද සාධාර්මික විශ්වාස ලක්ෂණය නිර්මාණය කර ගැනීමේ දී මහා ලියෝ පාප් තුමාට (ක්‍රි.ව. 400 - 461) එම අදහස් බලපෑ බව ප්‍රකට කරුණකි. ජේසුස් වහන්සේගේ මානුෂ හා දිව්‍යමය ද්විත්ව ස්වභාවයත්, දාවිත් රාජ ගෝත්‍රය හා ස්වර්ගීය ගෝත්‍රය යන ද්වි රාජ වංශ තුළින් උපතින් හිමිකරගත් රාජ්‍යත්වයත් ඔප්පු කරන සාක්ෂිය වශයෙන් ශාස්ත්‍රවන්තයින්ගේ සිත් හැරීම මහා ලියෝ පාප්තුමා අවධාරණය කරමින් දේශනා කළේ මේ නිසාය.

✍ **රංජිත් නිමල් කුරේරා**

☛ ලබන සතියට

# ජපමාලය

*චිත්‍ර - මර්සලින් හීන්කෙන්ද*
*කතාව - පිලිශියන් කල්දේරා*

07 කොටස



ජන වන්දනාව

# අදමිටුවන් නොවී දමිටුවන් ලෙස දෙවිඳුන් අත්දකිමු

## සාමාන්‍ය සමයේ සයවන ඉරුදින






**ශු. සභා මාතාව අද දින අපට ගෙනහැර දක්වන දේව ප්‍රකාශන අප ජීවිත දෙස නැවත හැරී බැලීමක් කිරීමට අපට ආරාධනා කරනු ලබයි.**

ඒ අන් කිසිවක් නිසා නොව අපගේම ජීවිත ඇදවැටීම් වලදී අප ක්‍රියා කළ යුතු අයුරු පසක්කර ගැන්මටය. මක්නිසාදයත්, අප එදිනෙදා ජීවිතයේ මුහුණ දෙන ප්‍රශ්න ගැටලු අපට විටක බලාපොරොත්තුවක් මෙන්ම ඊටත් වැඩියෙන් බලාපොරොත්තු හා අපේක්ෂාවන් හීන වී ගිය අවාසනාවන්ත අවසානයක් ගෙන එන බැවිනි.

ස්වාමින් වහන්සේ කෙරෙහි අචල විශ්වාසයත්, බලාපොරොත්තුවත් තබන පිරිසක් එම ප්‍රශ්නයන්ට මුහුණ දී ජීවිතයට නව අරුතක් එක් කරන අතර තවත් පිරිසක් හීන වී ගිය විශ්වාසයක් තුළ එම ප්‍රශ්න වලින් මිදී යන විට එම ප්‍රශ්න වලම මියැදෙන එම පිරිසගේ දෝෂාරෝපණ ස්වාමින් වහන්සේ වෙත එසැවීම අරුමයක් නොවේ.

"ඇයි මටම ප්‍රශ්න එන්නේ?" කියමින් දෙවියන් වහන්සේව ප්‍රශ්නයට ලක්කරන සෑම අවස්ථාවකම තමා දෙවිඳුන්ගෙන් දුරස් වී යාම නිතැතින්ම සිදුවන කරුණක් බව අද සමාජ ක්‍රමය දෙස බලන අප සැමට මනා ලෙස වටහා ගත හැකි කරුණකි. මිනිසා දෙවිඳුන්ගෙන් දුරස් වීම එතුමන්ට විරුද්ධ පවුකරුවෙක් බවට පත් වීමයි. ඒ කෙසේ වුවද අප නියම කිතුනුකම නම් ප්‍රශ්න අභියෝග පැමිණි විට ස්වාමින් වහන්සේ කෙරෙහි අචල විශ්වාසයෙන් යුතුව මුහුණ දීම මිස, එතුමන්ගෙන් ඈත් වී විනාශයට යාමද නොවේ. එලෙසම එය දේව අභිප්‍රාය ද නොවේ.

එබැවින් අප ජීවිත වල ප්‍රශ්න කරදර පැමිණෙන විට අප සිත්වල ඔවුන් වහන්සේව ප්‍රශ්නයට නැගීම තුළ එකී වගකීම ඇත්තේ පියාණන් වහන්සේ තුළ නොව අප තුළම බව නිසියාකාරවම වටහා ගැනීමට අප උත්සුක විය යුතුයි. අප ජීවිත වලට දේව ප්‍රඥාව නිසියාකාරව යොදා ගනිමින් දේව කැමැත්තට පිටුපා නොයන දේව කැමැත්ත ඉටු කිරීමට අපට දී තිබෙන ශක්තිය මිනිසා භාවිතයට නොගැනීම නිසා දෙවිඳුන්ගෙන් දුරස් වීමට හේතු සාධකයක් වේ. වඩා කැමති දෙය තෝරා ගන්නට මිනිසාට ඉඩහල ස්වාමින් වහන්සේ එමගින් ඔහුට තම ජීවිතය ද මරණය ද තෝරා ගන්න ඉඩ සලසා ඇත්තේ එම නිදහසත්, ප්‍රඥාවත් නිසියාකාරව දේව වරප්‍රසාදය තුළ ක්‍රියාවට නැංවීමට සියලු මාර්ගයන් විවර කරදීම මගිනි.

ධර්මිෂ්ඨකම වියැකී ගිය, සහෝදර දයාව පිරිහී ගිය සමාජයක "නිදහස" තම වාසියට ගලපා ගනිමින් සිරිත් විරිත් මෙන්ම මනුෂ්‍ය ජීවිතයේ වටිනාකම විනාශයට ගෙන යන මෙවන් සමාජයක කතෝලිකයකු ලෙස "මමත් එයට හවුල්කරුවෙක් ද? යන්න ප්‍රශ්නයට නැගීමට නියම කාලයයි මේ.

ලොව මවා එහි මනහර බව දුටු ඔවුන් වහන්සේ එහි සියල්ලේ පාලනය එතුමන්ගේ සමානකමට මවන ලද මිනිසාට පැවරූ සේක.

දෙවියන් වහන්සේ ලෝකය දුටු ඇසින් ලෝකය දකින්නටත්, එතුමන් දානය කරන ලද නිදහසින් වඩා සුදුසු දෙය තෝරා ගන්නටත්, අදමිටුවන් නොවී දමිටුවන් ලෙස ජීවත් වෙන්නටත් එතුමාණන් අපට ආරාධනා කරයි. මක්නිසාදයත්, පාපයට නැඹුරු වීම දේව කැමැත්ත නොවන්නාසේම මිනිසාගේ වැටීම ද දේව අභිප්‍රාය නොවන බැවිනි.

✍ ජාතික දෙව්සත්හලේ ගොන්සාල්වෙස් සිංහල ආයතනයේ

**ගරු රොෂාන් ප්‍රි. දින්දික සහෝදරතුමා**

---

ගරු හෙන්රි සිල්වා පියතුමා | 05

## අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත



**පසුගිය සතිය හා සබැඳේ**

3. ජේසුස් වහන්සේ පිළිබඳව වූ සුපුවත ප්‍රකාශ කිරීම - ජේසුස් වහන්සේගේ මරණය හා උත්ථානය වෙත විශේෂ අවධානයක් යොමු කෙරේ. (ක්‍රියා 2:32-36, 3:26, 4:8-10, 7:52-56, 13:26-41, 17:3-10)

4. ජුදා ජාතිකයන් අමතා දේශන පැවැත්වීමේ දී විටෙක, ජේසුස් වහන්සේගේ මරණය සම්බන්ධව ජුදා නායකත්වය මත පැවරෙන වගකීම ප්‍රකාශ කිරීමෙන් අනතුරුව, පසුතැවිල්ලට කැඳවීමක් ද ඉදිරිපත් කෙරේ. (ක්‍රියා 2:38-39, 3:19, 7:51, 13:26-28, 17:30).

5. ජනතාව අමතා කරන ලද දේශනයට යහපත් ප්‍රතිචාර මෙන්ම අයහපත් ප්‍රතිචාර ද ඉදිරිපත් වීම (2:41, 4:13-22, 7:57-60, 13:42-43, 17:32-34). අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත තුළ ඉදිරිපත් කෙරෙන මෙම දේශනයන්හි අරමුණ, සුබාරංචිය පිළිබඳව වැඩිදුර කරුණු පහදා දීම ය.

### සාරාංශ ගත කිරීම්

විස්තරයේ වැදගත් කොටසක් සාරාංශ ගතකිරීම් මත ගොඩනැගේ. එය, ප්‍රධාන හා සුළු සාරාංශ ගතකිරීම් වශයෙන් කොටස් දෙකකට වෙන් කළ හැකිය. මෙහි අරමුණ, ධර්මෝපදේශය වන අතර, දෙවියන් වහන්සේ විසින් දෙන ලද පොරොන්දු හා දේව මැදහත්වීම් ආශ්‍රිත ඉශ්රායෙල් ජනතාවගේ අතීත අත්දැකීම් මත මෙන්ම මුල් කිතුනු සභාවේ ආදර්ශවත් ජීවිතය මත ද එය පදනම් වෙයි. එලෙසම, කිතුනු පණිවුඩය ඉදිරිපත් කෙරෙනුයේ දේව අනාවරණයේ ඉදිරි පියවරක් වශයෙනි.

ප්‍රධාන සාරාංශය 2:42-47, 4:32-37, 7:2-50, 8:4-8, 13:16-25, 26:9-11.

සුළු සාරාංශය 1:3, 1:13-14, 3:18, 9:31, 10:36-38, 12:25, 15:7-9, 28:30-31

☛ ලබන සතියට

---

"දෙවියන් වහන්සේ ස්වභාවයෙන්ම දීමට කැමති බැවින් අප ද දීමට ඉගෙන ගැනීම උන්වහන්සේට අවශ්‍ය වේ. "මක්නිසාද දෙවියන් වහන්සේ ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක." දෙවියන් වහන්සේ දෙන අයට ප්‍රේම කරන සේක. එනම් ස්තූතිවන්තව හා සතුටින් යුතුව දෙන්නන්ටය.




**(ගෝනවල - ලූෂන්)**

---

## ජේසු අම්මා



ජේසු අම්මේ ඔබේ ගත සිත
මා වෙනුවෙන් කැප කළාට
ජේසු කුමරු මට දුන්නට
පහන් සිතින් යදිමි ඔබට

රෝස කුසුම ඔබෙ මුහුණයි
බැහැපත්කම ඔබෙ කිරුළයි
අහසෙ දිලෙන තරුව ඔබයි
මිහිමඬලේ අම්ම ඔබයි

කරුණාවයි දෙව් බැතියයි
ජීවිතයේ ඔබට හිමියි
කුමරි මරියා ඔබේ නමයි
අප හදවතේ පැතුම ඔබයි

**ජයන්ත පළිහවඩන - රාගම**

---

## කුමරි මරි මවේ



මෙත් කරුණා ගුණෙන් සපිරි කුමරි මරි මවේ
සිත් සනහා දොසින් තොරව අපව සැන සුවේ
නෙත් පුරවා කඳුල පිසින කලට දුක නිවේ
සෙත සලසා හදට මිහිර නැගෙන්'යුරු මැවේ


කටු කොහොලින් පිරුණු මගක පියවර එසැවූ
පටු මාවත් ගල් කැබලිති පා යුග රිදවූ
දුටු අවහිර නොබා දිවිය සම්දුට කැපවූ
තුටු සිතැතිව දෙව් පුතු තම කුස තුළ රැඳවූ

මුදු ගුණයෙන් සපිරි සෙනෙහස ගඟක් සේ ගැලී
සුදු සුවඳින් මලක සොඳුරු මහිමයෙන් වෙලී
බඳු සඳවත සිහිල සදන ලියක ලෙස දිලී
පිදු සෙනෙහස වැසි දිය සේ ලොවට ඇද හැලී

✍ **කැතරින් ගුණවර්ධන**

---

# යාච්ඤාවන් නැවත නැවත උච්චාරණය කිරීම



**"තවද යාච්ඤා කිරීමේදී විජාතින් මෙන් දිගින් දිගට හිස් වචන නොදොඩන්න. ඔවුන් දොඩන වචන රාශිය නිසා, දෙවියන් වහන්සේ ඔවුන්ට කන් දෙනු ඇතැයි ඔව්හු සිතති" (මතෙව් 6:7).**

මෙම ශුද්ධ ලියවිලි පාඨය උපුටා දක්වන මූලධර්මවාදින්, කතෝලික අප එකම යාච්ඤාව බොහෝ වාරයක් උච්චාරණය කරමින්, ශුද්ධ ලියවිල්ලට හා ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම් වලට බාහිරව කටයුතු කරන බවට අපට චෝදනා කරති. මෙහිදී ඔවුන් විශේෂයෙන් විවේචනයට පමණක් නොව හාස්‍යයට ලක් කරන්නේ ජපමාලයයි. කවදත් දේව මෑණියන්ව අපහාසයට ලක් කරන මොවුහු කතෝලිකයන් ජපමාලය උච්චාරණය කිරීමේදී දිගින් දිගටම එකම යාච්ඤාව නැවත නැවත උච්චාරණය කරමින් ක්‍රිස්තුන් වහන්සේගේ වචන වලට පටහැනිව ක්‍රියා කරන බව පෙන්වා දීමට උත්සාහ කරති.

පළමුවෙන්ම අප තේරුම් ගත යුත්තේ එදා ක්‍රිස්තුන් වහන්සේ චෝදනාවට ලක් කළේ දිගින් දිගටම යාච්ඤා කිරීම නොව, යාච්ඤාවේ දී හිස් වචන යොදා ගැනීමයි. විශේෂයෙන්ම පරිසිවරුන් තමන්ගේ ආගම දහම ස්වකීය ජීවිතයන් හා සමග සම්බන්ධ කර නොගෙන, කුහකකමින් යාච්ඤාවද තමන්ගේ වාසියට හරවාගෙන සිටීම ගැන ක්‍රිස්තුන් වහන්සේ ඔවුනට දොස් නැගූ සේක. ජේසුස් වහන්සේම බොහෝ අවස්ථාවල රැය පහන්වන තුරු යාච්ඤා කළ බව අපට දේව වාක්‍යය පෙන්වා දෙයි. එසේම උන්වහන්සේ පරමණ්ඩල යාච්ඤාව සිය ශ්‍රාවකයින්ට උගන්වා වදාළේ එක් වරක් පමණක් යාච්ඤා කිරීමට නොව, එය ඔවුන්ගේ ජීවිතයේ දෛනික යැදුමක් කරගනු සඳහාය. එසේම ක්‍රිස්තුන් වහන්සේම එකම යාච්ඤාව කිහිප වරක් උච්චාරණය කළ බව අපට ශුද්ධවූ ලියවිල්ලම පෙන්වා දෙයි. "අහෝ පියාණෙනි, හැකි නම් මේ කුසලාන මා කෙරෙන් පහ කළ මැනව. එහෙත් මා කැමති ලෙස නොව ඔබ කැමති ලෙස වේවා"යි තුන් වරක් යාච්ඤා කළ සේක. (මතෙව් 26:39, 42,44). එසේම පුරාණ ගිවිසුමේ විවිධ තැන්වල දකින්නට ලැබෙන ගීත යැදුම් වලදී එකම පදය නැවත නැවත සඳහන් වී ඇත. දිවැසිවර දානියෙල් පොතේ සඳහන් වන දේව මහිමය වර්ණනාව හා ගීතාවලියේ 136 වැනි සංගීතය මේ සඳහා උදාහරණ ලෙස පෙන්වා දිය හැකිය.

පුරාණ ගිවිසුමේ ගිවිසුම් කරඬුව මගින් එදා දෙවියන් වහන්සේ වැඩ සිටීම ජනතාවට සංකේතවත් කළා සේම, අලුත් ගිවිසුම තුළ දෙවිඳුන් දරා සිටීම නිසා දේව මෑණියන් නව ගිවිසුම් කරඬුව සංකේතවත් කරයි. එදා පුරාණ ගිවිසුමේ ජනතාව සතුරන් හා සටන් වැදීමේදී දෙවියන් වහන්සේගේ ශක්තිය තමන් සමඟ බව පසක් කරගත්තේ ගිවිසුම් කරඬුව මගිනි. (ජෝෂුවා 6, ගණන් කථාව 10:35).

අද අලුත් ගිවිසුමේ ජනතාව වන අප දේව මෑණියන් සමඟ ජපමාලය තුළින් ලොවේ පවතින පාපය හා අයහපත පලවා හරින ලෙස දෙව් පියාණන්ට යාච්ඤා කරමු. එළිදරව්ව පොතේ 12 වැනි පරිච්ඡේදයේ සඳහන් වන ස්ත්‍රිය හා මකරා අතර ගැටුම මෙන් අප ද ජපමාලය උච්චාරණය කරමින් අයහපතේ බලවේගයන් පරාජය කළ හැකි ධාර්මික ජීවිතයක පන්නරය ලබමු. ජපමාලය තුළ අප කියවන හැම යැදුමක්ම ශුද්ධ ලියවිල්ලයි. එම නිසා එකම යැදුම කීප වරක් උච්චාරණය කිරීම මගින් තව තවත් ගැඹුරට දේව වචනය මෙනෙහි කිරීමට අවස්ථාව ලැබෙයි.

වැදගත් වන්නේ අප යාච්ඤා කරන කල ඒවා හිස් වචන බවට පත් නොකර හැම මොහොතකම අපගේ වචන හා සිතුවිලි ගැන අවධානයෙන් හා අවබෝධයෙන් යාච්ඤා කිරීමයි. මූලධර්මවාදින් ජපමාලය හැල්ලුවට ලක් කළත්, එය අපගේ ධාර්මික ජීවිතයේ ශක්තිය හා බලාපොරොත්තුව බව මතක තබා ගනිමු.

✍ **අතිගරු ප්‍රැන්සිස් නික්ලස් සේනානායක පියතුමා**

---

## පූජා සතිය
## පෙබරවාරි 16 - 23 දක්වා

| | |
|---|---|
| 16 ඉරිදා | **සාමාන්‍ය සමයේ සයවන ඉරුදින**<br>(කොළ) උපදේශකයා 15:15-20<br>ගීතාවලිය 119:1-2,4-5,17-18,33-34<br>1 කොරින්ති 2:6-10<br>මතෙව් 5:17-37 හෝ 5:20-22,27-28,33-34,37 |
| 17 සඳුදා | **දේවමාතා සේවක නිකායේ ආරම්භක මුනිවරු**<br>(කොළ/සුදු)<br>ජාකොබ් 1:1-11 ගීතා. 119:67,68,71,72,75,76<br>මාක් 8:11-13 |
| 18 අඟහරුවාදා | (සුදු) ජාකොබ් 1:12-18<br>ගීතාවලිය 94:12-15,18-19 මාක් 8:14-21 |
| 19 බදාදා | (කොළ) ජාකොබ් 1:19-27<br>ගීතාවලිය 15:1-5 මාක් 8:22-26 |
| 20 බ්‍රහස්පතින්දා | (කොළ) ජාකොබ් 2:1-9<br>ගීතාවලිය 34:1-6 මාක් 8:27-33 |
| 21 සිකුරාදා | **සා. පීටර් ඩේමියන් මුනි අනුස්මරණය**<br>(කොළ/සුදු) ජාකොබ් 2:14-24,26<br>ගීතාවලිය 112:1-6 මාක් 8:34-9:1 |
| 22 සෙනසුරාදා | **සා. පේදුරු අපෝස්තුළුතුමාගේ ශුද්ධාසනයේ මංගල උළෙල**<br>(කොළ/සුදු) 1 පේදුරු 5:1-4<br>ගීතාවලිය 23:1-6 මතෙව් 16:13-20 |
| 23 ඉරිදා | **සාමාන්‍ය සමයේ සත්වන ඉරුදින**<br>(කොළ) ලෙවී ව්‍යවස්ථාව 19:1-2,17-19<br>ගීතාවලිය 103:1-4,8,10,12-13<br>1 කොරින්ති 3:16-23 මතෙව් 5:38-48 |

ජනතා හඬ




# නමේ වෙනසක් අවශ්‍යයි

**කතුතුමනි,**

බොහෝදුරට හමුදාවක් යනු ආයුධ සන්නද්ධ බලයක්ද සහිතව ස්ථාපිත වූ ආයතනයකි. සමහරවිට අවිහිංසාවෙන් හා ධර්මයෙන් සන්නද්ධ වූ හමුදා ද තිබිය හැක. මහත්මා ගාන්ධි තුමාගේ අවිහිංසාවාදී ව්‍යාපාරය තුළ වුවද පොදු ජනතාව යම්තාක් දුරට ආයුධ බලයෙන්ද සන්නද්ධ විය.

ඒ යටත් විජිත වාදයට හා අධිරාජ්‍ය වාදයට එරෙහිව ජනතාව පෙළ ගස්වා තම රටට නිදහස ලබාගැනීමේ පවිත්‍ර චේතනාවෙනි. එය සාධාරණය. අතිඋතුම් මැල්කම් කාදිනල් තුමන් විසින් මරිය වසර ප්‍රකාශ කොට ඇති මොහොතක මරිය හමුදාව යන නමේද ගෞරවය. බැතිය හා ආදරය ඇඩිව දැනෙන සේ කාලානුරූපව නමේ වෙනසක් කළොත් කාලෝචිත බව මට හැඟේ. එතුමිය අපේ දේව අම්මාය. උදාහරණ ලෙස (කිතු දන පුබුදුව, අසිපා, ල.ක්‍රි.වි., ළ.ද.නි, සෙඩෙක්) යන හද බැඳ ගන්නා නම් කීපයක් ගත හැක. එනිසා මරි මව් බැතිය ඇඩිව දැනෙන සේ 'මරිය හමුදාව' යන නම වෙනුවට සුදුසු ගෞරවාන්විත නමක් යොදන්නට සභාවේ බුද්ධි මණ්ඩලයට ඇරයුම් කර සිටිමි.

**පීටර් කැමිලස් සුභසිංහ**
අඟුණාවිල

# දේව භය ඇත්තනි දේව කරුණාව පතන්න

**කතුතුමනි,**

ජීවමාන ජේසුතුමා ඉපදුනේ ගව ඔරුවක. ගව ඔරුව යනු ගවයන්ට ආහාර දෙන භාජනයයි. ජේසුගේ මේ ඉපදීමේ සැලැස්ම (දේව සැලැස්ම) වූයේ සමිඳාණෝ අන් අයට ආහාරයක් වන බව අනාවරණය කිරීමට නොවේද? අවසානයේ උන්වහන්සේගේ මුළු ජීවිතයම අන් අය සඳහාම අන් අය ගලවා ගැනීම, මුදවා ගැනීම සඳහාම දිවි පුදා උත්ථානය වන තෙක්ම දේව අභිමතයටම අවනත වූවා නේද? ඒත් අද දවසේ විශ්වාසිකයින් හැටියට ඔබ මා කොතැනද? එදා කුඩා ජේසු තුමාට රජවරුන් වැඳ නමස්කාර 200 ගෞරව කළානේ. අද දවසේ ජේසු තුමාගේ උපතට අයත් තෑගි සුවඳ විලවුන් තුවරලා ගන්ධරස, නොවෙයි. උන්වහන්සේ අපෙන් ඉල්ලන්නේ සාමය ප්‍රේමය සහෝදරත්වය, බෙදා ගැනීමයි. ඒත් අදවනවිට අප සිටින්නේ කොතැනද? මේ දැන් මොහොතක් අවදි වෙමු. ඔබ මා සිටින අද තත්ත්වයට.

කිතුනු අපි උන්වහන්සේට අපගේ ජීවිත පවරා දී තිබුනත්, අපේම ජීවිත ප්‍රමුඛතා කොපමණද? සමිඳාණන් වහන්සේව දැක දැකත් නොදැක්කාසේ සිටීම උන්වහන්සේව මගහැර යාමට සහ ජේසු සමිඳුන්ට අප හදවත් දෙවන තුන්වන ස්ථානය දීම, ප්‍රශ්න, අරගල, පීඩාවන්, පාපයන්, වේදනාවන් තුළින් ගොඩඒමට පොරබදන්නේ අප තුළම සිරවී අපේම මගේම තීන්දු තීරණ වලින්ම නේද? ඒනිසා මෙයින් මිදීමට පිපාස හදවත් ඉල්ලා අප හැමට ආරාධනා කරන ජීවමාන සමිඳාණන් වහන්සේ අයිතිකර ගැනීමට වෙහෙසෙමු.

ස්වාමීන් වහන්සේගේ මගපෙන්වීමෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ වෙතට දින දින ළංවන්ට උත්සහ කරමු. උන්වහන්සේ හමුවෙමින් ජීවිත නව උපතක් ලබන්නට පිපාස සිත් හදවත් ඉල්ලා යදිමු. විශ්වාසයේ දිවියක් ගෙවන්නට අදිටන් කරගනිමු. පාවාදීම නමැති මහා නින්දිත ක්‍රියාව ඉදිරිපිට ප්‍රේම කිරීම යන අසීරු අභියෝගය එදා මනුෂ්‍යයකු ලෙස භාරගත් ජීවිතය ජයගත් උත්ථාන වූ ජීවමාන දෙවි මහෝත්තමයාණන්ට හැම මොහොතේම කරුණාව පතමු. පාවාදීම, සිරගත කිරීම, බැඳ තැබීම වැනි පාපි ක්‍රියාවලින් මිදී ජේසුව අත්දකිමු. ජේසු පිහිටයි. ජීවිත වෙනසකට පිපාස වෙමු.

**ඇන්ටනි ස්ටැන්ලි කීර්ති සිරි පෙරේරා**
කුඩාවැව

# කුඩා මීසම් අගෙයි

**කතුතුමනි,**

සැහැල්ලු සරල බව තුරන් වී ජීවිතය බරපතල වෙමින් පවතී. කොතනක බැලුවත් රජයන්නේ හිංසනයයි. මිනිසා දෙවිඳුන් සොයනු වෙනුවට හරසුන් දේ පස්සේ හඹා යයි. දශක කීපයකට පෙර කිතුනු ගම්මානවල තිබුනේ සාන්ත සුන්දර වටපිටාවකි. පල්ලියේ පාසලින් උගත් කිතුනුවා තුළ මනා හික්මීමක් තිබිනි. ගැටලුවකදී පමණක් නොව, ලෙඩ දුකේදී පවා පල්ලියේ පියතුමාගේ පිහිට පැතීම කිතුනුවාගේ සිරිතයි. ගරු පියතුමන්ලාගේ තීන්දු තීරණ ජනතාව හිස්මුදුනින් පිළිත්හ.

කිතුනුවා හා පල්ලිය අතර තිබූ මේ අපූරු බැඳීම දවසින් දවස ගිලිහී යමින් පවතී. මත් රකුසා කිතුනු ගම්මාන ආක්‍රමණය කරමින් සිටී. ගබ්සාව, දික්කසාදය බහුලව වාර්තාවන්නේ කිතුනු පෙදෙස් වලිනි. කටේ කිරි සුවඳ යන්නටත් මත්තෙන් තහනම් ගෙඩිවල රස බලන්නෝ, මුහුකුරා යන්නට පෙර යුග දිවියට පිවිස, එළඹෙන ජීවිත අභියෝගවලට මුහුණ දීමට අසමත්ව දික්කසාදයේ සරණ සොයති. නැතහොත් දිවි තොරකර ගනිති. විදේශගතවීම කිතුනු පවුල තවත් අවුල් කරයි. පවුල් අවුල් කරගෙන නන්නත්තාර වන්නෝ පහසුවෙන්ම මූලධර්මවාදින්ගේ ගොදුරුවෙති.

ඉතින්, මෙබඳු වටපිටාවක් තුළ 'කුඩා මීසම්' බිහිවීම තුළින් හෘදයාංගම ලංවීමකට මඟ පෑදෙන බව 2014.01.19 ප්‍රදීපය කතුවැකිය මගින් අවධාරණය කෙරිණි. එසේම 'කුඩා මීසම්' බිහිකිරීමේ අවශ්‍යතාවය ඇඩි සිහිකැඳවීමකටද ලක් කෙරිනි. සැදැහැවතුන් අලුත් මිසමක් ඉල්ලා හඬක් නැගූ විට 'පියතුමන්ලා නැත' යන්න සභා ශ්‍රේෂ්ඨයින්ගෙ'ද ක්ෂණික පිළිතුර විය. පදවි පියවරුන් නොමැති නම් පැවිදි පියවරුන්ගේ සහය අලුත් මීසම් සඳහා ලබාගැනීම යෝග්‍ය බව මැදහත් සිතින් සඳහන් කරමි. කුඩා මීසම් බිහිවීම 'කුඩා කිතුනු සංඝ' බලවත් කිරීමටද පිටිවහලකි. ජාතිවාදය මදිවාට ආගම් වාදය අවුළුවාලන්නට කැස කවන ඊනියා අන්තවාදීන් කැසකවන අවධියක කිතුනුවා අධ්‍යාත්මිකව බලගැන්වීම යුගයේ අවැසිතාවයකි. එහිදී කුඩා මීසම් අපූරු අත්වැලකි.

**ඩෙනිස් ප්‍රනාන්දු**
කුඩාමඩුවෙරළ

# දේව සේවක තෝමස් කාදිනල් කුරේ හිමි ශුද්ධවරයට එසැවීම දේව කැමැත්ත වන්නේ නම්.........!

**කතුතුමනි,**

ශුද්ධවරයට එසැවීමේ ක්‍රියාවලිය අරඹා ඇති දේවසේවක තෝමස් කාදිනල් කුරේ නි.ම.නි හිමිපාණෝ පිළිබඳව ශ්‍රී ලාංකේය දේව ජනතාව තුළ ඉමහත් ගෞරව භක්තිආදරයක් ඇති බව අවිවාදයෙන් පිළිගත යුතුය.

උන්වහන්සේගේ ශුද්ධවන්ත ජීවිතය පිළිබඳව ඇසුරේ සිටි අයගේ සාක්ෂි රැසකි. මරියෝත්තමාවන් පිළිබඳව උන්වහන්සේ තුළ තිබූ අනුපමේය භක්තිය ගැන ද සාක්ෂි රැසක් තහවුරු වී ඇත. කොළඹ අගරදගුරු පදවි ප්‍රාප්තව සිටිමින් සභාවට කළ මෙහෙවර ප්‍රශංසාත්මකය. වඩාත්ම අගය කටයුතු වන්නේ උන්වහන්සේගේ ජීවිතාදර්ශ යයි. සභා ශ්‍රෙෂ්ඨයකු වශයෙන් පමණක් නොව, පිතෘක සෙනෙහස ඇති දහම් ධරයාණන් කෙනෙකු වශයෙන් උන්වහන්සේගේ ජීවිතය විනිවිද භාවයකින් යුතු වීම ශුද්ධවරයට එසැවීම සඳහා අදාළ ක්‍රියාදාමය ඇරඹීමට ප්‍රබල හේතුවක් වූවා විය හැකිය.

එම ක්‍රියාදාමය ඇරඹීමට බොහෝ වූ හේතු සාධක තිබුණාට කිසිදු සැකයක් නොමැත. සභාව එම හේතුන් සලකා දේව සේවකයාණන් ශුද්ධවරයට එසැවීම ආරම්භ කළාය. එහි ප්‍රථම අදියරේ තිබෙන මෙම ක්‍රියාවලිය ඉදිරි පියවර සඳහා ක්‍රමයෙන් ගමන් කරනු ඇත. ඒ සියල්ල දේව සැලැස්ම පරිදි සිදුවනු නොඅනුමානය.

අප කාගේත් යුතුකම වනුයේ ඒ සඳහා මහෝත්තම දෙවිපියාණන්ට යාච්ඤා කිරීම ය. උන්වහන්සේ ගේ කැමැත්තට අනුව සිදුවිය යුතු දේ සිදුවනු ඇත. දේව සේවක තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් දේශයට දෙවිපියාණන් තිළින කළ උත්කෘෂ්ඨ චරිතය කි. උන්වහන්සේගේ දූරදර්ශී ප්‍රඥාව අද සභාවේ පුනරුදයට හේතුවූ බව නොරහසකි. දේශීය පූජක පරපුරක් රටට දැයට උරුම කර දීමට උන්වහන්සේ ගත් පියවර අද වන විට ඵල දරා ඇත. දෙවන වතිකාන කතිකාවේ තීන්දු තීරණ ක්‍රියාවට නැංවීමට උන්වහන්සේ බාධක හිරිහැර මැද පියවර ගත්හ. දේශීය ඌරුව රැගත් දෙව්මැඳුරු ඉදිවිය. අද ශ්‍රී ලංකාවේ ජාතික සිද්ධස්ථාන අතරින් දේව ජනප්‍රසාදය ලත් තේවත්ත ලංකා අප ස්වාමිදූගේ ජාතික බැසිලිකා සිද්ධස්ථානය උන්වහන්සේගේ දූරදර්ශී ප්‍රඥාවේ ප්‍රතිඵලයක් ලෙසින් නිර්වචනය කිරීම යුක්තියුක්ත වන්නේමය.

සිද්ධස්ථානය වටා ස්ථානගත කර ඇති කන්‍යාරාම සමූහය උන්වහන්සේගේ සැලැස්මකි. හුදු ඝෝෂාකාරී පරිසරයකින් තොරව ඉතා නිශ්චල වාතාවරණයක් පුදබිම තුළ හා අවට අදත් පවතිනුයේ උන්වහන්සේගේ ප්‍රඥාවන්ත සැලැස්මට පිංසිදුවන්නට ය. අදත් ලක්ෂ සංඛ්‍යාත සැදැහැවතුන්ට බැසිලිකා දෙව් විමන ඉදිරිපිට දේව මෙහෙයයන් සඳහා පෙළග ැසෙන්නට, ඇදහිලි කටයුතු කරන්නට වාසනාව උදා වී ඇත්තේ උන්වහන්සේගේ සැලැසුම් සහගත වෘක්ෂලතා රෝපණයට පිංසිදු වන්නටය. මෙවැනි බාහිර ක්‍රියාදාමයන් විශාල සංඛ්‍යාවක් උන්වහන්සේගේ නැණ නුවණ අනුව සිදුවිය.

මේ හැමටත් වඩා අතිශයින් වැදගත් වන්නේ පෙරකී උන්වහන්සේ තුළ විද්‍යමාන වූ අතිශය වැදගත් ශුද්ධවන්ත ජීවිතය බව කිව යුතුමය. දෙව් මහිමොහොත්තමයාණනි! දේව සේවක තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් ශුද්ධවරයට එසැවීම ඔබවහන්සේගේ කැමැත්ත වන්නේ නම් එසේ කළ මැනව. අපි ඔබවහන්සේට ඒ වෙනුවෙන් යාච්ඤා කරමු. මරියෝත්තමාවනි! 2014 ඔබවහන්සේගේ වසර තුළ මෙහි ඉදිරි පියවර තැබීමට අවැසි වරම් සහා ශ්‍රෙෂ්ඨයන්ට දුන මැනව!

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**
මාධ්‍ය ලේකම්
අතිඋතුම් තෝමස් කාදිනල් කුරේ හිමි අනුස්මරණ කමිටුව

# පාසල් දරුවන් මග මරුවාගෙන් රැක ගන්න

**කතුතුමනි,**


රජයේ පාසල් සහ පුද්ගලික ජාත්‍යන්තර පාසල් ප්‍රධාන හා අතුරු මාර්ගවලට මූණලා පිහිටා ඇත. මෙම පාසල් වල ඉගෙනුම සඳහා ප්‍රධාන මාර්ග පද්ධතිය ඔස්සේ ද අතුරු මාර්ග ඔස්සේ ද ළමුන් දහස් ගණනක් උදේ දහවල් ගමන් කරති. කාපට් කර ඇති ඇතැම් ප්‍රධාන මාර්ගවල දෙපැත්ත අයිනේ සුදු ඉරේ ඇතුලත වාහන බොහෝමයක් එම වේලාවේ නවතා ඇති අයුරු නිතර දැකීමට පුළුවන.

පාසල් ආරම්භ වන උදේ හා අවසන් වන දහවලේ ළමුන් අධිකව මෙම මාර්ගවල ගමන් කරති. පාසල් ආරම්භ වන උදේ හා අවසන් වන දහවලේ සුදු ඉර අයිනේ නවතා තිබෙන වාහන නිසා, මෙම මාර්ග වල ළමුන්ට ගමන් කිරීමට සිදුවී ඇත්තේ වාහන එහා මෙහා ඉතා අධික වේගයෙන් යන මාර්ග ඔස්සේය. මෙය ළමුන්ගේ ජීවිත වලට ඉතාම අනතුරුදායක බැව් පෙන්වා දීමට කැමැත්තෙමි. එබැවින් පාසල් ආරම්භවන හා අවසන් වන කාලවලදී මෙම සුදු ඉර අයිනේ වාහන නවත්වාලන්නට ඉඩ නොදෙන ලෙස අදාළ බලධාරින්ගේ කාරුණික අවධානයට යොමු කිරීමට කැමැත්තෙමි.

මෙම ක්‍රමවේදය සඵල වුවොත් සුදු ඉර අයිනෙන් ඇතුලතට බරව නිදහස්ව ළමුන්ට ගමන් කිරීම හැකිවීම සිදුවීම නිසා මාර්ග අනතුරු අවම කරගත හැකි බව පෙන්වා දීමට කැමැත්තෙමි.

ජීවත් වෙනවාට ජීවත් නොවී සැම දෙයක් පිළිබඳවම තීක්ෂණ බුද්ධියෙන් සිතා නිවැරදි අවබෝධයෙන් යුතුව කටයුතු කිරීම මිනිසත්කමේ වටිනාකම පහන් රුකක් සේ සැම දින දිදුලනු ඇත. නොයෙක් නම් අපරීක්ෂාකාරී ක්‍රමවේදය තුළින් වන්දි ගෙවීමට සිදුවෙනු ඒකාන්තය. එවිට අඬා දොඩා නිවැරදි කිරීම් කර කුමටද?

**ඇම්. ඩබ් අනුර ශාන්ත පීරිස්**
හලාවත



# "ඉන්දියන් සාගරයේ මුතු ඇට

## අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධ











වතිකානයේ අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා සමඟ මොහොතක් ගත කිරීමේ දුර්ලභ අවස්ථාව ඉතාලියේ වෙසෙන ශ්‍රී ලාංකීය සංක්‍රමික ජනතාවට රෝමයේ සාන්ත පීතර දෙව්මැඳුරේදී ඉකුත් දා උදා විය.

ඉතාලියේ වෙසෙන 150,000 ක් පමණ වන ලාංකීය ජනතාව වෙනුවෙන් විශේෂ දිනයක් සංවිධානය කිරීම අරබයා කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ශුද්ධෝත්තම පාප් වහන්සේට වසරකට පෙර කර තිබූ යෝජනාවක ප්‍රතිඵලයක් වශයෙන් මෙම වැඩසටහනට වතිකානයේ අවසරය ලැබුණි. එදින පෙරවරු 8.00 සිට ප.ව. 2.00 දක්වා ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් වතිකාන බැසිලිකාව වෙන් කර තිබුණු අතර ලොව සිව් දෙසින් වතිකානයට ඇදෙන සෙසු බැතිමතුන්ට එදින එය වැසී පැවතුණි. සා. පීතර දෙව්මැඳුරේ ශුද්ධවු පේදුරු තුමන්ගේ අනුප්‍රාප්තිකයා වන පාප්තුමාට පමණක් දිව්‍ය පූජාව සිදු කිරීමට අවසර ඇති බැසිලිකාවේ ප්‍රධාන අල්තාරයේ කාදිනල් හිමිපාණන් ද ශ්‍රී ලාංකේය කිතුනු සංක්‍රමිකයන්ට භාරව ක්‍රියා කරන ඇතුගල්පුර රදගුරු අති උතුම් හැරල්ඩ් පෙරේරා හිමිපාණන් ද, බදුල්ල රදගුරු අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු හිමිපාණන් ද, සලාපුර රදගුරු අති උතුම් වැලන්ස් මෙන්දිස් හිමිපාණන් ද සමඟින් සියලු ශ්‍රී ලාංකිකයන්ට දේවාසිරි පතා සිංහල සහ දමිළ බසින් දිව්‍ය පූජාව පැවැත්වීමට වතිකානයෙන් අවසර ලැබුණි. බැතිමතුන් 10,000 කට අසුන් ගත හැකි ලොව විශාලතම දෙව් මැඳුර වන සා. පීතර දෙව්මැඳුර මුළුමනින්ම ශ්‍රී ලාංකිකයන්ගෙන් පිරී ගිය ඉතිහාසයේ ප්‍රථම අවස්ථාව වූ මෙම මොහොතට සහභාගි වීමට අති උතුම් ප්‍රැන්සිස් පාප්තුමා පැමිණියේ දිව්‍ය යාගයෙන් අනතුරුවය. ඉපැරැණි ශිෂ්ටාචාරයකින් සහ බෞද්ධ, හින්දු සභ්‍යත්වයකින් පෝෂණය වී ඇති ශ්‍රී ලංකාව ලෝක සිතියමේ පුංචි තිතක් ලෙස සටහන් වුවද ඕනෑකමින් ඒ දෙස බලන කෙනෙකුට එය පෙනෙන්නේ ගර්භනීය මවක් ලෙසය. "අම්මා මෙලොව ඇති එකම සුවදායක සහ සැනසිලිදායක වචනය බවත්, අම්මා මිය පරලොව ගිය පසුත් අපේ දුක් කරදර වලදී මේ වචනය නිසඟින් අප මුවට නැගෙන බවත් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ සිය දේශනයේ දී පැවසූහ.

තම ආදර මව්බිමද මව් භාෂාවද තම දරු පවුල් ද හැරදා විදේශ රටකට අතවැසි වී ශ්‍රී ලාංකිකයන් ඉතාලියේ ගෙවන දුක්බර හුදකලා දිවිය වීරැ කියාවත් ආර්ථික අර්බුදයත් නිසා දවසින් දවස උග්‍රවෙමින් පවතින බව එතුමා ශුද්ධෝත්තම පියතුමාව පිළිගනිමින් කළ කතාවේ දී සඳහන් කළේය. කතෝලික ජනතාවට මෙලොවේ පමණක් නොව සුරලොවේ ද අම්මා කෙනෙකු සිටින බවත්, ඇය ක්‍රිස්තුන් වහන්සේගේ අම්මා බවත් දෙවන ලෝක සංග්‍රාමයේ දී ජපන් ගුවන් ප්‍රහාර වලට ශ්‍රී ලංකාව ඉලක්ක වී තිබියදී ඇගේ බලවත් මධ්‍යස්ථකම ඉල්ලා අප දිවයින ඇගේ දෑතට බාර කළ බවත් ඇය අප දේශය ආරක්ෂා කර දුන් බවත් ඊට උපහාරයක් වශයෙන් තේවත්තේ ශ්‍රී ලංකා අප ස්වාමිදූ නමින් බැසිලිකා දෙව්මැඳුර ඉදි කළ බවත් කාදිනල් හිමිපාණෝ කෘතඥතාවයෙන් මතක් කර සිටියහ. හැඩයෙන් මෙන්ම ස්වාභාවික සම්පත් වලින් ද ආශිර්වාද ලත් වරප්‍රසාදීය දිවයිනක් වන ශ්‍රී ලංකාද්වීපය "ඉන්දියන් සාගරයේ මුතු ඇටය" ලෙස ලබා ඇති විරුදාවලිය ඊට අතිශයින්ම ඔබින බව ශ්‍රී ලාංකේය ජනතාව අමතමින් අති උතුම් ප්‍රැන්සිස් පාප්තුමා ප්‍රකාශ කළේ ය.

මුතු ඇටය අගනා වස්තුවක් වන සේම එය මුතු බෙල්ලකුගේ කඳුලින් නිර්මාණය වන බව එතුමා මතක් කළේය. "අවාසනාවකට මෙන් ගෙවුණු 30 වසරක මෑත ඉතිහාසය පුරාම වැගුරුණු අපමණ කඳුලින් දේශය තෙත්බත් වූ බවද ශ්‍රී ලංකාවට දැන් කිරීමට ඇති අති දුෂ්කර කාර්යභාරය පහසු එකක් නොවන බවද තමාටම වැටහෙන බවද පාප්තුමා පිළිගත්තේ ය. ඊයේ තමන්ට එදිරිවාදිකම් කළ සතුරා සමඟ අද සුහදව සාකච්ඡා කරමින් පැහැබර හෙට දිනක් සඳහා ඔහු සමඟ සහයෝගයෙන් අත්වැල් බැඳගෙන දේශය ගොඩනංවාලීමේ මෙහෙයට උර දීම දුෂ්කර කර්තව්‍යයක් වුවත් සැබෑ සාමයට ඇති එකම මඟ බලාපොරොත්තු සහගතව එසේ කිරීමට යුහුසුළු වීම බවත් සංවර්ධනය ද සාමය ද අරබයා මිනිස් සන්තානයේ ඇති අප්‍රතිහත වීර්යය පිරිහීමට ඉඩ නොදිය යුතු බවත් පාප් තුමා වැඩිදුරටත් පැවසීය. මිනිස් මට්ටමෙන් මුළුමනින්ම අත්පත් කර ගත නොහැකි සාමය දේව

# ය බැහැදැකීමට මම එන්නෙමි"

## ඩෝත්තම පියතුමා පවසයි






මනාවක් බවත් දෙවන මහා ලෝක
යුද්ධයේ දී ශ්‍රී ලංකාව එවැනි දේව
යාවකින් පිදුම් ලැබූ බවත් තේවත්ත ශ්‍රී
ලංකා අප ස්වාමිදුගේ බැසිලිකාව ඊට
සාක්ෂියක් බවත් ජපන් ආක්‍රමණයෙන්
මුදා දෙන්නැයි වූ බාරය සිදුකර 75
වසරක් සපිරෙන බවත් ශුද්ධෝත්තම
පියතුමා ජනතාවට මතක් කළේය.
ශ්‍රී ලංකාවේ සාමයත් එකමුතුකමත්
උදෙසා යාච්ඤා කිරීමට තම හදවතේ
විශේෂ ඉඩක් ලැබෙන බවට පාප්තුමා
ජනතාවට පොරොන්දු විය.

වැවයි දාගැබයි පන්සලයි
කෝවිලයි ජන ජීවිතයේ කේන්ද්‍රස්ථාන
කරගනිමින් බිහිවූ අව්‍යාජ ලාංකේය
ගැමි සංස්කෘතියේ උත්තුංග වස්තුභාරය
වැඩියෙන්ම රැකී ඇත්තේ මඟ තොටේ
ඔවුන් මුණ ගැසී කතා කරන
භාෂාවේත් ජනවහරේත් ය.

ලන්දේසින්ට බයෙන් හැංගි
හැංගි සිටි සිංහල සහ දෙමළ
කතෝලිකයන්ගේ භක්තිය ආරක්ෂා
කිරීමට ඉන්දියාවේ ගෝව පුරවරයේ
සිට මහ මුහුදෙන් හොරෙන් ඇවිත්
ලංකාවට ගොඩ බැස බෞද්ධ
භික්ෂුන්වහන්සේලාගෙන් ද පන්සලට
සහ කෝවිලට නිතර ඇවිත් ගිය
ජනතාවගෙන් ද සිංහල සහ
දෙමළ භාෂා ඉගෙන ගෙන ගරු
ගොන්සාල්වෙස් පියතුමා අපට ලියා දුන්
සිංහල සහ දෙමළ කිතුනු ගීතිකා වලින්
වතිකානයේ කතෝලික අග නගරයේ
වෙසෙන විශ්ව නියෝජිතයාණන්ගේ
පාද ගැස්මට ලං වීමට අප රටට හැකි
විය. අප ආදරණීය ජනතාව ද ඔවුන්ගේ
මොළකැටි බිළිඳුන් ද රෝගීන් සහ
ආබාධිත දරුවන් ද අභියස නතර වී
ඔවුන්ව එතුමාගේ සුවදායක සිනහවෙන්
සහ ස්පර්ශයෙන් සනහා ජනතාව අමතා
අති උතුම් ප්‍රැන්සිස් පාප්තුමා ඉල්ලා
සිටියේ දේශීය ගීතිකාවක් එතුමාට
ඇසෙන ලෙස ගායනා කරන්නට කියා
ය. කතෝලික නිවෙස්වල ජපමාල
යාච්ඤාවෙන් පසුවද දේව මෑණියන්ගේ
මංගල්‍යයන්හිදී ද මුව පුරා අප ගයන
"මා මව්නී අති ප්‍රේමනීය" යන ගීතිකාව
සිංහලෙන් සහ දෙමළ බසින් මහ
හඬින් ගැයෙන විට මයිකල් ආන්ජලෝ
විසින් සැලසුම් කරන ලද සාන්ත පීතර
මහා දේව මන්දිරය අසුරකින් මඩු
පල්ලිය බවට පත් විය. ජාති ආගම්
භේද නැති මුළු මහත් ලෝකයම එක
ගරු පවුලක් බව පසක් කිරීමට මහත්
පරිශ්‍රමයක් දරමින් සිටින අති උතුම්
ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන්ට
ලැබෙන ජනාදරයත් සමඟ එතුමන්ගේ
දෛනික ජීවිතය අතිශයින් කාර්යබහුල
වෙමින් තිබියදිත් සිය දිවා ආහාර
විවේකය ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන්
කැප කිරීමට උන්වහන්සේ ගත් සොඳුරු
තීරණයට කාදිනල් හිමිපාණෝ සියළු
ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් එතුමාට ඉත
සිතින් තුති පුද කළහ. කුරුස ගසක
දුක් විඳ මිය ගිය ක්‍රිස්තුන් වහන්සේගේ
ආගම කඩුවෙන් සහ තුවක්කුවෙන්
ලංකාවට ගෙන ඒමට යෑමෙන් කිතු
දහම ගැන පෘතුගීසින් අපට දුන් වැරදි
පින්තූරය ප්‍රැන්සිස් පාප්තුමාගේ මුහුණු
මණ්ඩලය දකින විට ඉබේම නිවැරදි
වේ. කඩුවක් අතට ගෙන ඇති නමුත්
එය ආගමකට එරෙහිව ඔසවා නැති
දේව භය ඇති රජ දරුවන් ආණ්ඩු
කළ දේශය සිහිපත් කරන අප ජාතික
සිංහ ධජ වලින් ද සේසත් සහ උඩරට
පහත රට බෙර හඬින් ද වතිකාන නුවර
පිරී ගොස් තිබුණි. එදින බැසිලිකාවට
ඉතාලියේ ඉතා දුර බැහැර පෙදෙස්වල
සිට පැමිණි 12,000 කට අධික ජනතාව
බලාපොරොත්තු වූ ලෙස පාප්තුමා
සමීපයට යෑමට නොහැකි වීම ගැන
දෙව්මැඳුරෙන් පිටතට ආවේ ඇඩි
කණගාටුවකින් බව පෙනුණි.

පෝලන්ත රදගුරු සම්මේලනය
සිය අද්ලිමිනා සංචාරයට සහභාගි
වෙමින් සිටි අතර පාප්තුමා ජනතාව
අතරට ඒමට සිදුවූ ප්‍රමාද දෝෂය
ඊට බලපෑ අතර ඒ පිළිබඳ ලාංකීය
ජනතාවගෙන් එතුමා ප්‍රසිද්ධියේම
සමාව ඉල්ලා සිටියේය. මෙම
අවස්ථාවට ශ්‍රී ලාංකේය ජනතාව
නියෝජනය කරමින් සහභාගි වීමට
සරත් ගුණරත්න, රාජිත සේනාරත්න
සහ දෙව්ශ්‍රිත තිසේරා යන රජයේ
මැති ඇමැතිවරුන් ද දෙස් විදෙස්
තානාපතිවරු ඇතුළු විශාල පිරිසක්
රෝමයට පැමිණ සිටියහ. ඉතාලියේ
වෙසෙන කිතුනු සංක්‍රමිකයන්ගේ ජාතික
උපාධ්‍ය මොන්සිඤ්ඤෝර් නෙවිල්
ජෝ පෙරේරා පියතුමා වැඩසටහන
සංවිධානය කළේය.

**ගරු ඩෙනින්ටන් නික්ලස් සුබසිංහ පියතුමා**





# සිස්ටර් හිරේ වැටිලා!

ප්‍රදීපය කෙටි කතාව

**මෙස**

**නසුරාදා උදේ දහයට පමණ කතිරිනා අක්කාත් ඇනිටා නෝනාත් පීටර් මහත්තයලාගේ නිවෙස දෙසට පැමිණෙමින් සිටියේ පැන්ෂන් නන්දනී මිස්වත් එක්කරගෙනය. මරිය නෝනා පසුවුණේ එළවළු පාත්තිවලට සාත්තු කරමින්ය. ඕෂධී දුව දිවා ආහාරය පිළියෙල කරමින් මුළුතැන්ගෙයි පසු වුනාය. එළවළු පාත්ති අතරින් මතුවුණු මරිය නෝනා "හප්පේ! මේ අමුත්තො දෙන්නට අපේ ගෙදරට එන පාර පෙන්නුවෙ කවුද?" යි අසමින් ඉදිරියට පැමිණියාය.**

"මරිය නෝනෙ, යමුකො ඉස්තෝප්පුවට. මේ දෙන්න තකහනියක් ම මාත් එක්කල ආවෙ අපේ කනට වැටුණු වස නරක ආරංචියක් ගැන විපරම් කරල බලන්ට." කතිරිනා අක්කා කතාව පටන් ගත්තාය.

"විපරම් කරල බලන්ට මෙහාට ගොඩවුණේ?" තැතිගත් ස්වරූපයකින් මුණ රතුකරගත් මරිය නෝනා "මොකක්ද හැබෑටම ඒ ආරංචිය; මේ අපෙන් සිද්ධ වෙච්ච අකටයුත්තක්ද? එහෙම නැත්නම් අපට සිද්ධවෙන්ට යන නැස්පත්තියක්ද?" ප්‍රශ්න කළාය.

"මරිය නෝන ඇන්ටි කලබල වෙන්ට කාරිනෑ, ඇන්ටිලාට කරදරයක් වෙන දෙයක් නෙමෙයි; අපිත් මේ ගැන හරි හැටියට යමක් නිච්චියට ම කියන්ට දන්නෙ නෑ; මේක මේ කනට වැටුණු ආරංචියක් විතරයි; අපි ආවෙ පීටර් මහත්තය ඉන්නව නම් මේකෙ ඇත්ත නැත්ත හරියට දැන ගන්ට"යි ඇනිටා නෝනා පැවසුවාය.

"මේ ඉස්තෝප්පුවෙම එහෙනම් වාඩි වෙමුකො තුන් දෙනාම මං ඕෂධී දුවට කියල එන්නම් තේ වතුර ටිකක් ලෑස්ති කරගෙන එන්ටයි කියල" මුළුතැන්ගෙට ගිය මරිය නෝනා ආපසු පැමිණ ඉස්තෝප්පුවේ පුටුවකට බර වුනාය.

"මොකක් ද නන්දනී මිස් ආරංචිය? කියමුකො බලන්ට හැබැයි පීටර් මහත්තය නම් ගෙදර නෑ."

"මරියනෝනක්කෙ ආරංචිය නම් අපේ සිස්ටර් පබෝදා ගැනයි. අපටනම් හිතා ගන්ටත් අමාරුයි මෙහෙම දෙයක් සිස්ටර්ට වුනාද කියලා! විද්‍යාලෙ දරුවන්ට බොහොම දයාවෙන් කරුණාවෙන් උගන්නපු ධර්මානුකූල ජීවිතයකට හුරු කරවපු ගුරු වෘත්තියට කැපවුණු සිස්ටර් පබෝදාට මොනයම්ම කාලෙ හරි නැස්පැත්තියක් වුනාය කියන එක කොහොම විශ්වාස කරන්ට ද?" පැන්ෂන් නන්දනී මිස් විමතිය පළකළාය.

"මේක නම් අපේ කොන්වන්ට් එකට විතරක් නෙමේ අපි හැමෝගෙම ඔළුවට පාත්වුණු හෙණ ගෙඩියක්. අපි අදහන ආගමටත් විඳින්ට සිද්ධ වුණු නවනංගිරහවක්" ඇනිටා නෝනා වික්ෂෝප වුනාය.

"දුවේ එන්ට, එන්ට, ඔය තේ වතුර ටික මෙහාට ගේන්ට කො" ඕෂධී දූගෙන් ඉල්ලා සිටි මරිය නෝනා තමාගේ කෝප්පයද ගෙන කතාවට හවුල් වුනාය.

"ඇ කතිරිනා අක්කෙ මහ වස ඇබැද්දියක් සිස්ටර් පබෝදාට සිද්ධ වුනා කිව්ව මිසක් ඒ මොකක්ද කියලා තාම හරියට කිව්වේ නෑ නෙමැයි."

"ඒක ඉතින් කටක් ඇරල කොහොම කියන්ට ද? ඇරත් හරියටම සහ සුද්දෙන් නොදැන කියන්ට හොඳත් නෑ නෙමැයි. අපි ආවෙත් මේක ගැන පීටර් මහත්තයගෙන්වත් හරි හැටියට දැන ගන්ටයි. එහෙම නැතුව හිතළු කතාවක් වගේ මේක වමාරලා සිස්ටර් පබෝදට නින්දා අපහාස කරන එක මහ අසමජ්ජාති වැඩක්නේ!" ආරංචිය පළ කිරීමට කතරිනා අක්කා අදිමදි කළාය.

හිස් කෝප්ප ගෙන යෑමට ඉස්තෝප්පුවට පැමිණි ඕෂධී දුව, අන්න තාත්ත එනවා ක්‍රිස්පීනු අංකලුයි සීබට් හාමුයි ඉස්කෝලෙ මහත්තයයි එක්කල" යි ගුරු පාරෙන් ගේ දෙසට හැරුණු කට්ටිය ගැන දැනුම් දුන්නාය. පිරිමි හතර දෙනා ඉස්තෝප්පුවට ගොඩවෙන අතර වාඩිවී හුන් අසුන් වලින් නැගිට ගත් කාන්තාවන් ඔවුන් දෙස බැලුවේ ප්‍රශ්නාර්ථ දහසක් තවරාගත් මුහුණුවලිනි.

"අනේ! මේ ඔයාට ආරංචිද අපේ සිස්ටර් පබෝදාට වින්නැහියක් වෙලා කියලා?" මරිය නෝනා ප්‍රශ්නයක් නැඟුවාය.

"අපිත් මේ ඒක දැනගෙන එන ගමන් තමයි, යමුකො කට්ටියම සාලෙට" පීටර් මහත්තයා අමුත්තන්ට ආරාධනා කරන ගමන් "දුවේ ඕෂධී හදාගෙන එන්ටකෝ අපටත් තේ කෝප්ප හතරක්" යැයි ඉල්ලා සිටියේය.

"පීටර් මහත්තයො සිස්ටර් පබෝදාට සිද්ධ වෙලා තියෙන්නෙ මහ අසාධාරණයක් නේද?" කතිරිනා අක්කා ප්‍රස්ථාවප්‍ථාව ඇරඹුවේ ප්‍රශ්නයකින්.

"ඇ ක්‍රිස්පීනු අන්කල් උන්හිටි ගමන් හෙණගෙඩියක් පාත් වෙන්න වගේ සිද්ධ වුණු දෙයක් නේද මේක? විශ්වාස කරන්ටත්, අමාරුයි අපරාදෙ අහිසංක සිස්ටර්!" ඇනිටා නෝනා කතාවට එක්වුනාය.

"මේ වගේ දේවල් දැන් අරුම පුදුම කාරණා නෙමෙයි. මතක නැද්ද ටික කාලෙකට ඉස්සර වෙලා අර ළදරු නිවාසයකට උන්හිටි ගමන් කඩා පැනලා සිස්ටර් කෙනෙකුව හිර බාරයට ගත්තු හැටි!" පැන්ෂන් නන්දනී මිස් පැරණි සිද්ධිය මතක් කළාය.

"මේ සේරටම වඩා පුදුමයට කාරණේ අපේ කතෝලික ඇඩ්වකේට් මහත්වරුන්ට මේව නොපෙනෙන එකනේ! දැන් නීතිය බල්ලට ගිහිල්ලා නඩු විභාගයක් නැතුව උනත් මිනිසුන්ට දඬුවම් කරන තත්වෙකුයි උදා වෙලා තියෙන්නෙ. මේව දැක දැක නිකම් නොදැක්ක වගේ උඩ බලාගෙන ඉන්න අපිත් වැරදි කාරයෝ!" ඇනිටා නෝනා නෝක්කාඩුවක් කීවාය.

"ඕන් තාත්තෙ නොකීවයි කියන්ට එපා. අපේ සිස්ටර්ට මොන විධියේ හරි අකටයුත්තක් අසාධාරණයක් වෙලා තියෙනව නම් අපි නිකම් ඉන්නෙ නෑ සේරම ළමයින්ව පාරට බස්සවලා පවත්වනව උද්ඝෝෂණයක්" ඕෂධී දුව ආවේගශීලිව කියා සිටියාය.

"මොනවද මේ කට්ටියට වෙලාතියෙන්නෙ අමු කැවිලද? මොනව ගැනද මේ කාන්තා පක්ෂය විරුද්ධව කතා කරන්නෙ?

ඇඩ්වකේට් මහත්තුරු මේකට මොනව කරන්ටද? ඒ මහත්තුරුන්ට දිව්‍යැස් තියෙනවද සිද්ධ වෙන්ට තියෙන දෙයක් කල් ඇතුව දැනගන්ට?" කාන්තා විරෝධයට හේතුව නොදැන ක්‍රිස්පීනු අය්යා ඇසුවේය.

"ඇයි ක්‍රිස්පීනු අය්යලට නැද්ද ආරංචි වුනේ සිස්ටර් පබෝදාට කරල තියෙන අකටයුත්ත?" කතරිනා අක්කා තරහෙන් පුපුරන්නට වුනාය.

"හරි හරි, දැන් තමයි මේ කාන්තා පක්ෂයේ නොසන්සුන් කමට හේතුව තේරුම් ගියේ!" කතාවට එක් වුණේ ඉස්කෝලෙ මහත්තයාය. මේ කාන්තාවන්ට දැනගන්ට ලැබුණු ආරංචිය බොරුවක් නෙමෙයි, සහතික ඇත්තක්!" ඉස්කෝලෙ මහත්තයට තවත් එක වචනයක්වත් කියා ගන්නට ඉඩක් ලැබුණේ නැත.

"මොකක්ද කරල තියෙන වැරැද්ද? පැන්ෂන් නන්දනී මිස් කඩාපැන්නාය.

"වැරැද්ද මොකක්ද? මේ පරණ රබර් සෙරෙප්පු දෙකක් නේ වැරැද්ද!" ඉස්කෝලෙ මහත්තයා සන්සුව කීවේය.

"මොකක්ද ඉස්කෝලෙ මහත්තයෝ ඒ අප්‍රභංසෙ තේරුම පරණ රබර් සෙරෙප්පු දෙකක් හින්ද කොහොමද සිස්ටර්ට නීත්‍යානුකූලව දඬුවම් දෙන්නෙ? ඇනිටා නෝනා ප්‍රශ්න කළාය.

"පරණ රබර් සෙරෙප්පු දෙකක් හොරකම් කරලයි කියල චෝදනා කරලද සිස්ටර්ට දඬුවම් දීල තියෙන්නෙ? එහෙනම් අපට ලැබිල තියෙන ආරංචිය හරි. ඉතින් ඕකටද සිස්ටර් හිරේ වැටිල තියෙන්නෙ?" කතරිනා අක්කාට කෑ ගැසුණේ යටිගිරියෙන්ය.

"හැමෝම සන්සුන් වෙලා මං කියන දේ අහගෙන ඉන්ටකො" යි ඉල්ලා සිටි ඉස්කෝලෙ මහත්තයා ඇති තතු විස්තර කරන්නට විය.

"ඔහේලට අපට දැනගන්නට ලැබිච්ච ආරංචිය බොරුවක් නෙමෙයි. මෙන්න ඇත්ත සිද්ධිය. මීට මාස ගානකට ඉස්සර සිස්ටර් පබෝදාට සමාජ සේවා කටයුත්තක් පැවරිලා තියෙනවා. ඒ හිර ගෙදර කාන්තා අංශයේ රැඳෙවියන්ට උපදේශන පන්තියක් පවත්වන්ට. සිස්ටර් ඉතාම කැමැත්තෙන් ඒ කටයුත්ත බාර අරන් නියමිත දවස්වල නියමිත වෙලාවට හිර ගෙදරට ගිහිල්ලා තමාට පැවරුණු දූත සේවාව ඉෂ්ට කළා. සිස්ටර් කවදත් ජීවත් වුණේ චාම් විදිහට නේ. දාගෙන ගියේ රබර් සෙරෙප්පු දෙකක්. ඊයේ සවස උපදේශන පන්තිය ඇරිල එන ගමනේදී රබර් සෙරෙප්පු ලිස්සලා සිස්ටර් හිරේ වැටිල තියෙනවා. ඕකට තමා සිස්ටර් හිරේ වැටිලා කියන ආරංචිය පැතිරිලා ගිහින් තියෙන්නේ. සිස්ටර්ගෙ රබර් සෙරෙප්පු ලිස්සලා සිස්ටර්ව හිරගේ ඇතුළෙ වැටුණු එක තමයි ඇත්ත කතාව.

"සිස්ටර් දැන් කොහේද ඉන්නෙ?" මරිය නෝනා විමසුවාය.

"සුමානයක් විතර ඉස්පිරිතාලෙ ඉන්ට වෙයි කියල තමයි කියන්නෙ. පිටකොන්දෙ පොඩි ඇමැට්ටියක් විතරලු තියෙන්නෙ" ඉස්කෝලෙ මහත්තයා උත්තර දුන්නේය.

"හරි හරි සිස්ටර් හිරේ වැටිලා! හැබැයි නැවතිල ඉන්නෙ ඉස්පිරිතාලෙ. දඬුවම් ලැබිල තියෙන්නෙ නම් කොන්දට" ක්‍රිස්පීනු අය්යා හැමදෙනාටම සමුදෙමින් යන්නට නැඟිට සිටියේය.

**වෙන්නප්පුවේ පයස් ප්‍රනාන්දු**



වැලිවිට ශාන්ත මරියා දේවස්ථානයට අනුබද්ධිත වැලිවිට සමගි ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය හතරවන වරටත් ඉදිරිපත් කළ ගී ප්‍රසංගය පසුගියදා වැලිවිට මීසම් සේවක ගරු අර්නස්ට් ද මෙල් පියතුමාගේ ප්‍රධානත්වයෙන් සා. මරියා දේවස්ථාන ශාලාවේදී එළිදැක්විනි. එහිදී මියුරි, පැට්‍රිෂියා විලත්ගමුව, ෆිටරිනා ඇනස්ටීන්, අයිරින් කල්දේරා, අයිරින් සිල්වියා, ලැරින් විලත්ගමුව යන මහත්මියන් සංගමයෙ 'සංවිධායක ඩී. ඒ. සුමිත්‍රාරච්චි මහතා සමග නත්තල් ගීතයකට පණදුන් අයුරු.

**වැලිවිට එම්. ජෝ. පාරිස්**

ෆිලීෂන් අබයකෝන්ගේ සුබස 258

## පරිවර්තන අවුල්

ආවරණය නම් අවුරනවා, වසනවා යනුයි. UNCOVER නිරාවරණය, අනාවරණය දෙකම හරි වුවත් අනාවරණය අද වහරේ එළිදරවු කරනවාටය. COVER ප්‍රකට අර්ථය ආවරණය වුවත් COVER පිණිස වන අනිත් තේරුම්වලටත් ආවරණය යෙදීමෙන් අවුලකි. මේ ව්‍යාපෘතිය මුතුරාජවෙල ආවරණය කරයි යනුවෙන් අදහස ක්‍රියාත්මක වන බවකි. COVER ප්‍රවෘත්ති වාර්තා කිරීමටත්, යොදන ඇමරිකානු වහරකි. සමුළුවට පුළුල් මාධ්‍ය ආවරණයක් තිබිණ. සමුළුවට ඉදිවූ සැප මගී ආවරණ කියනවිට ආවරණ නිවැරදිය.

INTELLIGENCE බුද්ධියයි. බුද්ධි පරීක්ෂණය, සාමාන්‍ය බුද්ධිය බලන්න. රහස් තොරතුරු සොයා රැස්කරන රජයේ හෝ හමුදාවේ අංශය INTELLIGENCE DIVISION වේ. චරපුරුෂ/ ඔත්තු/ රහස්‍ය තොරතුරු සැරවැඩි නම් සරලව තොරතුරු අංශයවත් කීමට තිබිණ. මේ අංශවල මාධ්‍ය ප්‍රකාශකයෝ හැමවිට ඔත්තුව මඟහැර ලද තොරතුරක් අනුවයයි කියති.

LAUNCH දියත් කරනවාමෙන් විශේෂ කාර්යයක් පටන් ගන්නවා යනුයි. ප්‍රචාරක වැඩපිළිවෙළක් දියත් කරනවා නම් වැරදිය. BOOK LAUNCH සඳහා එළිදක්වනවා හා දොරට වඩිනවා නම් ඉංග්‍රිසිය යෙදුම්ය. චිත්‍රයට හා සංචාරක කර්මාන්තත් ව්‍යාපාර විය යුතුය. CAMPUS සරසවි බිමට ඇමරිකානු යෙදුමකි. UNIVERSITY සරසවියයි. කැම්පස් එක ළඟ බස්රියෙන් බැසීම හරිය. කැම්පස් එකේ උපාධිය හරි නැත. මේ වචන දෙක HOME - HOUSE CLASS - CLASSROOM වගේය.

මෙවැනි අවුල්වලට හේතුව අංගසම්පූර්ණ ශබ්ද කෝෂයකට යොමු නොවීමය. පළමු තේරුම පමණක් බලා අවස්ථා සම්බන්ධය ගැනවත් නොසිතීමය. එද්දී, යන විට, තවම ගේ හදාගෙන යනවා, තාමත් නානවා, නිදාගෙන සිටියා වාද කර කර සිටියා යන හුරු යෙදුම් සඳහා පාලම තැනෙමින් පවතිනවා, යමින් සිටියදී, වැටෙමින් තිබියදී යන නුහුරු වහර ඇතිවුණේ ඉංග්‍රීසි 'BE' ක්‍රියාව (AM IS ARE ආදිය) සිංහලට පෙරළන බැවිනි. TODAY ආදියත් වචන දෙකක් යයි සිතා ඊයේ දිනයේ, අද දිනත්, හෙට දවසේ යන දිග්ගැසීම් හටගැනේ.

උපසිරැසි හා හඬකැවීම් බහුල බැවින් සිංහල ඉංග්‍රීසි අවබෝධය හීන පරිවර්තකයන්ගේ සේවාව ලැබෙනු පෙනේ. සමහරෙක් ජනවහරේ වටිනා කොටස් ඉවතලති. බොහෝ අය සාමාන්‍ය පෙළට උගත් හරි බස අමතක කරති. ජනමාධ්‍යයේ දකින වැරදි බසට හේතුව විභාගය සමර්ථවීමට උගත් කරුණු වෘත්තියේදී ක්‍රියාත්මක නොකිරීමයි.

# කලාභූෂණ සම්මානයෙන් පිදුම් ලද ප්‍රදීප ලේඛකයා

**1958 දී ඥානාර්ථ ප්‍රදීපයෙහි ළමා පිටුවේ දුරුතු චිත්‍ර තරගයෙන් 16 හැවිරිදි සිසුවකු ලෙස ප්‍රථම ස්ථානය දිනාගත් හලාවත ටෙලස් පී. මිහිඳුකුලසූරිය පසුගියදා පැවති රාජ්‍ය සම්මාන උලෙළේදී 'කලාභූෂණ' සම්මානයෙන් පිදුම් ලැබීය**

මෙරට නාඩගම් කලාවේ පුරෝගාමියා බිහිවූ හලාවත දී උපත ලද ටෙලස් පාසල් වියේ සිටම දක්ෂ චිත්‍ර ශිල්පියකු ලෙස ප්‍රකටව සිටියේය. හලාවත සා. මරියා පාසලෙන් (වර්තමාන රදගුරු එඩ්මන්ඩ් පීරිස් විදුහල) අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත්වීමෙන් පසු ඔහු මාරවිල ජේ. ඩී. එල්. ඊ පෙරේරා මහතාගේ කලායතනයෙන් චිත්‍ර කලාව ප්‍රගුණ කළේය. අනතුරුව රජයේ ලලිත කලායතනයේ තුන් අවුරුදු චිත්‍ර ශිල්පි පාඨමාලාව හැදෑරූ ඔහු කොළඹ අයි. ඒ. එස්. ප්‍රචාරක ආයතනයේ වෙළඳ චිත්‍ර ශිල්පියකු ලෙස දැවුරුද්දක් සේවය කළේය.

1963 දී යතුරු ලේඛකයකු ලෙස රාජ්‍ය සේවයට එක්වූ ටෙලස් සිය සේවා ස්ථානවල විවිධ උත්සව අවස්ථාවන්හිදී චිත්‍ර ශිල්පියකු ලෙස ඒවාට දායක විය. 1968 මහනුවර පැවති 20 වැනි නිදහස් සමරු උලෙළේදී නුවරඑළිය දිස්ත්‍රික්කය ඉදිරිපත් කළ 'ලන්දේසින්ගේ ලංකා ගමන' සංදර්ශන රථය නිර්මාණය කර ප්‍රසාදය දිනාගත්තේය. 1977 දී රසාංජලී කාල සංවිධානයේ මෙහෙයවීමෙන් පැවති නත්තල්පත් චිත්‍ර තරගයෙන් ප්‍රථම ස්ථානය දිනාගත් අතර එම වසරේ කතෝලික මුද්‍රණාලයේ නත්තල් සුබ පැතුම් පතෙහි වූයේ එම චිත්‍රයයි. 1983 දී බතික් කලා ශිල්පිණී ආචාර්ය සුසන්තා කුසුම්සිරි මහත්මියගෙන් බතික් ශිල්පය හැදෑරීය. ඉන්පසු ප්‍රවීන චිත්‍ර ශිල්පි ජයසිරි සේමගේ ගුරුන් වෙතින් චිත්‍ර ශිල්පය ප්‍රගුණ කළ ටෙලස් ඒ මහතාගේ චිත්‍ර ශෛලියට ඇළුම් කරයි. කතෝලික ආගමික



චිත්‍රවලට දේශීයත්වය කැටිකිරීම ඔහුගේ විශේෂත්වයකි. 1987 දී ජුසේවාස් පිය සමරු වසර තේමා කරගෙන ටෙලස් ඇඳි චිත්‍රය සභා ශ්‍රේෂ්ඨයින්ගේ පැසසුමට ලක්විය.

1984 සිට 1988 දක්වා හලාවත පදවි සංස්කෘතික කමිටුවේ වාර්ෂික තරගවලදී චිත්‍ර අංශයෙන් මුල්තැන හිමිවූයේ ඔහුටය. 1988 දී මහනුවර පදිංචියට පැමිණි ටෙලස් පෞරාණික බොදු සිද්ධස්ථානවල ඒවායේ කලාකෘතීන් අධ්‍යයනය කළේය. පිළිමතලාවේ තෙල්දෙණිය රජමහා විහාරයේ බුදු මැඳුරේ මකර තොරණ ඔහුගේ නිර්මාණයකි. එමෙන්ම මහනුවර අම්පිටියේ ටී. ඕ. ආර්. ප්‍රන්සිස්කාන ආරාමයේ පුදසුන බිත්තිය අලංකාර වී ඇත්තේද ටෙලස්ගේ බිතු කැටයමකිනි.

1998 දී කොටි ත්‍රස්තවාදින්ගේ බෝම්බ ප්‍රහාරයෙන් විනාශයට පත් මහනුවර ශ්‍රී දළදා මාලිගයේ පැරණි සිතුවම් කීපයක් ප්‍රතිනිර්මාණය කිරීමට කතෝලික තමා තෝරාගනු ලැබීම භාග්‍යයක් බව ටෙලස් පවසයි. විනාශ වූ චිත්‍ර කීපයක් මෙන්ම ශ්‍රී දළදා මාලිගාවේ වැඩසිටින මාලගේ දොරටුපාල රූප දෙකද, විනාශයට පෙර තිබූ ආකාරයටම ඔහු අතින් ප්‍රතිනිර්මාණය වී ඇත. තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර කාර්යාංශයේ චිත්‍ර ශිල්පින්ගේ සංසදයේ සමාජිකයකු වන ටෙලස්ගේ චිත්‍රවලින් මුද්දර හැඩවූ අවස්ථා රාශියකි.කලාභූෂණ සම්මානය වෙනුවෙන් වූ සිතුවම් හා පැරණි කොඩි නැවත නිර්මාණයෙහි ලා ජාතික මෙහෙවරක් සිදුකළ ප්‍රවීණ හා අති දක්ෂ චිත්‍ර ශිල්පියෙකු ලෙසය. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබීමෙන් පසු පූර්ණ කාලීනව කලා කටයුතුවල යෙදෙන ටෙලස් කලාකරුවා මහනුවර ප්‍රදේශයේ විහාරස්ථාන රැසක බිතු සිතුවම් ප්‍රතිසංස්කරණය හා සුරක්ෂණය සඳහා දායකත්වය සපයා ඇත.

ඔහු මේ දිනවල පේරාදෙණිය ළමා රෝහලේ ළමා චිත්‍ර නිර්මාණයෙහි යෙදී සිටී. නුදුරු අනාගතයේදී ලක්දිව පැරණි කොඩි ප්‍රති නිර්මාණය කර ප්‍රදර්ශනයක් පැවැත්වීමටද ඔහු සූදානම් වෙමින් සිටී.

හලාවත නොයෙලි

මිහිඳුකුලසූරිය හා විවාහ වූ ටෙලස් දෙදරු පියෙකි. මෙයට වසර 55 කට පෙර ප්‍රදීපයේ ළමා පිටුවෙන් සිය කලා ගමන අරඹා කලාභූෂණ රාජ්‍ය සම්මානයෙන් පිදුම් ලද මෙ ප්‍රතිභා සම්පන්න කලාකරුවාට ප්‍රදීපය වෙනුවෙන් සුබ පතමු.

**ලිඩ්වින් කිරිඇල්දෙණිය.**

# සම ලිංගික විවාහය නීති ගත කැරුම අභියෝගයක්

පසුගිය සතියේදී, ස්කොට්ලන්ත පාර්ලිමේන්තුව විසින් එරටේ සම ලිංගික විවාහය නීති ගත කරනු ලැබීය; එසේ කළේ පාර්ලිමේන්තුවේ ඉහළ වැඩි ඡන්දයෙන් මීට ඉහතදී, බ්‍රිතාන්‍ය හා වේල්ස් විසින් ද සමලිංගික විවාහයන් නීති ගත කරනු ලැබීය.

ස්කොට්ලන්ත පාර්ලිමේන්තුව විසින් එලෙස සම ලිංගික විවාහයන් නිති ගත කරනු ලැබීම, කතෝලික සභාවට අභියෝගයක් වනු ඇතැයි එරටේ අගරදගුරු හිමි පිලිප් තර්කාග්ලියා තුමා ප්‍රකාශ කළ සේක. මෙම නීතිය යටතේ ඇතැම් සමලිංගික යුවලයන් විසින් එම විවාහයන් කතෝලික විවාහයන් සේ සිදුකැරුමට ඉල්ලා සිටිනු ඇත; එවැනි ඉල්ලීම් ඉදිරිපත් කැරුම අනිවාර්යයෙන් සිදුවිය හැකි හෙයින්, ස්කොට්ලන්ත කතෝලික සභාව විසින් ගතයුතු ක්‍රියාමාර්ගය පිළිබඳව දැන් දැන්ම කටයුතු සැළැසිය යුතු බැව් ද, ස්කොට්ලන්තයේ රදගුරු මංඩලය විසින් එකඟත්වයට පැමිණ ඇතැයි ද වාර්තා වේ.

අදාළ යුවල විසින් කතෝලික විවාහයන් සිදුකර ගැන්මේ පරමාර්ථයන් නීතිමය ක්‍රියාමාර්ග යන්ට ද යොමු විය හැකි හෙයින්, සභාව විසින් ද නෛතිමය ක්‍රියා මාර්ගයන්ට දැන් දැන්ම යොමුවීම අවශ්‍ය වේ යයි ද කතෝලික පුවත් විසින් වාර්තා කරනු ලැබීය.

# ආගමික නායකයන්ගේ මැදිහත් කමින් දකුණු සුඩානයේ ගැටුම් නවතී

දකුණු සුඩානයේ ආගමික නායකයන්ගේ සමුළුවේ දැඩි උත්සහය හේතුකොට ගෙන, දකුණු සුඩාන රජය හා එරටේ ප්‍රජාතන්ත්‍ර ව්‍යාපාරයට සහයෝගය දක්වනු ලබන ආරක්ෂක හමුදාව අතර ගැටුම් නවතාලීමේ එකඟත්වයක් උදාවී තිබේ. එකඟත්වය සඳහා අත්සන් තැබීම ජනවාරි මස 30 වැනිදා, අදිස් අබ්බා හිදී සිදුවිය.

එම පාර්ශවයන් විසින් සියළු ගැටුම් නවතාලන බවට සහතික කැරුම සිදුවිය. සිරභාරයට ගන්නා ලද යුධ භට පිරිස් මුදා හැරීමට රජය විසින් කැමැත්ත පළ කොට ඇත; රජය හා අනෙකුත් පාර්ශවයන් අතර ගැටුම් ඇති වුවහොත්, අදාළ යුධ කංඩායම මධ්‍යස්ථ භාවයෙන් කටයුතු කිරීමට ද සිය එකඟත්වය පළ කොට තිබේ.

මෙම අති කාලෝචිත හා ඓතිහාසික එකඟත්වය හේතුකොට ගෙන ජන කොටස් අතර සාමය උදාකරලීමේ මංපෙත උදා වී ඇතැයි ද කිතුනු සභා නායක සමුළුවේ සභාපති රදගුරු පරයිද් ප්‍රකාශ කරනු ලැබුවේ, ගෝත්‍රවාදී හා ඥාතිවාදී ගැටුම් නවතා දමා රටේ දිළිඳුභාවය තුරන් කොට සාමය ස්ථාපිත කරනු වස් එකමුතු බවින් ක්‍රියා කළ යුතුය කියාය. දකුණු සුඩානය නව දේශයක් වශයෙන් බිහි වූයේ 2011 වර්ෂයේදීය.

ඔවුන් ඛනිජ තෙල් ව්‍යාපෘතියක් වර්ධනය කරමින් ඉදිරියට යෑමේ කාලය උදා වෙද්දී, කිතුනු දායකත්වය ද ඊට එකතු කරනා බැව් ද කිතුනු නායකයන් විසින් සපථ කරනු ලැබීය.

# ක්‍රීඩාවේ ජවය ඇදැහිල්ල තුළ අත්දැකිය හැක

ඇමෙරිකාන ජාතික අලිස්සා බොර්මේස් නම් ලේඛිකාව විසින් "හොකි ක්‍රීඩාවේ දහම් ගුරු" (CATECHISM OF HOCKEY) නම් විශේෂිත ග්‍රන්ථය පළ කොට ඇත. ලේඛිකාවගේ අරමුණ වී ඇත්තේ, හොකි හා අන් සියළු ක්‍රීඩාවන් හා බැඳි ගුණාංගයන් විසින් ප්‍රබෝධමත් කතෝලික ඇදැහිල්ල ජීවිතයට මං සැළැසීම හුවා දැක්වීමයි.

ලේඛිකාව විසින් ක්‍රීඩා කෞශල්‍යයන්ගෙන් ඇදැහිල්ලේ ජීවිතය සැබෑ අයුරින් ප්‍රබෝධමත් කරගත හැකි ආකාරය මෙලෙසින් ද දක්වා ඇත. "ජයග්‍රහණය කරා යාමට, සෑම ක්‍රීඩක ක්‍රීඩිකාවක් සතු මතයක් හා ඉදිරියක් තිබිය යුතුය; එමෙන්මැ, වරදට පෙළඹීම් හමුවේ, හැම ඇදැහිලි වන්තයකුටම විනයක් හා වරදට නොවැටීමේ සවියක් තිබිය යුතුය; සියළු ක්‍රීඩක ක්‍රීඩිකාවන් අතර නිරන්තරයෙන් පවත්නා ස්ප්‍රීතුවේ බැඳීම්, ඇදැහිල්ලේ ගමනක් මුල් කරගත් ඒ ඒ ඇදැහිළිවන්තයන් අතර ද තිබිය යුතුය; ක්‍රීඩාවේදී මෙන්මැ, ඇදැහිළි ගමනේදී ද, ජය හෝ පරාජය රැගත් ඕනෑම අවස්ථාවකදී, සිය ජනතාව අතර රැඳී සිටීම ද ඇදැහිළි වන්තයන් විසින් කළ යුතුව ඇත. පුහුණු වීම ද, කැපවීම ද හා ජීවිත පැවැත්ම ද අතපසු කරනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන් නිසා සමස්ත ක්‍රීඩාවට සිදුවන හානි ප්‍රකාර, පෞද්ගලික පාපි ජීවිත නිසා පොදු ඇදැහිළි ජීවිත වලට ද අහිතකර බලපෑම් සිදුවන අයුරු ද හුවා දක්වා ඇත."

ලේඛිකාව සිය ග්‍රන්ථයේ මෙලෙසින් ද ප්‍රකාශ කරයි. "ක්‍රීඩා පුහුණු කරුවන් දහම් ගුරුවරුන් හා සමාන වේ. නිවැරදි ලෙස උගන්වමින්, වැරදි හැසිරීම හා පුරුදු ඉවත් කැරුමට මං උගන්වති. එයාකාරයෙන් විශේෂයෙන් මව්පියෝ දූ දරුවන්ට අධ්‍යාත්මික ජීවිත ගත කරනා අයුරු පෙන්වා දෙත්. වැරදි ක්‍රියාමාර්ගයන් අතහැරීම තුළින්, ජීවිත සාර්ථක කරගත හැකි ආකාරයෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ජීවිත ද හුවා දක්වමින් පෙන්වා දෙත්; ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් නිරන්තර පුහුණු කඳවුරු ද පැවැත්වේ; දරු දැරියන් ද අධ්‍යාත්මික පුහුණු කඳවුරු සඳහා වරින් වර යොමු කරවීම ද දෙමාපියන්ගේ යුතුකම වෙනවා. තවද ලෝ ප්‍රකට ක්‍රීඩික ක්‍රීඩිකාවන්ගේ ජීවිත තොරතුරු පොත් පත් මගින් ද වෙනත් කලා මාධ්‍යයන් තුළින් නිරන්තරයෙන් ප්‍රකාශ වෙනවා. ඒ අනුව ද, අධ්‍යාත්මික ජීවිත ගමන තුළින්, සභාවේ සාන්තුවරයන් අතරට පැමිණ ඇති ශුද්ධවර ශුද්ධවරියන්ගේ ජීවිත තොරතුරු සිය දරුවන් වෙත ලඟා කරවීම සිය දෙමාපියන් විසින් කළ යුතු දෙයක් ද වෙනවා. මේ අනුව, ක්‍රීඩාව සතු ගුණාත්මක හැසිරීම් රටාවන් ඔස්සේ, අධ්‍යාත්මික ජීවිතය ද වර්ධනය කර ගැන්මේ මාර්ගයන් කෙරෙහි ද අප මෙහෙයවනු ලබනවා ඇත." එම කතුවරිය විසින් සිය ග්‍රන්ථයේ තවදුරටත් අවධාරණය කරනු ලැබ ඇත.

# දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අග්‍රතම ස්තෝත්‍රයයි



"දිව්‍ය යාගය. ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත පූජා සිහි ගැන්වෙන හුදු මාර්ගයක් පමණක් නොවේ, දිව්‍ය යාගය ක්‍රිස්තුන් වහන්සේගේ දුක් ප්‍රාප්තිය ද, මරණය ද, උත්ථානය ද පිළිබඳ අභිරහස් බෙදා ගැන්මකි." ප්‍රැන්සිස් සුදොතුම් පියා පසුගිය සතියේ මහජන හමුවේදී එලෙසින් ප්‍රකාශ කළ සේක. දෙවියන් වහන්සේගේ ගැළවීමේ කාර්යයේ අග්‍රස්ථානය දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැව් එතුමා තවදුරටත් ප්‍රකාශ කළ සේක. අන්තිම රාත්‍රී භෝජනයේදී ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ වදන් ද, කළකී දෑ ද, දිව්‍ය සත්ප්‍රසාදය තුළ සංගෘහිත වී ඇතැයි ද සුදොතුම් පියා විසින් ප්‍රකාශ කරනු ලැබීය. දිව්‍ය සත්ප්‍රසාදය සභාව තුළ, ජේසුස් වහන්සේගේ වැඩ සිටීම ප්‍රකාශ කරමින්, පියාණන් වහන්සේගේ ප්‍රේමයේ ප්‍රකාශනය. පිළිබිඹු කැරෙන ආදරයේ සමාජ රටාවක් බිහි කැරුම සැමගේ කාර්ය විය යුතු යයි ද තව දුරටත් අවධාරණය කරනු ලැබීය.

# ජේරුසලමේ කිතුනු අපහාසාත්මක කුරුටු බිතු සිතුවම් හෙළා දකී

පසුගිය සතියේ රාත්‍රි කාලයේදී, ජේරුසලමේ කතෝලිකයන් සතු ආයතනයක තාප්පයේ කිතුනු විරෝධි කුරුටු සිතුවම් තිබීමෙන් කතෝලිකයන් පමණක් නොව සියළු කිතුනු සභා පිරිස් මහත් වේදනාවට හා කෝපයට පත්ව සිටිති. මෙවැනි අනාචාර ක්‍රියා සිදුවූ පළමු අවස්ථාව ද මෙය නොවේ.

මෙයට ඉහතදී අවස්ථා කීපයකදී ද, කිතුනුවන්ට අපහාස කැරෙන අශෝභන කුරුටු ගී තාප්ප වල සහ ගොඩනැගිලි බිත්ති වල අඳිමින් අපහාස කරනු ලැබ ඇත. ඊශ්‍රායෙල් රාජ්‍යය ද මෙම අසැබි ක්‍රියාවන් හෙලා දකිනා නමුත්, එවැනි සිද්ධින් යළි යළිත් සිදුවීම වලකනු සඳහා සුදුසු පියවර නොගෙන ඇතැයි කිතුනුවෝ රජයට දොස් පවරති.

මෙම තත්ත්වය හමුවේ, ඊශ්‍රායලීය කිතුනුවෝ, විවිධාකාර විරෝධතාවයන්හි නිරතවීමක් කිතුනුවන්ගෙන් ඉල්ලා සිටිති. ඊශ්‍රායලයේ කිතුනුවන්ගේ පැවැත්ම කෙරෙහි ඊශ්‍රායල් රාජ්‍ය දක්වන අල්ප ප්‍රතිචාරය, මෙවැනි සිද්ධීන් සුළුකොට සැළැකීමෙන් ඔප්පු වන බැව් ද කිතුනුවෝ ප්‍රකාශ කරති. මෙම තත්ත්වය යටතේ ශුද්ධ වූ දේශය ඇතුළු අරාබි කරයේ සාමය සඳහා ලෝ පුරා යැදුම් පැවැත්වීම සඳහා ඉල්ලීම කාලෝචිත යයි ද කතෝලික පුවත් වාර්තා කරයි.

# පැහැරගත් කිතුනු දැරිය ඉස්ලාම් කරවා විවාහ කර ගනී

සමරියා නදීම් පකිස්තාන ජාතික 16 හැවිරිදි කිතුනු කාන්තාවකි; දින කීපයකට ඉහතදී ඈ පාසල් යද්දී, බලෙන් පැහැරගෙන ගොස් ඇත. ඊට පසුව ඈ බලෙන් ඉස්ලාම් දහමට හරවාගෙන සල්ලිකාර ඉඩම් හිමියකු විසින් විවාහ කරගෙන ඇත. මෙය සිදුව ඇත්තේ ලාහෝර් ප්‍රදේශයේය. අසරණ දැරියගේ දෙමාපියන් විසින් පළාතේ කතෝලික සභා නායකයින්ගේ සහාය ද ඇතිව පොලීසිය හා රාජ්‍ය බලධාරීන් වෙත අපරාධය දන්වමින් දැරිය නිදහස් කැරුමට ඉල්ලා ඇතත්, මෙතෙක් කිසිදු යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැත.

දැරියගේ පවුලේ අයද, කිතුනු සංවිධානයන්හී පිරිස් ද දින කීපයක් පුරා උපවාසයෙන් ද සිටිය නමුත්, ඉන් පලක් වී නොමැත. තවදුරටත් කිතුනු අයිතිවාසිකම් හමුවේ, දේශයේ අපරාධ නඩු සංග්‍රහයේ 365 බී කාංඩය යටතේ පැහැරගත් මෙම දැරිය නිදහස් කරනා ලෙසට ඉල්ලමින්, කිතුනු නීතිඥයන් විසින් අධිකරණයේ නඩුවක් ද පවරනු ලැබීය.

පකිස්තානයේ කිතුනු දැරියන්ගේ ජීවිත කෙරෙහි බලපානා අසාධාරණ වාතාවරණය පිළිබඳව ලාහෝරයේ හරුන් ජේම්ස් පියතුමා මෙලෙසින් පවසනු ලැබීය. "පකිස්තානයේ කිතුනු දැරියන්ගේ ජීවිත නිරන්තරයෙන් අනතුරු දායකය. එම දැරියන් පැහැර ගෙන ගොස් ඉස්ලාම් දහමට බලෙන් බඳවාගෙන වනිතාවන් විවාහ කරදීම අති සුලභයි. එසේ සහයට ගනු ලබන දැරියන් වහලියන් සේ ජීවිත ගත කරනා බැව් ද සත්‍යයකි. මෙම පාපිෂ්ට ක්‍රියාදාමය පිළිබඳව පකිස්තාන කතෝලික සභාවේ බළධාරීන්ගේ මැදිහත් වීම ඉල්ලා සිටිනා නමුත්, දැක්වෙන ප්‍රතිචාරයන් නම් තවම අත්දැක නොමැත.

පකිස්තානයේ මුස්ලිම් ජනගහණයෙන් 80% ක් සුන්නි මුස්ලිම් වරු වන අතර, 20% ෂියාස් මුස්ලිම්වරු වෙති. හින්දු භක්තිකයෝ 1.5% ක් වෙති. කිතුනුවෝ 1.6% ක් වෙති.

# දෙවියන් වහන්සේ වැරදිකාර දරුවන් වෙනුවෙන් වැළපෙන පියෙකි

පෙබරවාරි මස 04 වෙනිදා පැවැති දිව්‍ය යාගය අවස්ථාවේදී, අතිඋතුම් ප්‍රැන්සිස් සුදොතුම් පියාණන් විසින් ප්‍රකාශ කරනු ලැබුවේ, දෙවියන් වහන්සේ ඇතැම්විට සිය දරුවන් වෙනුවෙන් හඬා වැළපෙන පියෙක් බවයි.

දවසේ දේව වචනයේ දැක්වෙන පියවරුන් දෙදෙනෙකු ආදර්ශයට ගනිමින් එතුමා මෙලෙස ප්‍රකාශ කළ සේක්.

"අබ්සලෝම්. තමන්ට විරුද්ධව යුධ වැදී සිටියත් දාවිත් රජු සිය පුතා වෙනුවෙන් හඬා වැළපුණේය; ඔහුගේ සොල්දාදුවන් සිතුවේ, යුද්ධයේ අවදානම් තත්ත්වය නිසා රජතුමා හඬනවා කියාය; එහෙත් දාවිත් රජතුමා වැළපුණේ තමන්ට එරෙහිව නැගී සිටි පුතා වෙනුවෙන්ය. මන්දයත්, තමා රජු වුවත්, රාජ්‍ය නායක වුවත්, ප්‍රථමයෙන්මැ ඔහු පියෙකු වන නිසාය.

ජයිරස් නම් පියාගේ චරිතය ද ජේසුස් වහන්සේ විසින් දක්වනු ලැබීය; ජයිරස් ප්‍රධානියකු වුවත්, ජේසුස් වහන්සේගේ දෙපා මුල වැඳ වැටුනේ, පියෙක් වශයෙන් සිය දියණිය සුව කරනා ලෙසට ඉල්ලමිනි; දුවගේ තාත්තා වශයෙන්, සමිඳුන් පා මුල වැඳ වැටීමට ඔහු ලැජ්ජා නොවූ බැව් ද අවධාරණය කරනු ලැබීය. "ප්‍රථමයෙන්මැ දෙව්පියාණන් කෙරෙහි අදහා ගනිමු; මන්දයත් ආදර දෙව්පියාණන් කිසිදාක සිය දරුවන් අත් නොහරිනා සේක; එතුමන් ගෙන් බැහැරව ගියත්, එතුමන් සිය දරුවන් අත්නොහරිනා සේක; තවද ක්‍රිස්තුන් වහන්සේ ජේරුසලම හා ජෙත්සමනිය වෙනුවෙන් ද හඬා වැළපුණ සේක." ප්‍රැන්සිස් සුදොතුම් පියා එලෙසින් ද අවධාරණය කළ සේක.

# සිරියාවේ බොහෝ මුස්ලිම්වරු කිතු තුමන් වෙතට හැරෙති

විදෙස් කිතුනු සේවා සංවිධානයන් විසින් කරැති සමීක්ෂණ අනුව, සිය දේශයේ පවත්නා සිවිල් යුධ ගැටුම් ඔස්සේ, දහස් සංඛ්‍යාත සිරියානු මුස්ලිම්වරුන් කිතු සමිඳුන් පිළිගනිමින් කිතු දහම වැළඳගෙන ඇත.



ජගත් කිතුනු සේවා සංවිධානය විසින් ගැඹුරින් හුවා දක්වා ඇති සත්‍ය තොරතුරු ප්‍රකාර තුර්කිය, ඉරාකය, ලෙබනන් ආදි සිරියාවේ මායිම් දේශයන්ට සංක්‍රමණය වී ඇති මිලියන දෙකකට අධික සරණාගතයන්ගෙන් බහුතරය මුස්ලිම් වන අතර, එම සංඛ්‍යාවන්ගෙන් දහස් ගණනාවක් කිතු දහම වැළඳගෙන ඇත. සරණාගත සිරියානු ජනතාවන්ට ලැබෙන ආධාර උපකාර හේතු කොට ගෙන ඔවුන් කිතු දහම වැළඳගෙන ඇතැයි මතයක් වපුරුවාලීමට ඇතැමුන් යත්න දැරුවත්, ඔවුන් කිතු දහම වැළඳගෙන ඇත්තේ, ක්‍රිස්තුන් වහන්සේව හඳුනා ගැනීම තුළින් යැයි ද ඔප්පු වී ඇත.

ඉරාකයේ ජීවත්වන 10000 ට වැඩි මුස්ලිම් පවුල් ජේසුස් වහන්සේ පිළිගෙන මෑතදි බෞතිස්මය ලබා ඇති බැව් ද වාර්තා වේ. ඉරාකය ඇතැම් බළධාරින් විසින් එම ක්‍රිස්තියානිය වැළඳ ගැනීම අරභයා පරීක්ෂණයන් කරැති නමුත්, කිසිදු ආකාරයේ බලපෑම් හෝ අගති ක්‍රියාකාරකම් සිදුවී නැතැයි ද හෙළි දක්වනු ලැබ ඇත. කොන්දේසි විරහිත සැබෑ ආදරය හා බැතිය දැක්වීම කිතුනු ප්‍රේමයේ සළකුණ වන බැව් ඉතිහාසය පුරා හුවා දක්වනු ලැබ ඇත. ශුද්ධවූ බයිබලයේ උගැන්වීම් තුළින් එම සත්‍ය තහවුරු කරනා බැව් දැක්වේ. ජේසු තුමා ලාසරස්ගේ මරණයේදී ඔහුගේ සොහොයුරියන් වන මාර්තා හා මරියා වැළැඳගෙන වැළපුනේය. එතුමා මරණය ගැන හෝ ජීවිත අනිත්‍යය ගැන හෝ දේශනා කිරීමට ඒ මොහොතේ යත්න දැරුවේ නැත. උන්වහන්සේ ප්‍රථමයෙන්මැ සහෝදරියන්ගේ දුක් සංතාපයන් බෙදා ගැනීම සිදු කළ සේක. මෙම න්‍යාය සිරියානු සර්වාගමිකයන් කෙරෙහි ද හුවා දක්වනු ලැබීම හේතු කොට ගෙන ඔවුන් කිතුනුවන් තුළින් දේවාදරය අත් දැක ජේසුස් වහන්සේ කරා යාමට තීරණය ගෙන ඇති බැව් සක්සුදක් සේ පැහැදිළි වේ.

බැසිල් ෆොන්සේකා විසිනි

# කොළඹ අගරදගුරු පදවියේ කතෝලික පෞද්ගලික පාඨශාලා වල 2015 වසරේ පළමු වන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කර ගැනීම සඳහා අයදුම්පත් නිකුත් කිරීම

**කොළඹ අගරදගුරු පදවියේ කතෝලික පෞද්ගලික පාඨශාලා වල**
**2015 වසරේ පළමු වන ශ්‍රේණියට ළමයින් ඇතුළු කර ගැනීම සඳහා ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීම පහත දැක්වෙන අයුරින් සිදුකෙරේ.**

| | | | |
|---|---|---|---|
| 1. | සිරි කුරුස විද්‍යාලය<br>කළුතර සහ පයාගල ශාඛා විදුහල | මාර්තු 03 සහ 04 වන දින | පෙ.ව 8.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා |
| 2. | සා තෝමස් කතෝලික ජාත්‍යන්තර පාසල - සීදුව | මාර්තු 03 සිට 08 යන දක්වා | පෙ.ව 8.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා |
| 3. | බෝලවලාන ආවේ මරියා විදුහල<br>මීගමුව | මාර්තු 06 සහ 07 යන දිනයන්හිදී | ප.ව. 12.30 සිට ප.ව. 3.00 දක්වා |
| 4. | සා. බ්‍රිජට් කන්‍යාරාමය, කොළඹ 07 | මාර්තු 10 සහ 11 යන දිනයන්හි | පෙ.ව 8.30 සිට පෙ.ව. 9.30 දක්වා |
| 5. | සා. ජෝසප් ශාඛා විදුහල<br>මීගමුව | මාර්තු 10 සිට 14 යන දක්වා | පෙ.ව. 8.30 සිට ප.ව. 1.30 දක්වා |
| 6. | මාරිස්ටෙලා විදුහල - මීගමුව | මාර්තු 15 දින | පෙ.ව 8.00 සිට පෙ.ව. 10.00 දක්වා |
| 7. | සා. බෙනඩික්ට් විදුහල<br>කොටහේන | මාර්තු 15 සහ 22 යන දිනයන්හිදී | පෙ.ව 9.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා |
| 8. | ලොයොලා විදුහල - මීගමුව | මාර්තු 18 වන දින<br><br>මාර්තු 21 වන දින | ප.ව. 2.00 සිට ප.ව. 4.30 දක්වා<br>සියලුම කතෝලික දරුවන් සඳහා<br><br>ප.ව. 2.00 සිට ප.ව. 4.30 දක්වා<br>අන්‍යාගමික දරුවන් සඳහා |
| 9. | සුරදූතික බාලිකා<br>අපේක්ෂාවේ විදුහල - පයාගල | මාර්තු 19 වන දින | පෙ.ව 8.30 සිට ප.ව 1.30 දක්වා |
| 10. | ශුද්ධවු පවුලේ කන්‍යාරාමය<br>කළුතර | මාර්තු 20 සහ 21 යන දිනයන්හි | ප. ව 2.30 සිට ප.ව. 4.30 දක්වා |
| 11. | සා. පීතර ශාඛා විදුහල - උඩුගම්පල | මාර්තු 24, 25 සහ 26 යන දිනයන්හිදී | ප.ව. 2.00 සිට ප.ව. 5.00 දක්වා |
| 12. | සා. පීතර විද්‍යාලය - බම්බලපිටිය | මාර්තු 24, 25, 26, 27 යන දිනයන්හිදී | ප.ව. 2.00 සිට ප.ව. 5.00 දක්වා |
| 13. | සා. ජෝසප් ශාඛා විදුහල<br>වත්තල | මාර්තු 24 සිට 28 දින දක්වා | පෙ.ව 9.00 සිට ප.ව 1.30 දක්වා |
| 14. | ක්‍රිස්තුරාජ ශාඛා විදුහල - වැලිවේරිය | අප්‍රේල් 26 සහ 27 යන දිනයන්හිදී | පෙ.ව. 9.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා |
| 15. | ලොයොලා ශාඛා විදුහල<br>බෝපිටිය | මාර්තු 26, 27 සහ 28 යන දිනයන්හි දී | ප.ව 2.00 සිට ප.ව 4.00 දක්වා |
| 16. | යහපත් එඬේරා<br>කන්‍යාරාමය - කොටහේන | මාර්තු 29 වන දින<br><br>මාර්තු 31 සහ අප්‍රේල් 01 වන දින | පෙ.ව 8.00 සිට පෙ.ව 9.00 දක්වා<br>යහපත් එඬේරා පෙර පාසලේ ශිෂ්‍යාවන් සඳහා,<br>පාසලේ වැඩිමහල් සහෝදරියන්<br>සිටින දරුවන් සඳහා, ආදි ශිෂ්‍ය සංගමයේ<br>සාමාජිකාවන්ගේ දරුවන්,<br>සාමාජිකයන් නොවන ආදි ශිෂ්‍යාවන්ගේ දරුවන්<br>සඳහායි.<br><br>පෙ.ව 8.00 සිට පෙ.ව 9.00 දක්වා<br>සියලුම කතෝලික දරුවන් සඳහා |
| 17. | සා. ජෝසප් විදුහල - මරදාන | මාර්තු 31 වන දින සිට අප්‍රේල් 04 දක්වා දිනයන්හි | පෙ.ව 9.00 සිට ප.ව 2.00 දක්වා |
| 18. | ශු. පවුලේ කන්‍යාරාමය - බම්බලපිටිය | අප්‍රේල් 01 සහ 02 යන දිනයන්හිදී | පෙ.ව 8.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා |
| 19. | සා. ජූඩ් විදුහල - මීගමුව | අප්‍රේල් 03 සහ 04 යන දිනයන්හිදී | පෙ.ව. 8.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා |
| 20. | සා. ලෝරන්ස් කන්‍යාරාමය<br>කොළඹ 06 | අප්‍රේල් 04 වන දින<br><br>අප්‍රේල් 05 වන දින | පෙ.ව. 9.00 සිට පෙ.ව. 11.00 දක්වා<br>සා. ලෝරන්ස් කන්‍යාරාමයේ පෙර පාසලේ<br>කතෝලික දරුවන්ට, ආදි සිසුන්ගේ දරුවන්ට සහ<br>පාසලේ සහෝදරියන් ඉගෙනුම ලබන දරුවන්ට<br><br>පෙ.ව 9.00 සිට ප.ව. 2.00 දක්වා<br>අනෙකුත් සියළුම කතෝලික දරුවන්ට |
| 21. | ද මැසිනොද් විදුහල - කඳාන | අප්‍රේල් 05 සහ 06 යන දිනයන්හිදී | පෙ.ව 8.30 සිට ප.ව 1.30 දක්වා |
| 22. | ආවේ මරියා කන්‍යාරාමය<br>මීගමුව | අප්‍රේල් 09 සහ 10 යන දිනයන්හිදී | පෙ.ව. 8.30 සිට ප.ව. 3.30 දක්වා |
| 23. | සිරි කුරුස විදුහල - ගම්පහ | අප්‍රේල් 10, 11 සහ 12 යන දිනයන්හිදී | පෙ.ව 8.30 සිට මධ්‍යහ්න 12.00 දක්වා |
| 24. | ක්‍රිස්තුරාජ විදුහල - පන්නිපිටිය | අප්‍රේල් 23 සිට 26 දින දක්වා | පෙ.ව 9.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා |
| 25. | ජයලත් අප ස්වාමිදුගේ කන්‍යාරාමය<br>මොරටුව | අප්‍රේල් 24, 25 සහ 26 යන දිනයන්හි | පෙ.ව 9.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා |
| 26. | යහපත් එඬේරාගේ කන්‍යාරාමය - පානදුර | අප්‍රේල් 28 සහ 29 යන දිනයන්හිදී | පෙ.ව 11.00 සිට ප.ව. 1.30 දක්වා |
| 27. | සා. ජෝසප් පිරිමි විදුහල - නුගේගොඩ | මැයි 02 දින සිට 30 වන දින දක්වා<br>(සතියේ දිනයන්හිදී ) | පෙ.ව 10.00 සිට ප.ව 1.30 දක්වා |
| 28. | සා. සෙබස්තියන් විදුහල - මොරටුව | මැයි 05 සිට 09 යන දිනයන්හිදී | පෙ.ව 8.30 සිට මධ්‍යහ්න 12.00 දක්වා |

ඉල්ලුම්පත් ලබා ගැනීම සඳහා පවුල් පොත, දරුවාගේ ක්‍රිස්තියානි සහතිකය සහ උප්පැන්න සහතිකය ද එක් එක් පාසලේ විශේෂ අවශ්‍යතාවය අනුව ඉල්ලන වෙනත් ලිපි ලේඛනද ඉදිරිපත් කරන්න. ඉල්ලුම් කරන සියළුම දරුවන් පෞද්ගලික පාසල් වලට ඇතුලත් කර ගැනීමට ඉඩ නොමැති හෙයින් රජයේ හා රජයට පවරා ගත් කතෝලික පාසල් වලටද අයදුම්පත් යොමුකරන ලෙසට උපදෙස් දෙමි. ඔබගේ දරුවාව පාසලට ඇතුලත් කිරීමට පොරොන්දු වෙමින් මුදල් ඉල්ලන අතරමැදියන්ට අසු නොවන ලෙසට අවවාද කරන අතර එවැනි පුද්ගලයින් පිළිබඳ තොරතුරු ලබා දෙන මෙන් ඉල්ලමි.

**ගරු රංජිත් මදුරාවල පියතුමා - කතෝලික පෞද්ගලික පාසල් සාමාන්‍යාධිකාරී**

විශේෂාංග

# උඳුවප් මිහිරෙන් ඉලුප්පාල්කඩට නෑගමනක් !

## ගමට පැමිණි එකම හා ප්‍රථම කතෝලික පූජකතුමා ගරු ජයලත් බලගල්ල පියතුමායි



මැක්සිමස් රෝයි පෙරේරා හා ශිරාන් මෛත්‍රි සංස්කරණය කළ 'උඳුවප් මිහිර' සඟරාවේ 37 වන වාර්ෂික කලඹ දොරට වැඩුම ජාඇල කලාපීය නාහිමි අතිගරු ශාන්ත කුමාර් වැලිවිට පියතුමාගේ ප්‍රධානත්වයෙන් දෙසැ. 14 දින පැවති අතර ජීවිතයේ කිතුනු ලේඛකයකු එක්වරක් ලැබෙන 'උඳුවප් මිහිර' ප්‍රතිභා උලෙළින් 25 කුට සම්මාන පිදීමට සමගාමීව අනුරාධපුර තලාවේ මැටිල්ඩා අධිකාරම් මහත්මියගේ ඉල්ලීමක් මත දුප්පත් පවුල් 60 කට සරණය වන ප්‍රජා සත්කාරයක් දෙසැම්බර් 22 දින තලාව ඉලුප්පාල්කඩ ග්‍රාමයේදී සිදුකිරීමට හැකිවිය.

තලාවේ සාම සේවයේ මැටිල්ඩා අධිකාරම් මහත්මිය දිනක් දුරකථනයෙන් මා අමතා "මල්ලි අපට යාබද ගමක දුප්පත් ලෙස ජීවත්වන පවුල් හැටක් සිටිනව. ඒ අයට ඇඳුම් පැළඳුම්, පොත්පත් හා වියලි ආහාර ටිකක් සොයාගෙන නෑගම් එන්න යැයි කළ ආරාධනය ගැන ම, හිත මිත්‍ර ශිරාන් මෛත්‍රිගෙන් අපි මේ කටයුත්ත භාරගනිමුදැයි ඇසුවෙමි. ඔහු එකහෙලාම අපි කරමු. අපේ සම්මාන ලබන අයට කථා කරලා ඉල්ලීමක් කරමු යන යෝජනාව විය. සම්මාන ප්‍රතිභා ලේඛකයන් තෝරා ගන්නා ලදුව එම සම්මාන ලාභි 25 දෙනාට අමතරව තව කිහිප දෙනෙකුට මේ සත්කාරයට උදව් වන ලෙස ඇරියුම් කළෙමු. පුදුමයක මහත!

මේ ලිපි ගිය සැණින් දුරකථනය ඔස්සේ හා ලිපි ඔස්සේ තමන්ගේ පරිත්‍යාග ලබාදෙන බවටද වැඩිපිරිසක් කැමැති වූයෙන් සත්කාරයට අත ගැසීමු. දින 14 ක් තුළ මෙම සත්කාරය සඳහා මුදලින් රු. 12000 ක්ද පොත් පත් ආදියෙන් රු. 9000/-ක පමණ ද පනස් දහකට ආසන්න ප්‍රමාණයක අලුත් ඇඳුම් සහ පාවිච්චි කළ හැකි හොඳ වර්ගයේ රෙදි පිළි රාශියක්ද අපට ලබාගැනීමට හැකිවිය. මේ හේතුව නිසා එකතු වූ කිලෝ 115 ක පමණ රෙදි, පොත්, පත් තොගයක් අප ජාඇල දුම්රිය පොළින් තලාව දුම්රිය පොළට දුම්රිය මගින් යවන ලදි. ඒ අපගේ පළමු පියවර හා පැතුම් සඵලවූ ප්‍රථම පියවර විය.

දුගී පවුල්වලට මුදලින් ආධාර කළ අය අතර ගරු ජයලත් බලගල්ල පියතුමා, කඳානේ නිමල් පෙරේරා, යටියන්තොට ඩේමියන් සිල්වා, මීගමුවේ ග්‍රෙගරි සමරසිංහ, ගොඩැල්ලේ එච්. ඒ. සිරිල් පෙරේරා, ජාඇල අබාන්ස් ආයතනයේ කළමනාකාර කේ. ජයමහ, ඇන්තනි ජයලත්, ආර්. ජෝශප්ප්‍රිය මහතුන් ඇතුලු පිරිසක් වූහ. පොත්පත් හා ඇඳුම් සොයාදීමේදී ගරු මැටිල්ඩා ලිලියන් තන්ත්‍රිආරච්චි සොයුරිය, නාවලපිටියේ මිකී ප්‍රනාන්දු මහත්මිය, වැලිවිට ජෝ. පාරිස් මහතා, දංකොටුවේ ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු. මොරටුවේ ඩොරින් පෙරේරා, පේරලන්දේ අජිත් මැන්දිස්, කපුවත්තේ චමිලා අබේගුණවර්ධන , මීගමුවේ රේමන්ඩ් අපෝන්සු, මාරවිල දොන්දීනු ජැන්ස් මහත්මිය, මීගමුවේ රංජන් පල්ලේවල, හිඟුරක්දමන මාරි තෙරෙස් ප්‍රනාන්දු, දිලිනි ජයසේකර, ජේ. එම්. එස්. එස්. ජයසේකර, සුනිතා කොඩිකාර, මැටිල්ඩා අධිකාරම් මහත්ම මහත්මීහූ මෙම සත්කාරයට දායක වූහ.

ජාඇල නගරාධිපති උපාලි අරඹවත්ත මහතා ඇතුලු පිරිසක්ද, ශිරාන් මෛත්‍රි මා ඇතුලු තවත් පිරිසක් ද දුගී ගම්මානයට යාමට සූදානම්ව සිටියත් මටත්, විශ්‍රාමික නාවික නිලධාරි ආර්. ඩී. ජයවර්ධන මහතා, ගරු ජයලත් බලගල්ල පියතුමා, සාම සේවයේ වැටිල්ඩා අධිකාරම් මහත්මිය, සෝමාවති රත්නායක. මහත්මිය ඇතුලු පිරිස්ද සමග මාරි තෙරෙස් ප්‍රනාන්දු මහත්මිය හා එතුමියගේ සොයුරියද තලාවට සේන්දු වූහ.21 වන දින සුන්දර සැන්දෑවක් ගත කළ අප කලින් කතිකා කර ගත් පරිදි අනුරාධපුර රදගුරු අතිඋතුම් නෝබට් මාෂල් අන්ද්‍රාදි හිමිපාණන්ද හමුවීමට 22 උදේ කාලයක්, වෙන්කර ගන්නා ලදි. තලාවේ මීසම් සේවක පියතුමා අසනීපයෙන් සිටි නිසා තලාව සා. ජූඩ් මුනි දේවස්ථානයේ පසුදින උදේ 8.00 දිව්‍ය පූජාව පැවැත්වීම රදගුරුතුමා සිදුකළ අතර උන්වහන්සේ හමුවීමටද මග පාදා ගත්තෙමු.

සුහද පිළිසඳරක යෙදීමට ගරු ජයලත් බලගල්ල පියතුමා, මැටිල්ඩා අධිකාරම් මහත්මිය හා මාත් කැටුව ගිය මිතුරාටද අවස්ථාව ලද අතර උන්වහන්සේ අප විසින් සිදුකරන සත්ක්‍රියාවට ස්තූතිය පලකළ අතර එතුමාගේ පදවියේ ඇති දුෂ්කරතා නිසා පියවරුන්ට හා බැතිමත් ජනයාට හා ළමුන්ට ඇති අඩුපාඩු ගැනද පිළිසඳරේදි අදහස් හුවමාරු විය. කොළඹ ආසන්න දෙව්මැඳුරුවල පියවරුන් හා ජනතාවගේ උදව් ලබා ගෙන මේ ප්‍රදේශයටත් උදව්වක් කිරීමට හැකිනම් යන අදහස් උන්වහන්සේ දැක්වූ අතර ඒ වැදගත් වූ පුවතද අප කිතුනු ජනයා වෙත ලබාදීමට මෙය අවස්ථාවක් කර ගනිමු. අතිඋතුම් නෝබට් අන්ද්‍රාදි රදගුරු තුමාගේ ආශිර්වාදය ද සමග අප කුලියට ගත් ඩිමෝ රථයක නැගී වියලි ආහාර, ඇඳුම් පැළඳුම් පොත්පත් රැගෙන නඩය ඉලුප්පල්කඩ ගමට යන්නට වීමු.

තලාවේ සිට ඇතුලට කිලෝමීටර් 11 පසුකරමින් දක්නට ලැබුණේ සශ්‍රිකව වගාකර ඇති එළවලු පලා, තිරිඟු, මිරිස් ආදි ධාන්‍ය වර්ගවල කොටුය. ඇළදොළ ගංගා පීරා ලස්සන ගම්මානයක් දකින්නට අප දෑස් වලට භාග්‍යය ලැබීමත් සතුටක් විය. ගීතිකාවන් ගයමින් මෙම ඉලුප්පාල්කඩමට ලඟාවෙන්නට පෙර අලිඇතුන් ගෙන් ගහන පෙදෙසක් බවද දැනගන්නට ලැබුණි. එක් රියදුරෙක් උදේ පාන්දරින් පැමිණීමටද නොහැකිබව කීවේ ඒ නිසාය. කෙසේ වුවද අපේ අරමුණ සාක්ෂාත් කරන පිණිස ගමට ඇතුලත්වෙත්ම විහාරස්ථානය අසල කොඩිවැල් දමා අප පිළිගන්නට එම ගම්මුන් පිරිස පෙළි ගැසී සිටියහ. අප වාහනයෙන් බැස්ස විටම ගරු ජයලත් බලගල්ල පියතුමා ඇතුලු පිරිස සාදරයෙන් පිළිගෙන සැමට අසුන් ගන්නට සැලැස්වීය.

විහාරස්ථානයට නොමිලයේ පරිත්‍යාග-ශීලියකුගෙන් ලැබින. සෙටප් එකක් සවිකර තිබෙනු දක්නට විය. ගරු හල්මිල්ලකුලමේ ධම්මසාරි මෙහෙනින් වහන්සේගේ උත්සහයෙන් ගමට පැමිණ තනිවම දායකයන් සමග වැඩකටයුතු කරන බවක් දක්නට වූයෙන් පිරිමි පක්ෂයේ අප කීපදෙනෙකු වුවද, ගැහැනු හා දරුවන්, විශාල පිරිස මෙම ස්ථානයට ලඟා වී සිටිනු දක්නට ලැබීම අපගේ හදවත් යම් විටක වේදනාවක් ගෙන දෙන දසුනක් ද විය.

ඉලුප්පාල්කඩ දහම් පාසල් සේවයේ නියුතු සාමාජිකාවක වන ටී. බී. සිරියාවති මහත්මිය පැමිණ සිටි පිරිස සාදරයෙන් පිළිග න්නා ලදුව ඉලුප්පාල්කඩ ගම්මානයට පැමිණි පළමු හා එකම පියතුමා ඔබවහන්සේ බවත්, අප ගමටද ආදර්ශයක් වන බව පවසා අප පිළිගත්හ. ඉන් අනතුරුව දරු දැරියන් ඉදිරිපත් කළ නැටුම් හා ගීත සංදර්ශනයක් විය. ගරු ජයලත් බලගල්ල පියතුමා කථාකරමින් තලාව මීසමේ වසර එකොළහක සේවයක් කළ ද මා මේ ගමට නොපැමිණි බවද, මා පළමු පියතුමා ලෙසින් පැමිණීම ඔබලා පිළිගැනීම ගැනද මා සතුටු වන බවත්, අප අතර අන්තර් ආගමික සහජීවනය ඔස්සේ මෙවැනි ක්‍රියාකාරකම් සිදුකොට එකමුතුව, සමගිය දියුණුකළ යුතු බවද කීය.

හල්මිල්ලකුලමේ ධම්මසාරි මෙහෙනින් වහන්සේ පියතුමා සමග කථා කළ යුතු බවට කල ඉල්ලීම අනුව පියතුමා සමග පිළිසඳරේ යෙදී උන්වහන්සේගේ පැමිණීම ගැන ස්තූතිවන්ත වන බවත්, මේ සිදුකළ සත්කාරයටද තුති පිදීය.

උඳුවප් මිහිර සංස්කාරක මැක්සිමස් රෝයි පෙරේරා කථාකරමින් අම්මාවරුන් හා දරුවන් දෙස බැලීමේදී තමාගේ අම්මාවද සිහිගන්වමින් හොඳ මගක ගමන් කිරීමට පාර කියා දීම නිසා අප මෙවැනි මෙහෙයක් මේ ගම්මානයේ දරුවන්ට කළ හැකි බවත්, තමාගේ අම්මාවරුන් සමග හොඳින් ජීවත්වීමෙන් ජයග්‍රහණ ලබාගත හැකි බවද කීය.

සාම සේවයේ සෝමාවති රත්නායක මහත්මිය මැටිල්ඩා අධිකාරම් මහත්මියගේ සැමියා සාම සේවය අරඹා බොදුනු කිතුනු සැමටම සේවය කළ බවත්, ඒ මහතා තමාගේ කියා හම්බකළ දෙයක් නොමැති බවත්, ඒ වෙනුවෙන් කැපව ක්‍රියාකරන මැටිල්ඩා අධිකාරම් මහත්මියටද ස්තූති කළේය.

මැටිල්ඩා අධිකාරම් මහත්මිය ජාඇල ප්‍රදේශයේ සිට මෙම ගම්මානයට පැමිණ මෙවැනි සත්කාරයක් කිරීම ගැනද තුති දුන් අතර, මෙම ක්‍රියාදාමය ඉදිරියටත් ගෙනයන ලෙස කීය. විශ්‍රාමික නාවික නිලධාරි ආර්. ඩී. ජයවර්ධන මහතාගේ අධීක්ෂණයට ලක්වූ දරු දැරියන්ගේ කලා කුසලතා ගැන කීවේ මෙසේය. නාට්‍යයක් ඇසුරින් බීමත් තාත්තා කෙනෙක් තම මවටත්, දරුවන්ටත් පීඩා කරමින් මුදල් නාස්ති කරමින් කලකෝලහල කරගන්නා අතර ඒ සඳහා ගමේ ස්වාමින් වහන්සේගේ අනුශාසනා නිසා නිසි මගට යොමුවන කථාවක් රැගත් එම නාට්‍යය කුඩා දරුවන් විසින් වේදිකාගත කෙරුණි. දක්ෂතා ඇති සබකෝලයක් නැති ඉතා දක්ෂ බුද්ධිමත් ළමා පරපුරක් මේ ගම්මානයේ සිටින බව ජයවර්ධන මහතා පැවසීය.

සහල් පරිප්පු සීනි මල්ලක් සැම පවුලකටම බෙදා දෙමින් ඇඳුම් පාර්සලයක්ද හැම පවුලකට බෙදාදීමට ක්‍රියාකළ අතර මෙහෙනින් වහන්සේට සිවුරක් ගැනීමට ගරු ජයලත් බලගල්ල පියතුමා හා නිමල් පෙරේරාගේ දායකත්වයෙන් මුදල් පරිත්‍යාගයක් කිරීමද විශේෂත්වයකි.

**මැක්ෂිමස් රෝයි පෙරේරා**

# පවුල් පරිසරය ප්‍රාණවත් කරන සමීප චරිත

අඹුසැමියන් ලෙස දෙදෙනෙක් නව ජීවිතයක් ආරම්භකර සමාජයට එක්වූ පසු ඒ දෙදෙනාත් සමාජ සංස්ථාවේ තවත් යාවජීව සමාජිකයින් දෙදෙනෙක්ය. ඉන්පසු ඒ දෙදෙනා ජීවත්විය යුත්තේත් සමාජයේමය. එනිසා, ඒ දෙදෙනාට තම අසල්වැසියන් අමතක කර තමන් ගැන පමණක් සිතමින් යහපත් පවුල් පරිසරයක් නිර්මාණය කරගත නොහැක. පළමුව යහපත් පවුල් පරිසරයකට අවශ්‍ය මුල්ම අඩිතාලම දැමීම තමන් වෙසෙන නිවසින්ම පටන්ගත යුතුය. විවාහ වූ දින ආරම්භ කළ අන්‍යෝන්‍ය ආදරය දිනෙන් දින වැඩි වර්ධනය කරගත යුතුය. ඉන්පසු ඒ ආදරය ආත්මාර්ථකාමීත්වයෙන් තොරව අසල්වැසියන් වෙතත් දෝලනය වීමට සැලැස්විය යුතුය. අසල්වැසියන් ලෙස මෙම ලිපියෙන් හඳුන්වනු ලබන අනෙකුත් සමාජීය චරිතයන් කීපය මොනවාදැයි ඉතා සැකවින් අපි දැන් විමසා බළමු.

**දෙමව්පියෝ** - විවාහයක් නිසා ඒ දෙදෙනාට දෙමව්පියන් යුවළ දෙකක් ලැබෙනු ඇත. වෙන්වී ගිය තම දරුවන් දෙදෙනා ගැන නිතරම කල්පනා කරන යුවළ දෙකකි. මේ මව්පිය යුවළ දෙක ක්‍රම ක්‍රමයෙන් මේ යුවළ දෙකේ මව්පිය වරුන් වයස්ගත වන විට ඔවුන් ගැන සොය බැලීම, කිට්ටු සම්බන්ධතාවයක් පවත්වාගෙන යෑම දරුවන්ගේ ණය යුතුකමකි. ඔවුන් රැකබලා ගත යුතුය. ඔවුන්ගෙන් පිදෙන ආශිර්වාදය දරු පවුලකට විශාල ශක්තියක්ය. ඔවුන් සමග කිට්ටු සම්බන්ධතාවය ඔවුන්ගේ ජීවිතාන්තය දක්වාම පවත්වා ගෙන යා යුතුය.

**සහෝදර සහෝදරියෝ** - කෙනෙකුට විපතක් වූ විට ඔහු හෝ ඇයව සොයා පළමුවෙන් ඉදිරියට එන තවත් පාර්ශවයක්ය දෙදෙනාගේ සහෝදර සහෝදරියන්. එය අප නිතරම මතක තබා ගත යුතුය. වතුරට වඩා ලේ උකුවැඩිය යනුවෙන් කියමනක් අප පැරැන්නන් විසින් ප්‍රබන්ධකර ඇත්තේ මේ සහෝදර සහෝදරියන්ගෙ දැඩි සම්බන්ධතාවය උලුප්පා පෙන්වීමටය. එනිසා හැකි උපරිම මට්ටමකින් සහෝදර සහෝදරයින් සමග අඛණ්ඩ සම්බන්ධතාවයක් ගොඩනගා ගෙන එය පවත්වාගෙන යෑමට උත්සුක විය යුතුය. බැඳීම වර්ධනය වන්නේ එවිටය.

**ඥාතීහු** - ඥාතීන් නැතිව සංස්කෘතියක්ද නැතැයි යනුවෙන් කියමනකුත් ඇත. විවාහයක් නිසා අපට සම්බන්ධවන පිරිස බිරිඳකට ඥාතීන් දෙපාර්ශවයකි. පුරුෂයාටත් එසේමය. එනිසා මේ ඥාතීන් පිරිස පවුලකට ඉතාමත් වැදගත් සමාජීය පාර්ශවයක් බව අප අමතක නොකළ යුතුය. උපරිම මට්ටමකින් බැඳීම් පවත්වාගෙන යෑමට වෙර දැරිය යුතුය.

**අසල්වසියෝ** - ලෙඩ දුකේදී මෙන්ම වෙනත් කරදරයකදී කලින්ම පැමිණෙන්නේ මේ අසල්වැසියන්ය. ඔවුන් බොහෝ විට ඔබගේ දර්ශන පථය අවට ජීවත් වෙන පිරිසක් නිසා ඔවුන් සමග ගොඩනගා ගන්නා සුහදතාවය ඉතා වැදගත්ය. කෙසේ හෝ වේවා ආශ්‍රයේදී ප්‍රශ්න ඇති නොවන තත්ත්වයක ආශ්‍රයක් පවත්වාගෙන යෑමට කල්පනාකාරි විය යුතුය. ළඟම සිටින අසල්වාසීන් ඈත සිටින ඥාතීන්ට වඩා අගනේය යන්න අප පැරණි ජනප්‍රවාදයේ එන ප්‍රබන්ධයකි. එය සම්පූර්ණ සත්‍යයක්ය.

**මිත්‍රයෝ** - බොහෝ විට අසල්වැසියන්ටත් වඩා මිත්‍ර පක්ෂය සමග දැඩි සුහදතාවයක් පවත්වාගෙන යන ක්‍රමවේදයක් පොදුවේ අප සමාජය තුළ දක්නට ඇත. වඩාත් හොඳ සමාජ සම්බන්ධතා ගොඩනැගෙන්නේ මිත්‍රත්වයේ තීව්‍රතාවය අනුවය. පෙරකී පරිදි ප්‍රශ්න ඇති නොවන තත්ත්වයක මේ මිත්‍රත්වයද පවත්වාගත යෑමට කල්පනාකාරී විය යුතුය. අසල්වැසියාට වඩා මිත්‍රයා ක්‍රියාකාරීය, ලෙන්ගතුය.

**හාම්පුත්තු සහ සේවකයෝ** - මේ දෙපිරිසම ඔබගේ රැකියා ස්ථානයේදී හමුවන, ආශ්‍රය කරනු ලබන පිරිසකි. දවසේ වැඩි වේලාවක් ඔබ ගතකරන්නේද මේ පිරිස සමගය. ඔවුන් සමඟ ගොඩනගාගන්නා සම්බන්ධතාවය ස්වරූප දෙකකින් පැවැත්විය යුතුය. හාම්පුතුන් යටතේ සේවය කිරීමේදී ඔබගේ වෘත්තීය වගකීම් සහ යුතුකම් හොඳින් ඉටු කිරීමෙන් වඩාත් සුහද සම්බන්ධතාවයක් ගොඩනගා ගත හැකිය. යටත් සේවකයින් බොහෝ අවස්ථාවන්වල ඔබගේ සැම දුර්වලකමක්ම ඔවුන් ප්‍රසිද්ධියේ සාකච්ඡා කිරීමේ පොදු ප්‍රවනතාවයක් ඔවුන් අතරේ පවතින නිසා ඔවුන් සමග සම්බන්ධතාවයේදී විශේෂයෙන් ප්‍රවේසම් විය යුතුය. එහෙත් ඔවුන් කොන්නොකළ යුතු ප්‍රායෝගික උපකාර ලබාගත හැකි පිරිසක් බව අමතක නොකරන්න.

**ගුරුවරුන්** - ඔබට ඉගැන්වූ, ඔබ අද සිටින ඒ තත්ත්වයට පැමිණීමට තරම් මහෝපකාරිවූ අධ්‍යාපන රටාවක් ඔබට ලබාදුන් ගුරුභවතුන්-ගෙන් සමහරෙක් මේ වනවිටත් ජීවතුන් අතර සිටිත් නම් ඔවුන් සමග ද ගෞරවණීය සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම ඉතාමත් වැදගත්ය. කිසියම් ගැටලුවක් නිරාකරණය කරගැනීමට අවශ්‍ය වු විටක මේ ගුරුභවතුන් දෙසත් හැරී බලන්න. වයෝවෘද්ධ මේ අයගේ ජීවිතාවබෝධය සහ පරිණත දැනීම බොහෝ අවස්ථාවලදි ඔබ වැන්නන්ට ඉතාමත් වැදගත් වනු ඇත.

**ආගමික නායකයෝ** – තමන් අදහන ආගමට අදාල පූජ්‍ය පක්ෂය සමග කිට්ටු සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම ඉතාමත් කාලෝචිත පියවරක් බැව් අවධාරණය කරනු කැමැත්තෙමි. විවිධ ආගමික සමිති සමාගම් වලට බැඳී කරනු ලබන සේවාවන් කරනකොට ගෙන ඉතා වැදගත් සමාජ සම්බන්ධතාවයක් ඉබේම ගොඩ නැගෙනු ඇත. පවුලේ දූ දරුවන් සමග ඉඳහිට හෝ ආගමික නායකයින් මුණගැසී අදහස් බෙදාගැනීම මෙන්ම උපදෙස් ලබාගැනීමත් ඉතාමත් ප්‍රයෝජනවත්ය. පූජ්‍ය පක්ෂයේ සුබ පැතුම් මෙන්ම දේවාශිර්වාදයන්ද, පවුලකට වැදගත් බව අමුතුවෙන් කිව යුතු නොවේ.

සුහද සමාජ ආශ්‍රයක් සෑම පවුලකටම ඉතාමත් අත්‍යවශ්‍ය ජීවිත ක්‍රමවේදයකි. ඒ සඳහා අත්‍යවශ්‍ය සමාජ සංස්ථා කීපයකටම අපි සම්බන්ධවිය යුතුය. ඒ ව්‍යුහයන් මොනවාදැයි ඉහතින් සාකච්ඡා කළෙමි. අවශ්‍ය සම්බන්ධතාවයන් ගොඩනගා ගැනීමේ ක්‍රමවේදයන් මොනවාදැයි සොයාබලා ස්ථාපිත කරගැනීම ඒ ඒ පුද්ගලයා සතු ශිල්පීය දක්ෂතාවයක්ය යන්න අවසාන වශයෙන් අවධාරණය කරනු කැමැත්තෙමි.

**සිරිල් අමරතුංග**
බෝලවලාන

දැල්වෙන පහන්

# සමිඳු දහම් කෙත අස්වැද්දූ සදාසරණ සොයුරියෝ...

"නුඹේ මව්බිම ද, නුඹේ නෑදෑයන් ද නුඹේ පියාගේ ගෘහය ද අත්හැර දමා මා පෙන්වන්නට යන දේශයට යන්න." (උත්පත්ති 12:1)

දෙවිඳු හඬට සවන් දී තමාගේ මව්බිමට ද, නෑදෑ හිතවතුන් ද, අපරදිග සංස්කෘතිය ද අතහැර මහා සයුර තරණය කරමින් තමන්ගේ සංස්කෘතියට බෙහෙවින් වෙනස් වූ නොදන්නා දේශයක් වන ශ්‍රී ලංකා ධරණී තලයට 1929 අප්‍රේල් මස 22 වන දින බෙල්ජියම් ජාතික සදාසරණ කන්‍යා සොයුරියෝ පා තැබූහ.

එවකට කොළඹ පදවියේ අගරදගුරු අතිඋතුම් කුඩේ (නි.ම.නි) හිමිපාණන්ගේ ඇරයුම මත මෙම සොයුරියෝ රාගම ලය රෝහලේ සේවය ආරම්භ කළහ. එදා ලාංකික සමාජයේ ක්ෂය රෝගය භයානක සුව නොවන, බෝවන රෝගයක් වූ අතර එයින් පීඩා විඳින රෝගීන්ට සුවය සිහිනයක් පමණක් වූ අවධියක මෙම සදාසරණ සොයුරියෝ එම අවදානම නොතකා රෝහල් සේවාව සඳහා කැපවූහ. තම දිවිය මෙම අසරණ රෝගීන් වෙනුවෙන් කැප කරමින් ආදරය හා කරුණාව තුළ ඔවුනට සදාසරණයක් වන්නට නිරන්තරයෙන්ම වෙහෙසෙන ලදි.

ඉන්පසු කොළඹ පදවියේ අගරදගුරු බවට පත් වූ අති උතුම් මාකෝ (Marquo) නි.ම.නි හිමිපාණන්ගේ අදහස් අනුව කතෝලික අන්ධ, ගොළු බිහිරි දරුවනට අධ්‍යාපනය ලබා දීම සඳහා රාගම දේවස්ථානයට පිටුපස භූමියේ සාන්ත ජෝශප් අන්ධ බිහිරි පාසලක් ආරම්භ කිරීම මෙම සොයුරියන්ගේ සේවය තවත් පුළුල් වීමක් ලෙස ද මෙහිලා සඳහන් කළ හැකිය. 1935 මෙම අන්ධ ගොළු බිහිරි පාසල ආරම්භ කරන ලදි.

"අන් අයට පෙනීම ද, බිහිරි අයට ඇසීම ද" යන සමිඳු වදන් යථාර්ථයක් බවට පත් විය. දේව කැඳවීමේ ධජය ලංකා දීපය තුළ රෝපණය කිරීමේ අරමුණින් 1954 වර්ෂයේ මීගමුව, පෙරියමුල්ල ග්‍රාමයේ නව ආධුනික නිවහනක් අරඹන ලදි. සමිඳු සේවය සඳහා සදාසරණ සොයුරියක් වන්නට දෙවිඳුන්ගේ පළමු ආරාධනය හිමි වූයේ මර්සි පෙරේරා නම් තරුණියටය. ඇය නිකායේ පළමු ශ්‍රී ලාංකික සොයුරියයි. එතැන් පටන් දෙවිඳු හඬට සවන් දුන් ශ්‍රී ලාංකික තරුණියන් දේව සේවය සඳහා සදාසරණ නිකායට ඇතුළත් වෙන ලදි.

එදා පැවති රජයේ දේශපාලන හේතූන් මත රෝහල්වල සේවය කළ සියළුම මිෂනාරි පැවිදි සොයුරියන්ට ලංකාවෙන් සමුගන්න සිදු වූ නිසා ලාංකික සොයුරියන්ට සදාසරණ පැවිදි නිකාය ඉදිරියට ගෙන යාමේ බාරදූර වගකීම හිමි විය. ඒ අනුව 1965 වර්ෂයේ ප්‍රථම ශ්‍රී ලාංකික ප්‍රාදේශාධිපතිනිය වූයේ ගරු මරිනා පෙරේරා පැවිදි සොයුරියයි.

සදාසරණ නිකායේ නිර්මාතෘවරිය වන්නේ ජොහානා ප්‍රැන්සිස්කා මැක්සිමිලියානා ආමර්ලින්ක් වේ. ඇය 1733 ඔක්තෝබර් මස 23 දින බෙල්ජියමේ කුට්රේ නුවර වංශවත් පවුලක උපත ලැබුවාය. අප නිර්මාතෘවරිය ඇයගේ පියාගෙන් හා මවගෙන් ලද මහා පෞරුෂත්වයත්, නායකත්ව ගුණාංගත්, විනය හා පිළිවෙළත් හා සැබෑ අධ්‍යාත්මිකත්වයත් සිය පවුලෙන් උරුම කර ගත්තාය. ඇයගේ අධ්‍යාත්මය පෝෂණය කළ සාන්තුවරයන් වූයේ, "අසීසියේ ප්‍රැන්සිස් තුමා, ශු. ජුවාම් තුමා, අවිලාවේ තෙරේසා මව්තුමිය සහ අල්පොන්සස් ගිගෝරි යන අයයි.

"දෙවිඳුන් තුළ මට සියල්ල කළ හැකිය" යන ශු. පාවුළුතුමාගේ වදන් සිත්හි දරා දෙවිඳු හඬට නිරන්තරයෙන්ම සවන් දෙන්නට වූවාය.

මෙම යුගය ප්‍රංශ විප්ලවයත් සමග දේශපාලන, ආර්ථික, සමාජ, අධ්‍යාත්මික අරගලයන් තුළ සැබෑ නිදහස, සමානාත්මතාවය හා සහෝදරත්වය සඳහා අරගල කළ කාල පරිච්ඡේදයක් විය. එදා තාපසාරාම හා පල්ලිය පවා දිළිඳුන් නඟන අඳෝනාවන්ට නෑසූ කන් ඇතිවැ සිටියහ. පීඩිත ජනයාගේ හඬට, දුක් අඳෝනාවන්ට පිළිතුරක් වන්නට ජොහානා ආමර්ලින්ක් තරුණියට ශු. බයිබලයේ ජෙරමියා දිවැසිවරයාගේ මේ වදන් පැහැදිලි හා ස්ථිරව දෝංකාර දෙන්නට විය. "උදුරන්නට හා කඩාදමන්නටත්, නැති කරන්නට හා හෙළා මන්නටත්, ගොඩනගන්නට හා සිටුවන්නටත් ජාතීන් හා රාජ්‍යයන් කෙරෙහි නුඹට බලය දී අද මම නුඹ පත් කළෙමි" (ජෙරමියා 1:10)

1768 දී සාමාජිකාවන් 12 දෙනෙකු තෝරාගෙන දිළිඳුන්ට සේවය කිරීමේ දිවැසි කාර්යය ආරම්භ කරන ලදි. "ඔබ සතු සියල්ල විකුණා දිළිඳුන්ට දෙන්න" (මතෙව් 19:21). යන වදන් අනුව ආමර්ලින්ක් සතු සියල්ලම පරිත්‍යාග කරන්නට තරම් ඇය එඩිතර වූවාය. ජන්මයෙන් ලද මේ සියළුම දායාද දිළින්දන් නඟා සිටුවීම සඳහා යොදමින් "දයාවේ නිවස්නක්" ආරම්භ කරන ලදි.



ඇයගේ කරිස්මාව වූයේ "දිව්‍ය සංරක්ෂණය තුළ විශ්වාසය තබමින් ධෛර්යෙන් හා සරල බවින් දෙවිඳුන්ගේ සානුකම්පිත ආදරය තුළ ජීවත් වීම. ආමර්ලින්ක් මව්තුමියගේ කරිස්මාව අනුගමනය කරමින් අද සදාසරණ සොයුරියන් වන අපගේ දර්ශනය වන්නේ,

"අධ්‍යාත්මික බලයෙන් පෝෂණය වී නව මැවිල්ලේ පූර්ණත්වය කරා එක්ව ගමන් කිරීමයි."

මෙහෙවර වන්නේ,

ක්‍රිස්තුස් වහන්සේ තුළ මුල් ඇද ගනිමින් දිළිඳුන්ගේ අභියෝගයට ලක්වීමට කැපවෙමින් විශේෂයෙන් කාන්තාවන් හා ගැහැනු ළමුන්ගේ ජීවිත අරගලවලට හවුල් වෙමින් ඔවුනට විමුක්තිය උදාකර දීමයි.

අපගේ සේවාවන්,

- ශ්‍රවයාබාධිත දරුවන් සඳහා වන සේවය,
- කාන්තාවන්ගේ හා ගැහැණු ළමුන්ගේ ජීවිත ගොඩ නැගීම.
- වැඩිහිටි නිවාස තුළ සලසන සේවය
- දිවා සුරැකුම් මද්‍යස්ථානය පවත්වාගෙන යාම.
- විධිමත් හා නොවිධිමත් අධ්‍යාපනය.
- පෙර පාසල් අධ්‍යාපනය,
- උපදේශනය හා පවුල් සේවාව.
- ළමා නිවාස තුළ දරුවන් රැකබලා ගැනීම.
- ධීවර ප්‍රජාවට සලසන සේවය

ක්‍රම ක්‍රමයෙන් සදාසරණ සොයුරියන් සිය වගකීම හා අභියෝග භාර ගනිමින් සදාසරණ ස්ප්‍රීතුව ඉදිරියට ගෙන යන්නට ධෛර්යක් විය. ඒ අනුව පළමු ශ්‍රී ලාංකික ප්‍රාදේශාධිපතිනිය වූයේ ගරු මරිනා පෙරේරා පැවිදි සොයුරියයි. (1965) එවක් පටන් අප සමිඳු මිදි උයනේ ශ්‍රී ලාංකික දහම් කෙත සරුවැද්දීම සඳහා දියත් කළ සේවාවන් 1971 වසරේ මොරටුව කටුකුරුන්ද ග්‍රාමයේ අප සොයුරියෝ පෙර පාසල් අධ්‍යාපනය, ඩිස්පෙන්සරියක් පවත්වාගෙන යාම හා මීසම් සේවයෙහි ද නිරත වූහ. 1974 හලාවත පදවියේ අඹකඳවිල ධීවර ගම්මානයේ සේවය ඇරඹීය. ධීවර ප්‍රජාව සමග උරෙනුර ගැටී ඔවුන්ගේ ජීවන තත්ත්වය හා අධ්‍යාත්මිකත්වය ගොඩනැගීම සඳහා අප සොයුරියෝ මහත් සේ වෙහෙසුනහ. මීසම් සේවය තුළ ධර්මෝපදේශය, පෙර පාසල්, තරුණ තරුණියන් සඳහා සේවය, කුඩා කිතුනු සංඝ, ධීවර සමිති වැනි සේවාවන්හි නිරත වෙමින් ඉමහත් සේවයක් කළහ.

1979 වසරේ දී රත්නපුර පදවියේ දෙහිඹිවිට මීසමේ සේවය ඇරඹීය. මතු ජනතාව සඳහා වූ සේවය දහම් පාසල්, පෙර පාසල්, විධිමත් හා නොවිධිමත් අධ්‍යාපනය, කාන්තාවන් හා ළමුන්ට කළ සේවය වැනි අපෝස්තලික සේවාවන්හි යෙදුනි. ගාල්ල හා බදුල්ල පදවිවල ද තාවකාලික සේවාවන් සඳහා අප සොයුරියෝ දැඩි දුෂ්කරතා මධ්‍යයේ සේවාව සැලසූහ. 1986 වසර මහනුවර පදවියේ වහකෝට්ටේ මීසමේ නිකවැහැර, වැමැඩිල්ල, මූකලාන, දබරයාය, කිරලැස්ස යන ගොවි ගම්මානවල මීසම් සේවය සහ ගොවි ජනතාව සමග උරෙනුර ගැටී ඉමහත් සේවයක් සලසන ලදි. එසේම කාන්තාවන් හා ගොවීන් දැනුම්වත් කිරීම, ඔවුන්ගේ අධ්‍යාත්මිකත්වය ගොඩනැංවීමට ඉමහත් වෙහෙසක් දැරූ බව කිව හැකිය.

**අගරදගුරු පදවිය තුළ අපගේ අපෝස්තලික සේවාවන්**

පෙරියමුල්ල ශ්‍රේෂ්ඨ මව් නිවහන හා ආධුනිකාරාමය ද පිහිටා ඇත. අප සොයුරියෝ පෙරියමුල්ල මීසමේ දහම් සේවය. පෙර පාසල් අධ්‍යාපනය, විධිමත් අධ්‍යාපනය, වයස්ගත සොයුරියන් රැක බලා ගැනීම හා ධීවර ප්‍රජාව සඳහා වන සේවාවන්හි නිරත වෙති. තිඹිරිගස්යායේ සාන්ත මාටින් කන්‍යාරාමය, වැඩිහිටි නිවාසය වයස්ගත කාන්තාවන් රැක බලා ගැනීම හා සාත්තු සේවය දිවා සුරැකුම් සේවය. මීසමේ සේවය තුළ සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයෙන් දහම් සේවය ලබා දෙයි. ගොතටුව මීසමේ සේවය තුළ ධර්මෝපදේශය, පවුල් බැහැදැකීම, ළමා හා තරුණ අය සඳහා සමිති සමාගම, පදවිය තුළ උපදේශන හා පවුල් සේවාව ඉටුකරයි. කොච්චිකඩේ පෙර ආධුනික නිවහන පිහිටා ඇත. මීසම් සේවය, පෙර පාසල් අධ්‍යාපනය හා පෝරුතොට ග්‍රාමයේ ධීවර ප්‍රජාව සඳහා වන සේවාවන් රාගම මීසම තුළ 1935 ආරම්භ කළ ශා. ජෝශප් අන්ධ බිහිරි පාසලේ ශ්‍රවන ඌනතා ඇති දරුවන්ට විධිමත් අධ්‍යාපනය හා පුහුණුව ද මීසම තුළ දහම් සේවාද ඉටුකරයි. නාවල රාජගිරියේ දේව වචනය ගිහි ජනතාව සමග බෙදා ගැනීම, දහම් සේවාවන්, දිළිඳු දරුවන්ගේ සමාජීය, අධ්‍යාපනික හා අධ්‍යාත්මික ජීවිතය නගා සිටුවීම හා වැන්දඹු කන්තාවන් සඳහා වන සේවාවන්, පිටිපන සදාසරණ වැඩිහිටි නිවාසයේ වයස්ගත කාන්තාවන් රැකබලා ගැනීම වග මීසමේ, මීසම් සේවය හා පවුල් බැහැදැකීම, පෙර පාසල් අධ්‍යාපනය හා ධර්මෝපදේශය සිදුකරයි.

**කුරුණෑගල පදවිය**

වෙරළුගම සත්ව සනාදව ආයතනයේ බිහිරි තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව බිහිරි ආදි ශිෂ්‍ය සංගමය, මෙහෙය වීම හා බිහිරි අයගේ ජීවිත නංවාලීමට දායක වීම, කඩවල ගෙදර ශ්‍රවයාබාධිත දරුවන් සඳහා විධිමත් අධ්‍යාපනය හා පුහුණුව, දහම් සේවාවන්, වැඩිහිටි ධර්මෝපදේශය පදවිය තුළ අසිපා පෝෂණ වැඩසටහන් මෙහෙය වීම.

**හලාවත පදවිය**

ලුණුවිල සදාසරණ නිවාසයේ දිළිඳු ගැහැනු දරුවන් රැක බලා ගැනීම සිදුකරයි.

**එතෙර සේවාවන්**

සයිප්‍රස් - ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා වන සේවාව, උපදේශනය, ජන වන්දනාව මෙහෙය වීම, ඔවුන්ගේ ජීවිත අධ්‍යාත්මිකව ගොඩනැංවීම, සිර ගෙවල් බැහැදැකීමට යාම තුළ අධ්‍යාත්මික පෝෂණය.

ඊශ්‍රායෙලය - ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා වන සේවාවන්, 2013 වසරේ අග භාගයේ දී මෙම සේවාව අරඹන ලදි.

අපගේ නිර්මාතෘවරිය ව ආමර්ලින්ක් මව්තුමියගේ අවසාන වදන් වූයේ "මාගේ ආදරණීය සොයුරියනි, ඔබගේ ජීවිත අමාරුකම් හා දුෂ්කරතා හමුවේ සියළු බලැති දෙවිඳුන් වෙත හැරෙන්න. ජේසුස් වහන්සේ බරවූ කුරුසිය රැගෙන යන ගමන ඔබට ශක්තියක් වේ. දෙවියන් තුළ ඔබට සියල්ල කළ හැකිය."

සදාසරණ සොයුරියක් ලෙස එතුමියගේ ආදර්ශය අවියක් කර ගනිමින් දෙවියන් වහන්සේගේ සංරක්ෂණය කෙරෙහි විශ්වාසය තබා ඉදිරියටම පියවර තබමු. මෙතෙක් කල් අප සොයුරියන් දෙස් විදෙස්හි සමිඳු උයනේ කළ සේවාවන් සමිඳුන්ට ප්‍රසන්න වීම අපගේ ඒකායන ප්‍රාර්ථනයයි. 60 වසරක් පුරා අපගේ දූත සේවාව ගැන දෙවිඳුන්ට තුති පුදන අතර මෙවැනි සේවාවක් කරන්නට දෙව් රාජය පතුරන්නට සදාසරණ සොයුරියන් වන අප හා එක් වූ සැමටම දෙවිඳු ආසිරි පතමු.

**ගරු පිලොමිනා නිශ්ශංක සොයුරිය**

# රත්නපුර රදගුරු වසමට නවක පූජක පුතෙක්



සමිඳු මිදි උයනේ සේවය කිරීම සඳහා රුවන්පුර පදවියට පදවි පූජක තුමකු ලෙස ගරු කාරියකරවනගේ අනුෂ්ක නිෂාන් ප්‍රනාන්දු තේවාචාර්ය සහෝදර තුමා 2014 වසරේ පෙබරවාරි මස 27 වන බ්‍රහස්පතින්දා දින පෙරවරු 9.30 ට මීගමුවේ කඩොල්කැලේ උත්ථානවූ කිතු සමිඳුන්ගේ දේවස්ථානයේදී රත්නපුර රදගුරු තැන්පත් අතිඋතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා (සා.බෙ.නි) හිමිපාණන් අතින් පූජක අභිෂේක ලබනු ඇත.

ගරු අනුෂ්ක නිශාන් තේවාචාර්ය තුමා වර්ෂ 1982 අගෝස්තු 10 වන දින කැෂියන් ප්‍රනාන්දු හා පිලමින් පෙරේරා යන යුවලට දාව මීගමුව කුරණදී උපත ලබන ලදී. වැඩිමහල් සොහොයුරෙකුගෙන් හා සොහොයුරියකගෙන් යුත් පවුලේ බාලයා එතුමාය. මෙතුමා තම ප්‍රාථමික අධ්‍යාපනය කුරණ සා. ආනා විද්‍යාලයෙන්ද මීගමුව ලොයොලා විද්‍යාලයෙන්ද නිම කර දේව හඬට සවන්දෙමින් 1998 වසරේ ජනවාරි මස මීගමුව කොච්චිකඩේ පිහිටි ප්‍රැන්සිස්කාන (TOR) කනිටු දෙව්සත්හලට ඇතුළු විය. එහිදී සාමාන්‍ය පෙළ හැදෑරූ මෙතුමා පසුව 2000 වසරේ රත්නපුර පදවියේ කෑගල්ල මරියතුමියගේ නිර්මල හෘදයේ දෙව්සත්හලට ඇතුල්ව උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලැබීය. ඉන් අනතුරුව 2003 වසරේ කළුතර දහම් සෙවන දෙව්සත්හලටත් 2004 වසරේ අම්පිටිය ජාතික දෙව්සත්හලටත් ඇතුළු වී දර්ශනවාදය හැදෑරීය. තම සේවා අත්දැකීම් වසරෙහි ගාල්ල පදවියේ කරිටාස් (සෙඩ් ගෝල්) ආයතනයේ සේවය කරන ලදී. ඉන් අනතුරු දේව ධර්මය හදාරා 2011 වසරේදී තම පූජක පුහුණුව නිමා කර වසරක කාලයක් තුළ "වර්ල්ඩ් විෂන්" ආයතනයේ සේවය කළේය.

ඉන් අනතුරුව ගරු සහෝදරතුමකු ලෙස බලංගොඩ, රක්වාන, ඇඹිලිපිටිය යන මීසම් වලද බුළුතොට පිහිටි ඉංග්‍රීසි අධ්‍යාපන ඇකඩමිය තුළද තම සේවා අත්දැකීම් ලබා ගන්නා ලදී. වර්ෂ 2013 ජූලි මස 11 වන දින එනම් ශු. බෙනඩික් මුනිතුමන්ගේ මංගල්‍යය දින අතිඋතුම් ක්ලීටස් පෙරේරා රදගුරු හිමිපාණන් අතින් දෙහිගහපිටිය සා. තෙරේසා දෙව්මැඳුරේදී තේවාචාර්ය වරම් ලැබීය. ගරු තේවාචාර්ය තුමකු ලෙස මඩකලපුව පදවියේ තාලංකුඩා හා රත්නපුර පදවියේ බුලත්කොහුපිටිය යන මීසම් වල සේවය කළ මෙතුමා 2014 පෙබරවාරි 27 වන දින පෙරවරු 9.30 ට රත්නපුර රදගුරු තැන්පත් අතිඋතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා (සා.බෙ.නි) හිමිපාණන් අතින් මීගමුව කඩොල්කැලේ උත්ථානවූ කිතු සමිඳුන්ගේ දේවස්ථානයේදී පූජක වරම් ලබන්නට නියමිතය. එතුමන්ගේ කුළුඳුල් දිව්‍ය යාගය 2014 මාර්තු 2 දා උදෑසන 8.00 ට තම උපන් ගම වන කුර සා. ආනා දෙව්මැඳුරේදී පිදීමට නියමිතය.

**ගරු අයාල් ඉන්දික පියතුමා**

# වත්තල සා. ආනා දෙව්මැඳුරු භූමියේ පරිගණක පුහුණු මධ්‍යස්ථානය විවෘත කැරේ

කොමර්ෂල් බැංකුවේ අනුග්‍රහය ඇතිව වත්තල සා. ආනා දෙව්මැඳුරු භූමියේ පිහිටුවා ඇති පරිගණක පුහුණු මධ්‍යස්ථානය පසුගියදා කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් අතින් විවෘත කැරිණ.

වත්තල සා. ආනා දෙව්මැඳුරේ මීසම් සේවක ගරු බැසිල් වික්‍රමසිංහ පියතුමා ද කොමර්ෂල් බැංකුවේ සභාපති දිනේෂ් වීරක්කොඩි මහතා ඇතුළු නිලධාරින් පිරිසක් ද බස්නාහිර පළාත් සභාවේ හිටපු අමාත්‍ය ලෝරන්ස් මාදිවල, වත්තල මාබෝල නගර සභාවේ හිටපු සභාපති මාක් ගුණසේකර යන මහත්වරුන් ඇතුළු ආරාධිත අමුත්තන් රැසක් ද විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වූහ.

**(නිමල් පෙරේරා)**



## සා. පීතර බැසිලිකා... 1 පිටුවෙන්

ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයේ සභාපති කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත්, ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයේ මහ ලේකම් හලාවත රදගුරු අති උතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස්, ශ්‍රම සංක්‍රමණිකයන් පිළිබඳ ජාතික කතෝලික රදගුරු කොමිසමේ සභාපති කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන් ද එක්වූ මේ හමුවට 15,000 කට අධික ශ්‍රී ලාංකික පිරිසක් සහභාගි වූහ.

මෙහිදී අති උත්තම මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් සිරිලකට වැඩම කරන්නැයි සසුන් පියාගෙන් ඉල්ලා සිටි අතර එය ඉතා කැමැත්තෙන් උන්වහන්සේ පිළිගත්හ. ඉතාලියේ ශ්‍රී ලාංකික ශ්‍රම සංක්‍රමිකයන් පිළිබඳ ජාතික සම්බන්ධිකාරක අතිගරු නෙවිල් ජෝ පෙරේරා මාහිමිපාණන් ප්‍රමුඛව ශ්‍රී ලංකා පියතුමන් හා සැදැහැවතුන් විසින් කටයුතු සංවිධානය කරන ලදි.

## මුතුරාජවෙල.. 1 පිටුවෙන්

යෝජිත කොළඹ අධිවේගී විදුලි දුම්රිය මඟ කොළඹ හා කටුනායක අතර ඉදි කරන අතර මුතුරාජවෙල අභය භූමියෙන් මේ අක්කර 450 ලබා ගැනීමට යයි.

මෙහිදී යෝජිත බෝපිටිය නව නගර සැලැස්මට අක්කර 150 ක් ද, කෙරවලපිටිය නව නගර සැලැස්මට අක්කර 300 ක් ද ලබා ගැනීමට සැලසුම් කර ඇති අතර මේ හේතුවෙන් මේ ප්‍රදේශය පුරා බරපතළ පාරිසරික හානියක් සිදුවිය හැකි බවට දැනටමත් පරිසරවේදීන් අනතුරු අඟවා තිබේ.

ආසියාවේ තෙත්බිම් නාමාවලියට අනුව මුතුරාජවෙල තෙත් බිමක් ලෙස 1989 වසරේදී නම් කළ අතර 1996 වසරේ දී හෙක්ටයාර් 1029 ක භූමි භාගයක් මුතුරාජවෙල අභය භූමියට නිම කොට වෙන්කර දී ඇත. කාණ්ඩ 7 කට අයත් සත්ත්ව විශේෂ 449 ක් මෙහි වෙසෙන බව කියැවේ.

# ගුරු මාතාව සගසුව දිනයි



මාතර විසූ සංක්‍රිස්තියන් ධුරය හෙබවූ හිනිදුම ඇල්බට් ගමගේ මහතාගේ භාර්යාව වූ ඇලන් වෙලංගොඩ ගුරු මාතාව වසර 84 ක් ආයු වළඳා ඉකුත් දා ස්වර්ගස්ථ වූවාය.

ගාල්ල උණවටුන ගුරු අභ්‍යාස විදුහලින් පුහුණුව ලද ඇය මාතර සා. මරියා කන්‍යාරාම විදුහලින් ගුරු සේවාව අරඹා මිරිස්ස රජයේ විදුහල ඇතුළු පාසල් කිහිපයක සේවය කරත. අති විශාල ගෝල පිරිසකගේ ගුරු මෑණියන් ලෙස උපහාර ලද ඇය තම සේවා යුතුකම් මැනවින් ඉටු කළාය.

ගාල්ල ශ්‍රී හෘදය කන්‍යාරාමයේ සේවය කරන ගරු ප්‍රෙමිලා පැවිදි සොයුරිය ඇයගේ දියණියක වන අතර මාතර මීසම් සභාවේ ලේකම් ලෙස සේවය කළ වර්තමාන රත්නපුර මීසම් ධර්ම සේවා සභාව, රත්නපුර කතෝලික අවමංගල්‍යාධාර සමිතිය, සර්ව ආගමික සංසදය, සාම කමිටුව වැනි රත්නපුර ආගමික සංවිධානවල ක්‍රියාශීලි සාමාජිකයකු ලෙස සේවය කරන ලුවී ගමගේ මහතා ඇයගේ පුතනුවකු ද වෙයි. දරුවන් සිව් දෙනකුගේ දයාබර මවක වූ ඇය ආගමික සහජීවනය ඇති කරමින් ප්‍රදේශයේ ආගමික සාමය ඇති කරලීමට ද දායක වූවාය. ඇලන් වෙලංගොඩ ගුරු මාතාවට මොක් සුව පතමු.
**(තියබෝල්ඩ් සමරතුංග)**

**කටුබැද්ද විශ්ව විද්‍යාලය අසල නේවාසිකාගාරයක් බලා ගැනීම සඳහා වයස 55 - 65 ත් අතර පවුල් බරින් තොර, මතින් දුමින් තොර යුවළක් අවශ්‍යව ඇත. 011- 2652834, 072-3335824 අමතන්න**



මීගමුව කුරණ සා. ජූඩ් විදුහලේ නව අධ්‍යක්ෂ ගරු රෝහිත රුද්‍රිගෝ පියතුමා පිළිගැනීමේ උළෙල පසුගියදා එම විදුහලේ දී සිදුකෙරිණ.

හිටපු අධ්‍යක්ෂ ගරු ලෙස්ලි ප්‍රනාන්දු පියතුමන් විසින් නව අධ්‍යක්ෂ පියතුමන්ව පිළිගෙන විදුහල කරා කැඳවාගෙන එන ලද අයුරු සේයාරුවෙහි දිස්වේ. මෙයට විදුහලේ උප අදියුරු ගරු රොෂාන් ප්‍රනාන්දු පියතුමා ද එක්විය. **(සේයා - රොෂාන් ප්‍රදීප්)**

**කාරුණික දැනුම් දීමයි**

**pradeepaya@yahoo.com සහ pradeepaya@sltnet.lk ඊ මේල් ලිපිනයන් ප්‍රදීපය පුවත්පත් ලිපි එවීම සඳහා පමණක් භාවිත කරන්න.**

පී. ජෝසප් මාටින් සිල්වා මහතා ස්වර්ගස්ථ වී වසර 10 ක් පිරීම නිමිත්තෙන් මෙතුමන්ගේ ආත්මයට සග සුව පතා දේව මෙහෙයක් 2014 පෙබරවාරි 17 සඳුදා ප.ව. 6.30 ට පානදුර වික්ෂෝප දේව මාතා දෙව්මැඳුරේදී පූජක පුතු ගරු නිර්මාල් මාලක සිල්වා පියතුමන් අතින් පිදේ.

# “මගේ දේව අම්මා” කාදිනල් හිමිපාණන්ට පිළිගන්වයි



මීගමුවේ ක්‍රිෂාන්ත වර්ණකුල නිර්මාණය කළ මේ වන විට සිරිලක පුරා අතිශය ජනප්‍රියව කිතු ජනහද මරි මව් බැතියෙන් සනහා අලෙවි වාර්තා තබා ඇති මධුර මනෝහර “මගේ දේව අම්මා” ගීතාවලි කැසට් පටය පසුගියදා හද බැතියෙන් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් කොළඹ අගරදගුරු හිමිපාණන්ට පිළිගැන්වීය. **(“මගේ දේව අම්මා” මාධ්‍ය අංශය)**

# ශ්‍රී ලංකා බයිබල් සමාගමේ බයිබල් දැනුම මිනුම තරගය



ශ්‍රී ලංකා බයිබල් සමාගම විසින් සංවිධානය කළ දීප ව්‍යාප්ත බයිබල් දැනුම මිනුම තරගයේ ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ට ත්‍යාග සහ සහතික පත් පිරිනැමීම පසුගියදා කොළඹ බොරැල්ල භාග්‍යවත් ජුසේ වාස් දේවධර්ම නිකේතනයේදී පැවැත්විණි.

මෙහිදි ප්‍රධාන ආරාධිතයාණන් වූ කොළඹ විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් අතින් ද්‍රවිඩ අංශයේ බයිබල් දැනුම මිනුම තරගයේ ප්‍රථම ස්ථානය දිනාගත් ත්‍රිකුණාමලය මඩකලපුව පදවියේ දහම් සේවිකාවක් සිය සහතික පත ලබා ගත් අයුරු.. **(සේයා - ටී. සුනිල් ප්‍රනාන්දු)**

# නිහතමානී සිල්වෙස්ටර් පියතුමා



බදුලු පදවියේ ජනතාවගේත් පියතුමන්ගේත් සැබෑ මිතුරකු වූ ගරු සිල්වෙස්ටර් පියතුමා හදිසි අනතුරකින් දැයෙන් සමුගෙන පෙබරවාරි 17 දිනට වසරක් ගතවෙයි.

ලත් පඳුර හා මහියංගන මීසම්වල නිහඬ සේවයක් කළ මෙතුමා, දේව වචනයට ජනතාව සමීප කිරීමට ගත් උත්සාහයන් ඉතා ප්‍රශංසනීය යි. ආගම් භේදයකින් තොරව දුගී ජනතාවගේ හිසට සෙවණක් තනා දෙන්නට මෙතුමා දියත් කළ වැඩපිළිවෙල අද කාගේත් පැසසුමට ලක්වේ. එම වැඩපිළිවෙල තමා වටා ජනතාවක් රැස්කර ගැනීමට නොව, ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවන් හොඳින් හැඳින, තමා ඇදහූ ස්වාමින් වහන්සේගේ මානව දයාව ජනතාවට හඳුන්වා දීමට යොදා ගන්නා ලදි.

මෙතුමාගේ පූජක දිවිය වසර 20 කට සීමා වූවත්, දෙව් මව් මෙන් සියල්ල දේව කැමැත්තට නතු කරගැනීම පුරුදු පුහුණු වී සිටි එතුමාගේ ඒ නිහතමානී ගුණය හා යාච්ඤා දිවිය ගිහි, පැවිදි හා පූජක සැමටම ආශිර්වාදයෙන් පිරි ආදර්ශයක් විය. මෙතුමා වෙනුවෙන් මේ මස 18 දින සවස 3.00 ට දිව්‍ය යාගයක් පැවැත්වේ. **(ගරු ඉග්නේෂස් සේනානායක පියතුමා)**

# ශු. සෙබස්තියන් මුනිතුමාගේ දේව කැඳවීම අපට ලබා ගත නොහැකි ද?

## සැලේසියාන ප්‍රාදේශාධිපති අතිගරු නිහාල් ලියනගේ පියතුමා

රෝම අධිරාජයාගෙන් දේව ජනතාව දැඩි ශාරීරික පීඩනයට ලක් වූ මොහොතේ දෙවියන් වහන්සේ ඔවුන්ට සහය වීමට තෝරාගත් විමුක්තිදායකයා වූයේ ශු. සෙබස්තියන් මුනිතුමායි. තම ජීවිතය පරදුවට තබා තම වස්තුව, තාන්න මාන්න ගරු සැලකිලි පසක දමා උන්වහන්සේ දේව වචනය තුළ කිතු දහම වෙනුවෙන් කළ කැපවීම වර්තමානයේ අපගේ ජීවිතය තුළින් ගොඩනඟා ගත යුත්තේ අප සතු සියල්ල දිළිඳු දේව ජනතාවට පරිත්‍යාග කිරීමෙන්ය.

පමුණුගම, ඇලෙන්එගොඩ සා. සෙබස්තියන් මංගල්‍ය දින මංගල්‍ය මහා දිව්‍ය යාගය ඔප්පු කරමින් විශේෂ දේශනයක් කළ සැලේසියාන නිකායේ ප්‍රාදේශාධිපති හා දොස් බොස්කෝ ආයතනයේ අධ්‍යක්ෂ අතිගරු නිහාල් ලියනගේ පියතුමා එසේ ප්‍රකාශ කළේය. **(ජෝ. සංගපාලආරච්චි)**

# ගුරු සේවයට බඳවා ගැනීම සහ ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව

අගරදගුරු පදවියේ කතෝලික පෞද්ගලික පාසල්වල සේවයේ නියුතු පරිවාස කාලය තුළ සිටින කොන්ත්‍රාත් ගුරු භවතුන් ස්ථිර සේවයට බඳවා ගැනීම සඳහා සහ 2014 වසර කතෝලික අධ්‍යාපන සහ ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාවට තෝරා ගැනීමේ තරග විභාගය සඳහා කතෝලික පෞද්ගලික පාසල්වල සේවයේ නියුතු පරිවාස කාලය තුළ කොන්ත්‍රාත් පදනම මත සිටින ගුරුභවතුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සඳහා අයදුම්පත් සියළුම කතෝලික පාසල්වල විදුහල්පතිවරුන්ට ලබා දී ඇති අතර එම අයදුම්පත සම්පූර්ණ කර විදුහල්පති අත්සන ද සහිතව 2014 පෙබරවාරි මස 20 දිනට පෙර රු. 350.00 ක මුදලක්

කොමර්ෂල් බැංකුව බොරැල්ල ශාඛාවේ අංක 1190020913 දරණ ගිණුමට බැර කර අදාළ වවුචරය සමඟ එවිය යුතු බව කතෝලික පෞද්ගලික පාඨශාලා සාමාන්‍යාධිකාරි පියතුමා දන්වා සිටී.



කොළඹ අගරදගුරුපදවි ජනසංනිවේදන කේන්ද්‍රයේ සේවය කරන කෞෂල්‍යා සඳමාලි මෙනෙවිය ඉකුත් දා කෑගල්ලේ විජිත බණ්ඩාර මහතාගේ අත ගත්තාය. දෙහියාගාත මීසමේ දියණියක වන සඳමාලි, මීසමේ ගායනා කණ්ඩායම, තරුණ සමිතිය, ළමා ධර්මදූත සමාජය හා දහම් පාසලේ ගුරුවරියක ලෙස සේවය කළාය. අගරදගුරු පදවි ධර්මදූත කාර්යාලයේ 1999 සිට සේවය කළ ඇය 2005 සිට ජනසන්නිවේදන ක්ෂේත්‍රයේ සේවය කරන්නීය. එම යුවළට සුපැතුම්!



පමුණුගම මහ විදුහලේ නිවාසාන්තර ක්‍රීඩා උළෙල බෝපිටිය මීසම් සේවක ගරු එරින්ටන් සිල්වා පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති අතර එහිදී විදුහල්පති අනුර ගුණවර්ධන මහතා පියතුමන් කැඳවාගෙන ආ අයුරු. **(එස්. කේ. ජේ. කුරේරා)**